# වාරිමාර්ග අමාත්‍යාංශයට අදාළ රජයේ වියදම් යථාර්ථකරණය පිළිබඳ රාජ්‍ය වියදම් සමාලෝචන කමිටු වාර්තාව

*රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුව*

# වාරිමාර්ග අමාත්‍යාංශයට අදාළ රජයේ වියදම් තාර්කිකරණය පිළිබඳ රාජ්‍ය වියදම් සමාලෝචන කමිටු වාර්තාව

## අන්තර්ගතය

1. හැඳින්වීම ........................................................................................................................... 1

2. ජල සම්පත් සංවර්ධන හා වාරිමාර්ග අමාත්‍යාංශය ............................................. 3

3. 2023 දී ක්‍රියාත්මක කිරීමට යෝජිත සංවර්ධන ව්‍යාපෘති ...................................... 5

4. අනාවරණය කරගැනීම් සහ නිරීක්ෂණ ......................................................................... 7

5. නිර්දේශ ........................................................................................................................... 11

### ඇමුණුම්

ඇමුණුම - 1: රාජ්‍ය වියදම් සමාලෝචන කමිටු (PERC) යොමුගත කරුණු ...............................I

ඇමුණුම - 2: 2023 අයවැය ප්‍රතිපාදන ව්‍යාපෘතිය ..................................................................II

ඇමුණුම - 3: ව්‍යාපෘති සමාලෝචනය ..........................................................................................V

ඇමුණුම - 4: මූලික ව්‍යාපෘති තුන පිළිබඳ පැහැදිලි කිරීම..........................................................LIV

ඇමුණුම - 5: RAMP කමිටුව විසින් 2022 වසර තුළ සම්පූර්ණ කිරීමට නිර්දේශිත ව්‍යාපෘති ලැයිස්තුව......LX

# වාරිමාර්ග අමාත්‍යාංශයට අදාළ රජයේ වියදම් තාර්කිකරණය කිරීම පිළිබඳ රාජ්‍ය වියදම් සමාලෝචන කමිටු වාර්තාව

## 1. හැඳින්වීම

### 1.1 වාරිමාර්ග අමාත්‍යාංශයට අදාළ රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුවේ සංයුතිය

අංක 23/0256/604/030 දරන හා 2023.02.06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ඇමුණුම - 1 හි දක්වා ඇති යොමුගත කොන්දේසි පරිදි අමාත්‍යාංශ දහයක වියදම් තාර්කිකරණය කිරීමට සහ අමාත්‍ය මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීමට රාජ්‍ය වියදම් සමාලෝචන කමිටු (PERC) දහයක් පිහිටුවා ඇත. (ඇමුණුම I)

එම කමිටු දහය අතරින් වාරිමාර්ග අමාත්‍යාංශයට අදාළ කමිටුව සඳහා පහත සඳහන් සාමාජිකයන් පත් කර ඇත.

<u>භාණ්ඩාගාර ලේකම් විසින් පත් කරන ලද සභාපති:</u>
අජිත් අබේසේකර මහතා, අධ්‍යක්ෂ ජනරාල්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

<u>අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරන ලද වාරිමාර්ග අමාත්‍යාංශයෙන් නම් කරන ලද නිලධාරීන් දෙදෙනෙක්:</u>
ඉංජිනේරු ප්‍රියානි ජයවීර මහත්මිය, අතිරේක ලේකම්

ඉංජිනේරු ඊ.ඒ.සී.කේ. එදිරිසූරිය මහතා, අධ්‍යක්ෂ (තාක්ෂණික විගණන)

<u>ජනාධිපති ලේකම් විසින් නම් කරන ලද ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් තිදෙනෙක්:</u>
ඩී. විදානගමාච්චි මහතා, භාණ්ඩාගාරයේ හිටපු නියෝජ්‍ය ලේකම්

මහාචාර්ය එස්.බී. වීරකෝන්, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

මහාචාර්ය ලලිත් රාජපක්ෂ, සිවිල් ඉංජිනේරු, හයිඩ්‍රොලික් සහ ජල සම්පත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව, සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව, මොරටුව විශ්වවිද්‍යාලය

<u>භාණ්ඩාගාර ලේකම් විසින් පත් කරන ලද කැඳවුම්කරු:</u>
ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (රාජකාරී ආවරණ) චන්ද්‍රිකා සේනානායක මහත්මිය

## 1.1 පසුබිම

වාරිමාර්ග අංශය විසින් වී සහ අනෙකුත් ආහාර භෝග ආශ්‍රිත කෘෂිකාර්මික නිෂ්පාදනය තිරසාර කිරීම හරහා ජාතික ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් සපයනු ලැබේ. ජලය භාවිතා කරන විවිධ ක්ෂේත්‍ර අතුරින් දිවයිනේ මතුපිට ජල භාවිතයේ ප්‍රධාන කොටස වාරිමාර්ග අංශයට හිමිවේ. වාරිමාර්ග සඳහා ජල ඉල්ලුම සැපයීමට අමතරව, බොහෝ විට ගෘහස්ත සහ කාර්මික සැපයුම, පශු සම්පත් සංවර්ධනය, මිරිදිය ධීවර කර්මාන්තය, පරිසර සංචාරක ව්‍යාපාරය, ජලවිදුලි උත්පාදනය සහ පරිසර පද්ධති සේවා සහ පොදුවේ පරිසරය සුපෝෂණය කිරීම සඳහා වාරි ජල යටිතල පහසුකම් යොදා ගැනේ.

ග්‍රාමීය අංශයේ ජනගහනයෙන් 75% ක් පමණ සාම්ප්‍රදායිකව ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික කටයුතු වල නියැලෙන ආර්ථිකයක් වශයෙන්, නිදහසින් පසු මෙරට රාජ්‍ය ආයෝජන වැඩසටහනේ ඉහළ ප්‍රමුඛත්වයක් වාරිමාර්ග අංශය සඳහා ලැබී ඇත. එහි උච්චතම අවස්ථාව වූයේ 1980 ගණන්වල කඩිනම් මහවැලි වැඩසටහන ක්‍රියාත්මක වන අවධියේ වන අතර එය රාජ්‍ය ආයෝජනයෙන් 40% ක් විය. 2000 වසරේ සිට, වාරිමාර්ග අංශයේ ආයෝජන මිශ්‍ර සංවර්ධනයන් වෙත යොමු කර ඇත. එනම්, පැරණි වාරිමාර්ග පද්ධති පුනරුත්ථාපනය කිරීම සහ නවීකරණය කිරීම, ජල ඵලදායිතා වැඩිදියුණු කිරීම්, ජල කළමනාකරණය සහ ප්‍රධාන බහුකාර්ය ව්‍යාපෘති කිහිපයක් ඉදිකිරීම යනාදියයි. පසුගිය වසර පහ (5) තුළ ජල අංශය සඳහා වාර්ෂික ආයෝජනය, රාජ්‍ය ආයෝජනවලින් 6%-9% අතර පරාසයක පවතී. ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය සාපේක්ෂව ඉහළ ප්‍රතිලාභ ගෙන දෙන අනෙකුත් අංශවල සංවර්ධනය සඳහා ජලය ලබා ගැනීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා වාරිමාර්ග අංශයේ කාර්යක්ෂම ජල භාවිතය ප්‍රවර්ධනය කිරීම මෙම වැඩසටහන් රැසක ප්‍රධාන අරමුණක් විය.

ශ්‍රී ලංකා රජය (GOSL) ප්‍රධාන වශයෙන් රාජ්‍ය ආයතන තුනක් (3) යටතේ වාරිමාර්ග අමාත්‍යාංශය හරහා වාරිමාර්ග ක්ෂේත්‍රයේ ආයෝජන සිදු කරයි. එම ආයතන නම්, වාරිමාර්ග අමාත්‍යාංශය (MI), වාරිමාර්ග දෙපාර්තමේන්තුව (ID) සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය (MASL) වේ . මීට අමතරව, ස්වයං මූල්‍ය ආයතන ලෙස ක්‍රියාත්මක වන මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය (CECB), සීමාසහිත මධ්‍යම ඉංජිනේරු සේවා සමාගම (CESL) සහ මහවැලි උපදේශන කාර්යාංශය (MCB) සහ පුහුණු ආයතන කිහිපයක් ද අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වේ.

2023 වර්ෂයේදී වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ වන වියදම් තාර්කිකරණය කිරීමට කම්ටුවට පැවරී ඇත. වාරිමාර්ග අමාත්‍යාංශය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ 2023 වර්ෂය සඳහා ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් සඳහා වන මුළු ප්‍රතිපාදන පිළිවෙලින් රු. බිලියන 75.8 ක් සහ රු. බිලියන 8.9 (ඇමුණුම - 2) වන අතර ඉන් ප්‍රාග්ධන වියදම්වලින් 63%ක් විදේශ මූලාශ්‍රවලින් දරයි. ඉතිරි 37% රජයේ අරමුදල්වලින් දරනු ලැබේ. විදේශ අරමුදල් සහිත සියලුම ව්‍යාපෘති සහ ප්‍රධාන ප්‍රාග්ධන ව්‍යාපෘති වාරිමාර්ග අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වේ. විදේශ අරමුදල් හරහා ක්‍රියාත්මක ව්‍යාපෘති යටතේ ඇති මුළු ආයෝජනවලින් 84% අරමුදල් (රු. බිලියන 40 ට සමාන) ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් අරමුදල් සපයන මහවැලි **ජල ආරක්ෂණ ආයෝජන වැඩසටහන** සඳහා වෙන් කර ඇත. වාරිමාර්ග අංශයේ මුළු

ප්‍රාග්ධන ආයෝජනවලින් 56%ක් මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇත (ආසියානු සංවර්ධන බැංකුව විසින් රුපියල් බිලියන 40ක් සහ ශ්‍රී ලංකා රජය විසින් රුපියල් බිලියන 3ක් වශයෙන්) (ඇමුණුම - 2).

## 2. ජල සම්පත් සංවර්ධන හා වාරිමාර්ග අමාත්‍යාංශය

කලාපයේ බොහෝ රටවල් හා සසඳන විට ශ්‍රී ලංකාව පොහොසත් ජල සම්පතකින් ආශිර්වාද ලබා ඇතත්, වර්ෂාපතනයේ සැලකිය යුතු අවකාශීය හා කාලීන විෂමතා දක්නට ඇත. දැනටමත් අත්විඳිමින් පවතින දේශගුණික විපර්යාසවල සෘජු හා වක්‍ර බලපෑම් සමඟ අනාගතයේ දී මෙම විචලනයන් තවදුරටත් කැපී පෙනෙනු ඇත. සීමිත අයවැයක් යටතේ ආංශික ඉල්ලීම් සපුරාලමින් සහ ගංවතුර සහ නියඟය හේතුවෙන් ඇතිවන අවදානම් අවම කරමින් සාධාරණ ලෙස ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණය කිරීම වාරිමාර්ග අමාත්‍යාංශයට පැවරී ඇති භාරදූර කාර්යයකි.

නිදහසින් පසු, වාරිමාර්ග අමාත්‍යාංශය විසින් විශාල රාජ්‍ය ආයෝජනයක් දරමින් සිදු කරන ලද වාරිමාර්ග සංවර්ධනය විසින් රටේ සහල් නිෂ්පාදනය ඉහළ නැංවීමට සහ සහලින් ස්වයංපෝෂිත වීමේ ප්‍රමුඛතම ජාතික ප්‍රතිපත්ති අරමුණ සාක්ෂාත් කර ගැනීම සම්බන්ධයෙන් ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කර ඇත. වාරිමාර්ග සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම නව ඉඩම් සංවර්ධනට හා ජනාවාස ඇති කිරීමට දායක වන අතරම එය ග්‍රාමීය ජනතාව සඳහා රැකියා උත්පාදන මාර්ගයක් ද වී ඇත. සහල් ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රධාන ආහාරය වන අතර, වාරි කෘෂිකර්මාන්තය හරහා සිදු කරන සහල් නිෂ්පාදනය ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය මාර්ගයක් පමණක් නොව, වර්තමානය වන විට ජනගහනයේ ආහාර අවශ්‍යතා (ආහාර සුරක්ෂිතතාව) සපුරාලීම සඳහා ආනයන ආදේශනය හරහා විදේශ විනිමයද ඉතිරි කරයි. මේ අනුව, අ) ආනයනික නිෂ්පාදනවලට සාපේක්ෂව සැබෑ නිෂ්පාදන පිරිවැය වැඩි විය හැකි වීම ආ) වාරි ජල සැපයුම, සහනාධාර හා වෙනත් සේවා සඳහා දරන පොදු පිරිවැයක් පැවතීම යන තත්ත්වයන් නොසලකා වාරි කෘෂිකර්මාන්තයේ නියුතු ජනතාව ඉන් ඉවත් නොකොට සහල් නිෂ්පාදනය වත්මන් මට්ටමේ පවත්වා ගැනීම වැදගත් වේ.වාරි කෘෂිකර්මය මගින් වර්තමානයේ වගා කරන ප්‍රමාණය ඒ අයුරින්ම පවත්වා ගැනීමේ වැදගත්කම අවධාරණය කරන අතරම, ජාතික අයවැයේ අතිරික්තයක් නොමැති තත්වයක් යටතේ ඉහළ ප්‍රාග්ධනයක් වැයවන නව වාරිමාර්ග යෝජනා ක්‍රම සඳහා මහජන මුදල් ආයෝජනය කිරීම හරහා වාරිමාර්ග ප්‍රමාණය පුළුල් කිරීම නිර්දේශ කළ නොහැක. එහෙයින්, ගොවිතැන වඩාත් ආර්ථිකමය සහ පාරිසරික වශයෙන් තිරසාර කිරීමට සුදුසු ජල කළමනාකරණය, පොහොර කළමනාකරණය, බෝග කළමනාකරණය සහ ගොවිතැන් පිළිවෙත් අනුගමනය කරමින් බෝග තීව්‍රතාව, ජලය සහ භූමි ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා පවතින වාරිමාර්ග ප්‍රදේශවල ඉඩම් හා ජල සම්පත් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම යනාදී විචක්ෂණශීලී ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. එසේම වාරිමාර්ග ප්‍රදේශ පුළුල් කිරීමේ ඉල්ලුම සමනය කිරීම සඳහා වැඩිවන ග්‍රාමීය ජනගහනයට විකල්ප ජීවනෝපාය මාර්ග නිර්මාණය කිරීම

සඳහා වෙනත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ - එය තරුණ පරම්පරාවේ ප්‍රාර්ථනයද වේ.

අනෙක් අතට, වාරි ජලය මගින් හෝ වර්ෂාවෙන් පෝෂණය වන කෘෂිකර්මාන්තය මගින් ආහාර නිෂ්පාදනයේ දී ඒවා දේශගුණික විපර්‍යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාවෙන් යුතු වීම, ආහාර සුරක්ෂිතතාව සඳහා මෙන්ම දිගු නියඟයන්ඇති වීම වැනි කරුණු හේතුවෙන් අප වැනි සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්ට ඇති විය හැකි බලපෑම අවම කිරීම සඳහාද ඉතා වැදගත් වේ. ආහාර නිෂ්පාදනයේ දේශගුණික විපර්‍යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා, වෙනස්වන දේශගුණ තත්වයන් යටතේ ජල සම්පත් සැලසුම්කරණයේදී පහත සඳහන් කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය.

අ) වාරිමාර්ග සහ අනෙකුත් ජල අංශවල ජල සංරක්ෂණය සහ ජල පරිහරණ කාර්යක්ෂමතාව,
ආ) ද්‍රෝණිවල ජලය බෙදා හැරීම සඳහා රඳවාගනු ලබන ධාරිතාව ඉහළ නැංවීම / නඩත්තු කිරීම මෙන්ම ඉහළ ද්‍රෝණිවල පවතින විශාල වශයෙන් ජල රඳවාගැනීම් ඉහළ නැංවීම,
ඇ) ප්‍රාදේශීය වශයෙන් ජලගබඩාකරණ ධාරිතාව සහ ජල මූලාශ්‍ර සංවර්ධනය දිරිමත් කිරීම මගින් ගංගා ආශ්‍රයෙන් සිදු කෙරෙන ප්‍රධාන හැරවුම් මත යැපීම තවදුරටත් අඩු කිරීම (උදාහරණයක් ලෙස දේශගුණ විචල්‍යතාවය ඉහළ මට්ටමක පවතින මහවැලි ජල පෝෂක වර්ෂාපතනයට වසරක් තුළ බලපාන්නේ නම් ඒ ආශ්‍රිත වාරිමාර්ග මගින් වගා කරන ප්‍රදේශවලට කුමක් සිදුවේද යන්නෙහි, ) සහ
ඈ) පිළිගත් දේශගුණික විපර්යාස තත්ත්වයන් යටතේ පවතින ජල සම්පත් නැවත ඇගයීම යනාදිය.

ඉහත සඳහන් සාධකද සමඟ විවිධ අංශ අතර ජලය සහ ඉඩම් සඳහා වර්ධනය වන තරඟකාරිත්වය හේතුවෙන් කෘෂිකර්මාන්තය සඳහා භාවිතා කරන ජලයේ සහ භූමියේ ඵලදායිතාව ඉහළ නැංවීම අත්‍යවශ්‍ය වේ. ජාතික නිෂ්පාදන වර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් විවිධ ජල අංශ අතර ජලය බෙදා ගැනීම ද වැදගත් වේ. රටෙහි පවතින ආර්ථික තත්ත්වය යටතේ අවම වශයෙන් නව මධ්‍ය පරිමාණ වාරි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී, හැකි අවස්ථාවන්හිදී හවුල්කාරිත්වයන් වශයෙන් හෝ වෙනත් ආකාරයකින් බහුකාර්ය ව්‍යාපෘති සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන දිරිමත් කිරීම, මධ්‍ය කාලීනව තිරසාර ඵලදායිතා වර්ධනයක් සඳහා උපාය මාර්ගයක් වනු ඇත.

## 2.1 අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

**<u>දැක්ම:</u>**"තිරසාර ජල සම්පත් සංවර්ධනය සහ කළමනාකරණය තුළින් සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් සඳහා දායක වීම."

**<u>මෙහෙවර:</u>** "ජල සම්පත් සංවර්ධනය සහ කළමනාකරණය හරහා බහු ජල පරිශීලකයන්ගේ අවශ්‍යතා සපුරාලීමෙන් ප්‍රජාවගේ සහ පරිසරයේ යහපැවැත්ම සැලසීම."

## 3. 2023 දී ක්‍රියාත්මක කිරීමට යෝජිත සංවර්ධන ව්‍යාපෘති

වාරිමාර්ග අමාත්‍යාංශය විසින් 2023 මූල්‍ය වර්ෂය සඳහා සංවර්ධන ව්‍යාපෘති 39ක් සඳහා අය-වැය ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇති අතර ඉන් දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති 35ක් සම්බන්ධව කමිටුව විසින් සමාලෝචනය කිරීමට සලකා බලන ලදී. මෙම සංවර්ධන ව්‍යාපෘති සඳහා අරමුදල් සපයනු ලබන්නේ, දේශීය අරමුදල් හෝ විදේශීය අරමුදල් (ණය හෝ ප්‍රදාන) හරහා වන අතර විදේශීය ණය/ප්‍රදාන මඟින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා රජයෙන් ලබා දෙන සම-මූල්‍යකරණ සංරචකද අයත් වේ. රටේ පවතින වත්මන් ආර්ථික අර්බුදය හේතුවෙන් දැනට අනුමත ව්‍යාපෘති ලැයිස්තුවේ ඇති ව්‍යාපෘති වල විෂය පථය වෙනස් කිරීම හරහා වියදම් කපා හැරීම, ප්‍රතිලාභ ප්‍රශස්ත කිරීම සහ හිඟ සම්පත් ප්‍රයෝජනයට ගනිමින් ඒවා ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛත්වය දීම සඳහා එම ව්‍යාපෘති නැවත ඇගයීමට ලක්

කිරීම අවශ්‍ය කර ඇත. ඒ අනුව, 2023 වර්ෂය තුළ ඉහත ව්‍යාපෘති 39න් ව්‍යාපෘති 13ක් (ඇමුණුම - 5) අවසන් කිරීමට "මහා පරිමාණ ව්‍යාපෘති නැවත උපාය මාර්ගගත කිරීම සහ වේගවත් කිරීම" පිළිබඳ කමිටුව (RAMP) උපදෙස් දෙන ලදී.

## 3.1 ක්‍රමානුකූල සමාලෝචනය සඳහා අනුගමනය කරන ලද ක්‍රමවේදය

### 3.1.1. සමාලෝචන ක්‍රමවේදය

අමාත්‍යාංශ විසින් රාජ්‍ය වියදම් පිළිබඳ සමාලෝචනය කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රමවේදය ඇමුණුම - 1 හි දක්වා ඇති යොමුගත කරුණුවල නිශ්චිතව දක්වා ඇති කාර්යයන් 12 මත පදනම් වේ. ව්‍යාපෘති 26 ක් භාරව සිටින අදාළ ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් සහ අමාත්‍යාංශ නියෝජිතයින්ගෙන් අදළ ව්‍යාපෘති පිළිබඳ විස්තර ලබාදෙන ලෙස කමිටුව විසින් ඉල්ලා සිටින ලදී. ඉන්පසුව, කමිටුව විසින් තොරතුරු විශේෂඥතාව සහ කාලය යන සීමාකාරී සාධක යටතේ සමාලෝචන ක්‍රමවේදයේ 2 සිට 12 දක්වා ඇති කාර්යයන් හැකි තාක් දුරට පදනම් කර ගනිමින් එක් එක් ව්‍යාපෘති සමාලෝචනය කරන ලදී. ආහාර නිෂ්පාදනය, ආර්ථික වර්ධනය, රැකියා උත්පාදනය, සීමිත ජල හා ඉඩම් සම්පත් උපයෝජනය, තිරසාර සංවර්ධන යන ක්ෂේත්‍රයන් සඳහා ජාතික මට්ටමෙන් දායක වීම හා දේශගුණික විපර්යාස හමුවේ ජලය ලබා ගැනීමේ විශ්වසනීයත්වය, ආපදා අවදානම සහ යටිතල පහසුකම් වල අසාර්ථකත්වය ඇතුළු ප්‍රාදේශීය අවශ්‍යතා, සමාලෝචනය කරනු ලබන ව්‍යාපෘති වල අරමුණු මතින් කොතරම් දුරට ආවරණය වන්නේද යන්න මත පදනම්ව මෙම ව්‍යාපෘති පරීක්ෂා කරනු ලැබේ. යටිතල පහසුකම් සහ විශේෂයෙන්, අයවැය සීමාවන් යටතේ ආයෝජන හැකියාව හා අදාළව ව්‍යාපෘතීන්හි අරමුණු වඩාත් සියුම්ලෙස පරීක්ෂා කරන ලදී. ඉහත සමාලෝචන කාර්යයට ව්‍යාපෘති පෙළගැස්වීම සඳහා RAMP හි මගපෙන්වීම් සමඟ පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලදී.

අ) ව්‍යාපෘතියේ ප්‍රතිඵල (හෝ ව්‍යාපෘතියේ එක් එක් සංරචක) කෙරෙහි අවධානය යොමු කිරීම:

i. ආපදා අවදානම අවම කිරීම: අධි ආපදා අවදානමක් ඇති වීම වැළැක්වීම (උදා: වේලි අලුත්වැඩියා කිරීම/ නඩත්තු කිරීම, ගංවතුර වැළැක්වීම සඳහා බැමි බැඳීම)
ii. ජල ලබා ගැනීමේ හැකියාව/බෙදාහැරීම වැඩිදියුණු කිරීම මගින් බෝග වගා තීව්‍රතාවය වැඩි දියුණු කිරීම (උදා: පවතින වැව් අලුත්වැඩියා කිරීම/පුළුල් කිරීම/ඇළ මාර්ග වැඩි දියුණු කිරීම/ජල ඵලදායිතාව වැඩි දියුණු කිරීම)
iii. නව වාරිමාර්ග ප්‍රදේශ සංවර්ධනය කිරීම
iv. නුසුදුසු ප්‍රතිඵල වළක්වා ගැනීම - එනම්, අඩු ආර්ථික ශක්‍යතාව, පවතින ජලය ප්‍රමාණය ඉක්මවා ඉල්ලුම ඉහළ යාම- නව යෝජනා ක්‍රම යටතේ ජලය හැරවීම මගින් දැනට පවතින යෝජනා ක්‍රම සඳහා / අනෙකුත් ජල අංශ පහළ ගංදිය භාවිතා කරන්නන්ට අහිතකර ලෙස බලපෑම, දේශගුණික විපර්යාස හමුවේ ඔරොත්තු දීමේ හැකියාව, ඉඩම් හා වෙනත් ගැටුම් (වන ජීවීන්, සමාජ, ජල ගැටුම්)

v. ජල හා සූර්ය බලශක්ති උත්පාදනය, ජල සැපයුම, කර්මාන්ත, වෙනත් රැකියා උත්පාදනය ඇතුළු අනෙකුත් අංශවලට දායක වීම හරහා ජාතික ආර්ථික වර්ධනයට දායක වීම

ආ) මූල්‍යකරණය කිරීමේ ක්‍රමවේදය සහ ආර්ථික ප්‍රතිලාභ අත්පත් කරගැනීමට ගතවන කාලය අනුව

i. විදේශ ප්‍රදාන, දේශීය සම-මූල්‍යකරණය (Co-financing) සමඟ, විදේශ ණය දේශීය මූල්‍යකරණය
ii. මුළු ඇස්තමේන්තුගත පිරිවැය, 2022 අවසානය දක්වා සමුච්චිත වියදම්, ඉතිරි වැඩ නිම කිරීමට අවශ්‍ය අරමුදල්, අයවැය ඇස්තමේන්තු - 2023
iii. වැඩ නිමකළ ප්‍රමාණය, භෞතික ප්‍රගතිය සහ ව්‍යාපෘති කාලසීමාව
iv. ව්‍යාපෘති සංරචක සහ ඒවායේ සහසම්බන්ධතා සහ අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව
v. වෙන් කර ඇති සම්පත් සහ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති රාමුව කෙතරම් දුරට සම්බන්ධ වන්නේද යන්න
vi. රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය සඳහා හැකියාවැති ක්ෂේත්‍ර

### 3.1.2 ව්‍යාපෘති ප්‍රමුඛතාකරණය

ඉහත සාධක සැළකිල්ලට ගනිමින්, කමිටුව විසින් ව්‍යාපෘති 35ක් අතරින් ව්‍යාපෘති 26 ක් විශ්ලේෂණය කරමින්, ඉහළ (H), මධ්‍යම (M) සහ පහළ (L) වශයෙන් ප්‍රමුඛතාවය අනුව පෙළගස්වනු ලැබූ අතර ප්‍රධාන ව්‍යාපෘති තුනක්ද හඳුනා ගනු ලැබිණි. එක් එක් ව්‍යාපෘති පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණය, ඇමුණුම - 3 හි ලේඛනගත කර ඇත. එම එක් එක් ව්‍යාපෘති 26 ඒවා ක්‍රියාත්මක කිරීම නිර්දේශ කිරීමේදී, පහත දක්වා ඇති පරිදි කාණ්ඩ පහකට වර්ගීකරණය කරන ලදී.

**කාණ්ඩ පහ:**

i. අඩු විෂය පථයකින් නිම කළ යුතු ලෙස හඳුනාගෙන ඇති ව්‍යාපෘති
ii. ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීමෙන් පසු තාවකාලිකව අත්හිටුවීමට හඳුනාගෙන ඇති ව්‍යාපෘති
iii. සාර්ව ආර්ථික බලපෑම මත ව්‍යාපෘති සංරචක සඳහා ප්‍රමුඛත්වය දෙමින් අදියරෙන් අදියර නිම කිරීමට හඳුනාගෙන ඇති ව්‍යාපෘති
iv. පිරිවැය ඵලදායී ආකාරයෙන් කඩිනමින් නිම කිරීම සඳහා හඳුනාගෙන ඇති මූලික ව්‍යාපෘති
v. මූල්‍ය සහ ප්‍රතිපත්තිමය ගැටලු විසඳීමේ අරමුණින් රඳවා තබා ගැනීමට හඳුනාගෙන ඇති ව්‍යාපෘති

# 4. අනාවරණය කරගත් කරුණු සහ නිරීක්ෂණ

## 4.1 පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම්

4.1.1. ශීර්ෂ අංක 198 සහ 282 යටතේ වැඩසටහන අංක 2- සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ප්‍රතිපාදන සපයා ඇති පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම්වලට අදාළව, වසර හතරක (2020 - 2023) සංසන්දනාත්මක අගයන්, පහත 1 වගුවෙහි දක්වා ඇත.

**1 වගුව- පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම්වලට අදළව සිව් වසරක සංසන්දනාත්මක අගයන්**

| ශීර්ෂය | වියදම් කාණ්ඩය | 2020 තථ්‍ය | 2021 තථ්‍ය | 2022 තථ්‍ය | 2023 ඇස්තමේන්තුගත |
|---|---|---|---|---|---|
| 198 | පුනරාවර්තන | 3,001 | 3,205 | 3,580 | 4,676 |
| | ප්‍රාග්ධන | 30,044 | 37,546 | 45,798 | 64,541 |
| | අනුපාතය | 1:9 | 1:9 | 1:9 | 1:9 |
| 282 | පුනරාවර්තන | 3,130 | 3,214 | 3,554 | 4,224 |
| | ප්‍රාග්ධන | 8,466 | 8,524 | 5,137 | 11,209 |
| | අනුපාතය | 3:7 | 3:7 | 4:6 | 3:7 |

*මූලාශ්‍රය ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

4.1.2. පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම්වල එකතුව අනුපාතයක් ලෙස ඉහත වගුවේ දක්වා ඇත. වසර 4 ක අනුපාත අඛණ්ඩව සමාන අගයක් ගනිද්දී, පුනරාවර්තන වියදම් නිරපේක්ෂ වශයෙන් වාර්ෂිකව වැඩි වී ඇත. පුනරාවර්තන වියදම් මෙන් නොව, ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කරන ලද සම්පත්වල උපයෝජනය ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල සංකීර්ණත්වය සහ කළමනාකාරීත්වයේ කාර්යක්ෂමතාවය මත රඳා පවතී. ප්‍රාග්ධන ව්‍යාපෘති සාමාන්‍යයෙන් ආකාර කිහිපයකට වර්ගීකරණය කෙරේ. වාරි සංවර්ධන ව්‍යාපෘති, බොහෝ දුරට ආපදා ආරක්ෂණ සහ පාරිසරික ව්‍යාපෘති හෝ අදියර දීර්ඝ කිරීමේ ව්‍යාපෘති යන කාණ්ඩ දෙකෙන් එකකට අයත් වේ. එබැවින්, මෙම ව්‍යාපෘති සම්පූර්ණ කිරීම මඟින් නඩත්තු කිරීම්වලට අදාළ පුනරාවර්තන වියදම් වැඩි වනු ඇත.

4.1.2. රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුව විසින් වියදම් සමාලෝචනය කිරීමට අපේක්ෂා කරනු ලබන ව්‍යාපෘති තිස්පහක් (35), ව්‍යාපෘති අරමුණු මත පදනම්ව පහත 2 වගුවේ දක්වා ඇති පරිදි පුළුල් ලෙස කාණ්ඩ දෙකකට වර්ගීකරණය කර ඇත. නඩත්තු ආශ්‍රිත වියදම්වල බලපෑම හේතුකොටගෙන, 2 වගුවෙහි දක්වා ඇති කාණ්ඩයෙන් කාණ්ඩයට

වෙනස් ප්‍රතිඵල සහිත ව්‍යාපෘති මඟින්, 1 වගුවෙහි දක්වා ඇති පරිදි ඉකුත් වසර තුන තුළ සිදු කරන ලද පුනරාවර්තන වියදම්වල හැසිරීම් රටාව බලපෑමට ලක් වී ඇත.

## 2 වගුව: වාරිමාර්ග ව්‍යාපෘති වර්ගීකරණය

| පුනරුත්ථාපන | නව සංවර්ධන |
|---|---|
| 1. IWWRMP - ඒකාබද්ධ ජල පෝෂක සහ ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය<br>2. CRIWMP - වැව්ගම් පුබුදුව<br>3. වෙල්ලස්ස නවෝදය<br>4. පහළ උඵව ව්‍යාපෘතිය (LUMP)<br>5. වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය<br>6. රඹකැන්ඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය<br>7. වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ ග්‍රාමීය වැව් සංවර්ධන ව්‍යාපෘතිය<br>8. ගිං, නිල්වලා, කළු සහ කැලණි ගඟ ආශ්‍රිතව ගංවතුර අවම කිරීමේ ව්‍යාපෘතිය<br>9. බැරැක් ජ්ලේන් ලේක් සංවර්ධන ව්‍යාපෘතිය<br>10. පොළොන්නරුව වාරි සංවර්ධන ව්‍යාපෘතිය<br>11. රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය.<br>12. කැලණි ගං ඉවුර ආරක්ෂණ ව්‍යාපෘතිය | 1. තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය<br>2. ඇල්ලේවැව ජලාශ ව්‍යාපෘතිය<br>3. උමා ඔය පහළ සංවර්ධන ව්‍යාපෘතිය<br>4. යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය<br>5. ගිං-නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය - අදියර 1 (ශක්‍යතා අධ්‍යයනය සහ සැලසුම්)<br>6. මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය<br>7. කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතිය<br>8. මුන්දෙනි ආරු ගංගා ද්‍රෝණිය සංවර්ධන ව්‍යාපෘතිය<br>9. MWSIP - මහවැලි ජල ආරක්ෂණ ආයෝජන ව්‍යාපෘතිය<br>10. CResMPA - දේශගුණික ඔරොත්තු දීමේ බහු-අදියර වැඩසටහන් ප්‍රවේශය<br>11. මොරගහකන්ද - කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය<br>12. භූගත ජල නිරීක්ෂණ ජාලයක් පිහිටුවීම<br>13. උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය<br>14. කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය<br>15. දෙමටගල වැව ප්‍රතිසංස්කරණය කිරීම<br>16. පහළ මල්වතු ඔය බහු අංශ සංවර්ධන ව්‍යාපෘතිය<br>17. හිඹිලියාකඩ වාරි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය<br>18. කුඩාවිලච්චිය ජලාශ ව්‍යාපෘතිය<br>19. පැල්වත්ත උක් වතුකරයේ පදිංචිකරුවන්ගේ පර්යන්ත ප්‍රදේශ සඳහා වාරි සංවර්ධන සැලැස්ම<br>20. මොරාන ජලාශ ව්‍යාපෘතිය<br>21. ගොඩිගමුව වැව සංවර්ධනය හා වැඩිදියුණු කිරීම<br>22. විලකණ්ඩිය ජලාශය<br>23. මහගල්ගමුව වැව වැඩිදියුණු කිරීම |

### 4.2 වාරිමාර්ග ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ ක්‍රියාමාර්ග

විවිධ වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘති පිහිටුවා ඇත්තේ නව සේවා ඇති කිරීම හෝ පවතින සේවාවන්හි ක්‍රියාකාරී කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම යන අරමුණු මුල්කොටගෙන ය. රාජ්‍ය අරමුදලින් සිදුකෙරෙන මෙම ව්‍යාපෘතිවල මූලාරම්භය අමාත්‍යාංශය විසින් මෙන්ම විවිධ විදේශීය ආයතන විසින්ද අතීතයේදී ප්‍රවර්ධනය කර ඇතත් ඒවායින් සමහරක් ටෙන්ඩර් කැඳවීමකින් තොරව සිය කැමැත්තෙන් ඉදිරිපත් කරන ලද යෝජනා වේ (Unsolicited Proposals). මේ සියල්ල සම්පත් ප්‍රශස්තකරණය, ආහාර ස්වයංපෝෂිතභාවය සහ ආහාර සුරක්ෂිතතාවය, සාධාරණාත්මක සංවර්ධනය, ආර්ථික සංවර්ධනය, සමාජ සංහිඳියාව, තිරසාර සංවර්ධනය යනාදී දිගුකාලීන ප්‍රතිලාභ පිළිබඳ සුදුසු විශ්ලේෂණයක් මත පදනම් වී ඇත්තේ ද යන්න පැහැදිලි නැත. ක්ෂේත්‍ර මට්ටමින්, දැනට පවත්නා වාරිමාර්ග පද්ධතිවල ඉහළ ජල සහ භූමි ඵලදායිතාවයක් සඳහා ජලය සහ භූමිය කාර්යක්ෂමව භාවිතා කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය. කාර්යක්ෂම ජල භාවිතය තුළින් මෙහෙයුම් පිරිවැය සැලකිය යුතු ලෙස ඉතිරි කර ගත හැකිය. ජල සංරක්ෂණ පිළිවෙත් හඳුන්වාදීම හේතුවෙන් මෙරට වී වගාවේදී සිදුවන අතිරික්ත ජල භාවිතය අවම කර ගත හැකිය. අකාර්යක්ෂමතාවය හේතුවෙන් ඉඩම් හා ජලය අපතේ යාම, පාරිසරික හායනය සිදු වීම සහ අනෙකුත් අංශ සඳහා ජලය ලබා ගැනීම සීමා කිරීමට සිදු වීමෙන් ජාතික ආර්ථිකයට, බලශක්ති මෙන්ම නිෂ්පාදන පාඩු ද ඇති වේ.

වාරිමාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන්නේ, අමාත්‍යාංශයේ ඒ සඳහා විශේෂයෙන් ස්ථාපිතව ඇති ව්‍යාපෘති කාර්යාල මඟින් හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය සහ අනෙකුත් රේඛීය ආයතන මඟිනි. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම අරමුණු කොටගෙන විවිධ නියමිත ක්‍රියාවලීන් මඟ හැරීම සඳහා, විදේශීය අරමුදල් සහිත ව්‍යාපෘති සඳහා වෙනම ව්‍යාපෘති කාර්යාල පිහිටුවීම පුරුද්දක් වී ඇති බව නිරීක්ෂණය වේ. සිදු විය යුත්තේ, ව්‍යාපෘති කාර්යයන් වේගවත්ව ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සලසනු පිණිස, නවීන කළමනාකරණ සහ රාජ්‍ය මූල්‍ය භාවිතයන් අනුගමනය කරමින් දෙපාර්තමේන්තු පද්ධතිය සංවර්ධනය කිරීම හා නවීකරණය කිරීමයි. ව්‍යාපෘති සැලසුම්කරණය, නිර්මාණකරණය සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ තාක්ෂණික ප්‍රවීණත්වය පමණක් නොව, ඒවායේ සාර්ථකත්වය සඳහා සීමිත අයවැය කළමනාකරණය කිරීමේදී ද සුදුසු කුසලතා සහ ශිල්පීය ක්‍රමවල අවශ්‍යතාවය ව්‍යාපෘති සම්බන්ධයෙන් පවතින බවට සැකයක් නැත. රේඛීය ආයතන විසින් (වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය, සීමාසහිත මධ්‍යම ඉංජිනේරු සේවා සමාගම, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, මහවැලි උපදේශන කාර්යාංශය) දශක කිහිපයකට පෙර ජල සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් මහා පරිමාණ ව්‍යාපෘති ක්‍රියාත්මක කළ අතර ඒවායේ ධාරිතාවයන් ප්‍රතිෂ්ඨාපනය කර ශක්තිමත් කළ යුතුව ඇත. යොමුගත කරුණුවල සඳහන් 4 වැනි කාර්යය ප්‍රකාරව, අමාත්‍යාංශය යටතේ පවතින විශේෂ ව්‍යාපෘති කාර්යාල ඉවත් කිරීම මඟින් සහ ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා අවශ්‍ය වෙතොත්, පරිපාලන ක්‍රියා

පටිපාටිවල අවශ්‍ය වෙනස්කම් කරමින්, රේඛීය ආයතන හරහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් සැලකිය යුතු පොදු කාර්ය පිරිවැයක් අඩු කළ හැකි බව කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී.

දේශීයව ලබා ගත හැකි ශ්‍රම බලකාය සහ ආයතනික ධාරිතා වර්ධනය නොසලකා හරිමින් වාරිමාර්ග ව්‍යාපෘති සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීමේදී, බාහිර විශේෂඥතාව මත අධික ලෙස යැපීම හේතුවෙන්, (Dependency Syndrome- බාහිර උපකාරයකින් තොරව යම් කණ්ඩායමකට සිය ගැටලු විසඳාගත නොහැකි බවට ආකල්පයක් සහ විශ්වාසයක්) නිර්මාණය වී ඇත. දේශගුණික විපර්යාසයන් සමඟින් ජල සම්පත් ලබා ගැනීමේ හැකියාව සැලකිල්ලට නොගෙන , බාහිර මූලාශ්‍ර මගින් ප්‍රවර්ධනය කරන ලද, සහ දෝෂ සහගත ලෙස සැලසුම් කරන ලද ඇතැම් ව්‍යාපෘති සඳහා අධික පිරිවැයක් දරා තිබුණද, ඒවායේ සාර්ථකත්වය පිළිබඳව අවිනිශ්චිත තත්වයක් පවතියි. විදේශ විනිමය ඉතිරි කර ගැනීම සඳහා පමණක් නොව, තාක්ෂණික සංවර්ධනයට සහ විශේෂයෙන් විදෙස්ගත වීමෙන් පසු විදේශ රටවල අතිශය සාර්ථකව කටයුතු කරන දේශීය ඉංජිනේරුවන් සඳහා රැකියා අවස්ථාවන් ඉහළ නැංවීමට ද මෙම යැපීම් සින්ඩ්‍රෝමයට තිත තැබීමට අවැසි වේ.

## 4.3 ව්‍යාපෘතිවල ප්‍රමුඛතා අනුපිළිවෙල සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳ නිර්දේශ

i. 4.3.1 - සෑම ව්‍යාපෘතියක්ම පිරිවැය ඵලදායි ලෙස මෙන්ම නියමිත ප්‍රමිතීන්ට හානියක් නොවන පරිදි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය බව කමිටුව අවධාරණය කරයි. ක්‍රමානුකූල සමාලෝචනයක් මත පදනම්ව, 2023 වසරේ දී අරමුදල් සැපයීමට නියමිත ව්‍යාපෘති 26 ක ප්‍රමුඛතා අනුපිළිවෙල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳ *නිර්දේශයන්ට අදාළ කාණ්ඩය ද සමඟ 3 වගුවෙහි දක්වා ඇත. යොමුගත කරුණුවල නියම* කර ඇති 5 වැනි කාර්යය අනුව, ජාතික වැදගත්කමකින් යුත් පහත සඳහන් ව්‍යාපෘති රේඛීය ආයතන හරහා ක්‍රියාත්මක කළ යුතු මූලික ව්‍යාපෘති තුනක් ලෙස, කමිටුව විසින් හඳුනාගෙන ඇති අතර, ඒවා පිළිබඳ විස්තර ඇමුණුම - 4 හි දක්වා ඇත.

i. උමා ඔය පහළ සංවර්ධන ව්‍යාපෘතිය
ii. පහළ මල්වතු ඔය බහුකාර්ය ජලාශ ව්‍යාපෘතිය
iii. ඇල්ලේවැව ජලාශ ව්‍යාපෘතිය.

## 3. වගුව -ව්‍යාපෘතිවල ප්‍රමුඛතා අනුපිළිවෙල සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳ **නිර්දේශ**

| **ප්‍රමුඛතා අනුපිළිවෙල** අනුව **ව්‍යාපෘතිය (කරුණාකර සවිස්තරාත්මක විශ්ලේෂණයක් සඳහා ඇමුණුම - 3 බලන්න)** | **කාණ්ඩය** | **වැය විෂය අංකය (අනුමත අයවැය ඇස්තමේන්තුව - 2023)** | **2023 දී අරමුදල් සැපයීම (රු. මිලියන)** | **විදේශීය සංරචක/ දේශීය සංරචක / අරමුදල් මූලාශ්‍රය** |
|---|---|---|---|---|
| **අ. ඉහළ ප්‍රමුඛතාවයෙන් යුතු ව්‍යාපෘති** | | | | |
| උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය | Iv | 198-2-3-32 | 3,600 | ශ්‍රී ලංකා රජය - 3,600 |
| දේශගුණික ඔරොත්තු දීමේ බහු-අදියර වැඩසටහන් ප්‍රවේශය (CRESMPA) | iii | 198-2-3-50 | 2,025 | ලෝක බැංකුව - 2,000<br>ශ්‍රී ලංකා රජය - 25 |
| ජල කළමනාකරණ ව්‍යාපෘතිය (වැව්ගම් පුබුදුව) සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් හරහා වියළි කලාපයේ කුඩා වතු හිමියන්ගේ දේශගුණික විචල්‍යතා සහ ආන්තික සිදුවීම් වලට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම. | iv | 198-2-3-42 | 2,930 | හරිත දේශගුණ අරමුදල/එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන -1,700<br>ශ්‍රී ලංකා රජය -1,230 |
| ඒකාබද්ධ ජල පෝෂක සහ ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (IWWRMP) | iii | 198-2-3-50 | 2,025 | ලෝක බැංකුව - 2,000<br>ශ්‍රී ලංකා රජය - 25 |
| මහවැලි ජල ආරක්ෂණ ආයෝජන ව්‍යාපෘතිය (පළමු අදියර) | iv | 198-2-3-42 | 2,930 | හරිත දේශගුණ අරමුදල / එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන -1,700<br>ශ්‍රී ලංකා රජය -1,230 |
| උමා ඔය පහළ සංවර්ධන ව්‍යාපෘතිය | iii | 198-2-3-50 | 2,025 | ලෝක බැංකුව - 2,000<br>ශ්‍රී ලංකා රජය - 25 |
| | | | | |
| තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය | iii | 198-2-3-5 | 500 | ශ්‍රී ලංකා රජය – 500 |
| කැලණි ගං බැම්ම සුරැකීමේ ව්‍යාපෘතිය | i | 282-2-3-23 | 1,000 | ශ්‍රී ලංකා රජය - 1,000 |
| ගිං, නිල්වලා, කැලණි සහ කළු ගං ද්‍රෝණියේ ගංවතුර අවම කිරීමේ ව්‍යාපෘතිය. | i | 282-2-3-26 | | - |
| පොළොන්නරුව වාරි සංවර්ධන ව්‍යාපෘතිය | i | 282-2-3-21 | 200 | ශ්‍රී ලංකා රජය - 200 |

| | | | | |
|---|---|---|---|---|
| යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය | ii | 282-2-3-5 | 3,500 | ශ්‍රී ලංකා රජය - 3,500 |
| පැලවත්ත උක් වගාවේ වාරිමාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම | ii | 198-2-3-43 | 30 | ශ්‍රී ලංකා රජය - 30 |
| ගොඩිගමුව වැව සංවර්ධනය හා වැඩිදියුණු කිරීම | i | 282-2-3-25 | 35 | ශ්‍රී ලංකා රජය - 35 |
| විලකණ්ඩිය ජලාශ ව්‍යාපෘතිය | i | 282-2-4-44 | | - |
| පහළ මල්වතු ඔය බහුකාර්ය ජලාශ<br><br>ව්‍යාපෘතිය | iii | 198-2-3-13 | 550 | ශ්‍රී ලංකා රජය - 550 |
| මහගල්ගමුව වැව වැඩිදියුණු කිරීම | i | 282-2-4-47 | 100 | ශ්‍රී ලංකා රජය – 100 |
| | | | | |
| **ආ. මධ්‍යම ප්‍රමුඛතාවයෙන් යුත් ව්‍යාපෘති** | | | | |
| මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය | iii | 198-2-3-41 | 650 | ශ්‍රී ලංකා රජය - 650 |
| ශ්‍රී ලංකාවේ නකල්ස් කඳුවැටියේ ජල පෝෂක ප්‍රදේශයේ අවදානමට ලක්විය හැකි ගංගා ද්‍රෝණිවල, ජල පෝෂක ප්‍රදේශවල සහ පහළ ගංගාවල පදිංචි යැපුම් ගොවීන්ගේ සහ කෘෂිකාර්මික වැවිලි ප්‍රජාවන්ගේ, දේශගුණික විචලනයන්හට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම. | i | 198-2-3-51 | 1,250 | සොබාදහම සංරක්ෂණය සඳහා වන ජාත්‍යන්තර සංගමය -1,000<br>ශ්‍රී ලංකා රජය - 250 |
| ඇල්ලේවැව ජලාශ ව්‍යාපෘතිය | ii | 282-2-3-14 | 100 | ශ්‍රී ලංකා රජය - 100 |
| කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතිය | ii | 198-2-3-44 | 100 | ශ්‍රී ලංකා රජය - 100 |
| මුන්දෙනි ආරු ගංගා ද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය (AFD) | iii | 282-2-3-19 | 160 | ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය-150<br>ශ්‍රී ලංකා රජය - 10 |
| **ඇ. අඩු ප්‍රමුඛතා ව්‍යාපෘති** | | | | |
| හිඹිලියාකඩ වාරි යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය | ii | 282-2-3-34 | 300 | GoSL - 300 |
| බැරැක් ජලේන් වැව වැඩිදියුණු කිරීම සහ අවට ප්‍රදේශය වෙනස් කිරීම. | ii | 198-2-3-45 | 30 | GoSL- 30 |
| කුඩාවිලච්චිය ජලාශය ප්‍රතිසංස්කරණය කිරීම | v | 282-2-3-30 | 300 | GoSL - 300 |

| | | | | |
|---|---|---|---|---|
| කුඹුක්කන් ඔය ජලාශය සංවර්ධනය කිරීමේ වැඩසටහන | v | 282-2-3-17 | 300 | GoSL – 300 |
| දෙමටගල ජලාශය නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය | v | 282-2-3-31 | 5 | GoSL - 5 |

# 5. නිර්දේශ

ඉහත 4 වැනි ඡේදයේ සඳහන් අනාවරණය කරගත් කරුණු සහ නිරීක්ෂණ සැලකිල්ලට ගනිමින්, පහත සඳහන් නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට රාජ්‍ය මූල්‍ය සමාලෝචන කමිටුව අපේක්ෂා කරයි.

## 5.1 ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම

i. ශුන්‍ය පාදක අයවැයකරණ මූලධර්මවලට අනුකූලව 2023 වසර අවසන් වීමට පෙර (2022 මූල්‍ය වර්ෂය වන විට ව්‍යාපෘතීන් අවසන් කිරීම RAMP තීරණය වුවද) සියලු කටයුතු ඉටු කරන බවට සහතික වෙමින්, ඇමුණුම - 5 හි ලැයිස්තුගත කර ඇති ව්‍යාපෘති 12 ක් (කමිටුව විසින් මූලික ව්‍යාපෘතියක් ලෙස තෝරාගෙන ඇති පහළ මල්වතු ඔය බහු අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය හැර) සම්පූර්ණ කිරීම.

ii. 3 වගුවේ දක්වා ඇති ව්‍යාපෘතිවල ප්‍රමුඛතා අනුපිළිවෙලට සහ නිශ්චිත වෙනස් කිරීම්වලට අනුකූලව එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

iii. ජාතික වැදගත්කම සැලකිල්ලට ගනිමින් 4.3.1 ඡේදයේ සඳහන් මූලික ව්‍යාපෘති තුන ක්‍රියාත්මක කිරීම.

iv. ඇමුණුම - 3 හි ලැයිස්තුගත කර ඇති සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් සිදුවිය හැකි යැයි අපේක්ෂිත ඉතිරිකිරීම්, වීරමොං ක්‍රියා පටිපාටියට අනුව අමතර අරමුදල් අවශ්‍ය වන ව්‍යාපෘතීන් සඳහා භාවිතා කිරීම.

v. ඵලදායි ලෙස වියදම් පාලනය සඳහා ලබන වසරේ අයවැය ඇස්තමේන්තුවලට සියලුම ව්‍යාපෘති තනි වැය ශීර්ෂයක් යටතේ ඇතුළත් කිරීමට ඇති හැකියාව පිළිබඳව සොයා බැලීම.

vi. එක් එක් සංරචක වලින් පිරිවැය ඵලදායී ලෙස වාසිදායක ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වන පරිදි මහා පරිමාණ ව්‍යාපෘති අනෙකුත් සංරචක වලින් ස්වාධීනව ක්‍රමානුකූලව ක්‍රියාවට නැංවීමට පියවර ගැනීම.

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන ව්‍යාපෘතිය - මොරගහකන්ද ජලාශය පරිරෝධනය කිරීමෙන් පසු මේ වන විට වසර කිහිපයක සත්‍ය දත්ත ප්‍රවාහය ලබා ගැනීමත් සමඟින්, වෙනස් වන දේශගුණය යටතේ

මොරගහකන්ද ජලාශයේ සිට උතුරු මැද පළාත වෙත හැරවිය හැකි ජල පරිමාවන් සඳහා වඩාත් යථාර්ථවාදී තක්සේරුවක් ලබා දිය හැකිය.

vii. ඉහළ ඇලහැර ඇළ හරහා මාරු කළ හැකි ජල පරිමාව තීරණය කිරීම සඳහා, අ) දැනට පවතින ඇලහැර යෝධ ඇළ සිට මින්නේරිය, කවුඩුල්ල, කන්තලේ වැව්වලට සහ අංගමැඩිල්ල සිට පරාක්‍රම සමුද්‍රය වෙත ජල හැරවුම යටතේ, ආ) බෝවතැන්නේ සහ මිනිපේ හැරවුම් යටතේ සහ ඇ) නව වයඹ ඇළ යන දැනට පවතින වගා බිම්වල බෝග තීව්‍රතාවය වැඩි කිරීම පිණිස පහළ නිම්න ජල සැපයුම සඳහා පවතින ඉල්ලුම සැලකිල්ලට ගනිමින් දැනට පවතින සත්‍ය ජල ප්‍රමාණය නැවත විශ්ලේෂණය කිරීම. මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන ව්‍යාපෘතියේ I අදියරෙහි කටයුතු තවදුරටත් ක්‍රමානුකූලව නැවැත්විය යුතු අතර එමඟින් යකල්ලට අදාළ කටයුතු ක්‍රියාත්මක කිරීමෙන් පසු ඇළ මාර්ග ඉදිකිරීම එකිනෙක සිදු කෙරෙන අතර, ප්‍රථමයෙන් හුරුළුවැවට ජලය මාරු කිරීම මෙම අදියරේදී සිදු කෙරේ.

viii. පිළිසකර කටයුතු සිදුකිරීම සඳහා විශේෂ පුනරුත්ථාපන වැය විෂයක් යටතේ සහ දැනට පවතින වාරිමාර්ග යෝජනාක්‍රම සඳහා වාර්ෂිකව අයවැයෙන් සැලකිය යුතු ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කිරීම.

## 5.2 වාරිමාර්ග සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති

i. 4.1 ඡේදයේ නිරීක්ෂණයන්ට අනුව, පුනරාවර්තන වියදම් දැරීම සඳහා සම්පත් වෙන් කිරීම, ව්‍යාපෘති ප්‍රතිඵලවල බලපෑම තක්සේරු කිරීම හා සම්බන්ධ විද්‍යාත්මක ඇස්තමේන්තු මත පදනම්ව කටයුතු කිරීම නිර්දේශ කෙරේ.

ii. වාරිමාර්ග අමාත්‍යාංශය තුළම පවතින විශේෂ ව්‍යාපෘති කාර්යාල හරහා ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කිරීමේ සිරිත නැවැත්වීමට නොඑසේ නම් අත්හැර දැමීමට කටයුතු කිරීමට සිදු වනු ඇත. ඒ වෙනුවට, අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමෙන් හා විශේෂඥ හැකියාවන් අන්තර්ජාතික මට්ටමට වැඩි දියුණු කිරීම තුළින් රේඛීය ආයතනවල (වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය, සීමාසහිත මධ්‍යම ඉංජිනේරු සේවා සමාගම, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, මහවැලි උපදේශන කාර්යාංශය) ධාරිතාවය ශක්තිමත් කිරීම සහ නිර්දේශ කෙරේ.

iii. අනවශ්‍ය ආයෝජන වළක්වා ගැනීම සඳහා අදාළ ආයතනයන් (ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ලංකා විදුලිබල මණ්ඩලය, නාගරික සංවර්ධන අමාත්‍යාංශය, කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය යනාදී) සමඟ එක්ව, ඒකාබද්ධ මාර්ග සිතියමක් සකස් කිරීම (තිරස් ඒකාබද්ධ කිරීම) අවශ්‍ය වේ. ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් අයවැය මත පැටවීමකින් තොරව, අදාළ ආයතනයන් සමඟ එක්ව සංවර්ධනය කරන ලද එම මාර්ග සිතියම මත පදනම් වූ ව්‍යාපෘතීන්වලට ප්‍රමුඛතාවය ලබා දීම නිර්දේශ කෙරේ.

iv. වාර්ෂික අයවැයේ සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය තුළ, ඉහළ ප්‍රාග්ධන තීව්‍රතාවයෙන් යුතු නව වාරිමාර්ග ව්‍යාපෘති සඳහා රාජ්‍ය මුදල් ආයෝජනය කිරීම තුළින් වාරි වපසරිය පුළුල් කිරීම සඳහා අනුබල දිය නොහැකිය. ගොවිතැන වඩාත් අරපිරිමැසුම්දායී කිරීම සහ පාරිසරික වශයෙන් තිරසාර කිරීමේ අරමුණින් යෝග්‍ය ජල හා පොහොර කළමනාකරණ, භෝග කළමනාකරණ සහ ගොවිතැන් පිළිවෙත් අනුගමනය කරමින් බෝග තීව්‍රතාවය සහ ජල හා භූමි පරිහරණ කාර්යක්ෂමතාවය (ඵලදායිතාවය) ඉහළ නැංවීම සඳහා දැනට පවතින වාරිමාර්ග ප්‍රදේශවල ඉඩම් හා ජල සම්පත් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම වත්මන් තත්ත්වය තුළ විචක්ෂණශීලී වේ.

v. නව වර්ධනයන් සම්බන්ධයෙන් ගත් කල, හවුල්කාරිත්වයන් හරහා හෝ අන්‍යාකාරයෙන් පුද්ගලික අංශයේ ආයෝජන, ශක්‍යතාවයෙන් යුතු බහුකාර්ය ව්‍යාපෘති සඳහා යෙදවීම දිරිමත් කිරීම, වාර්ෂික අයවැයේ පවතින සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය යටතේ මධ්‍ය කාලීන වශයෙන් තිරසාර ඵලදායිතා වර්ධනය සඳහා ක්‍රමෝපායික පියවරක් වනු ඇත. ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා පාරිසරික සංචාරක ව්‍යාපාරය, මිරිදිය මත්ස්‍ය වගාව, සූර්ය/ජල විදුලි උත්පාදන ව්‍යාපෘති ආදිය ඇතුළත් බහුකාර්ය ව්‍යාපෘති සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්ව ආකෘතිය යටතේ ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති කිහිපයක් ඇමුණුම - 3 හි හඳුනාගෙන ඇත.

vi. විදේශ විනිමය ඉතිරි කර ගැනීමට පමණක් නොව, තාක්‍ෂණික සංවර්ධනය හා රැකියා අවස්ථා වැඩි දියුණු කිරීම හා තරුණ පරම්පරාවේ ආකල්පමය වෙනසක් ඇති කිරීම උදෙසා දේශීය ධාරිතා සංවර්ධනයට පහසුකම් සැලසීම සහ ආයතන ශක්තිමත් කිරීම ආදිය සිදු කරන අතරම, දිවයිනේ ජල සම්පත් කළමනාකරණය සඳහා තාක්ෂණික සහ මූල්‍යමය වශයෙන් විදේශ ආධාර මත යැපීමේ සින්ඩ්‍රෝමය වළක්වා ගැනීම නිර්දේශ කෙරේ.

vii. තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) වලට අනුකූලව, විපරීත දේශගුණය සහ භූමි පරිහරණය යටතේ මතුපිට ජලය හා භූගත ජලය තුළ පවතින මිරිදිය නැවත තක්සේරු කිරීම, ජලයේ ගුණාත්මකභාවය හා ප්‍රමාණය සුරැකීම සහ සංරක්ෂණය කිරීම, ජාතික නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා විවිධ ක්ෂේත්‍රවල වැඩි වෙමින් පවතින භාවිතයන් අතර ජලය බෙදාගැනීම, සෑම අංශයකම ජල පරිහරණ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම වැනි පැතිකඩ නිරාකරණය කළ හැකි පුළුල් ජල අංශ ප්‍රතිපත්තියක් ශ්‍රී ලංකාවට අවශ්‍ය වේ. ජල පාලනය සඳහා අවශ්‍ය නීති රීති බලාත්මක කරමින්, ජල - සුහුරු සමාජයක් ප්‍රවර්ධනය කිරීම සඳහා මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන අතරතුර, ජල ඵලදායිතාවය හා සම්බන්ධ වැඩිදියුණු කිරීම් සඳහා එක් එක් අංශය සතුව ප්‍රධාන සැලසුම් තිබිය යුතුය.

වාරිමාර්ග ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ගත් කල, දැනට පවත්නා පද්ධතිවල වාරි ජල සහ භූමි ඵලදායිතාවය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දෙමින් අමාත්‍යාංශයේ දැක්මට අනුකූලව තිරසාර සංවර්ධනය සිදු කිරීම සඳහා සංවර්ධන ප්‍රවණතා, බෝග විවිධාංගීකරණය, පාංශු සාඵල්‍ය කළමනාකරණය, ජනවිකාශනය

සහ පරිසර පද්ධති සේවා යනාදියට නිසි අවධානයක් ලබා දෙන අතරම, ජල සම්පත් ලබා ගැනීමේ සහ භාවිතයේ වත්මන් තත්ත්වය යටතේ, වාරිමාර්ග ජල කළමනාකරණ ප්‍රධාන සැලැස්මක් යාවත්කාලීන කිරීම/ සංවර්ධනය කිරීම නිර්දේශ කරනු ලැබේ.

අජිත් අබේසේකර (සභාපති) ............................

ඩී. විදානගමාච්චි (කමිටු සාමාජික) ....................................

මහාචාර්ය එස්.බී. වීරකෝන් (කමිටු සාමාජික) ....................................

මහාචාර්ය ලලිත් රාජපක්ෂ (කමිටු සාමාජික) ......................................

ඉංජිනේරු ප්‍රියානි මුතුමාල ජයධීර (කමිටු සාමාජිකාව) ....................................

ඉංජිනේරු චන්දන එදිරිසූරිය (කමිටු සාමාජික) ....................................

# රාජ්‍ය වියදම් සමාලෝචන කමිටු (PERC)

## යොමු කිරීමේ නිර්දේශ

### කාර්යභාරය

ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිසාධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා ක්‍රමානුකූල සමාලෝචනයක් සහ **ශුන්‍ය පාදක අයවැය** ප්‍රවේශයක් හරහා රජයේ වියදම් සාධාරණීයකරණය කිරීම.

### වගකීම්

- හර ක්‍රියාකාරකම් අමාත්‍යාංශයේ විධිනියෝගයට අනුකූලදැයි නිර්ණය කිරීම
- ජාතික අයවැය ඇස්තමේන්තුවල වත්මන් වියදම් වැඩසටහන්හි ඇති ද්විකරණය, අපතේ යාම් සහ නොවැදගත් ව්‍යාපෘති හෝ වියදම් හඳුනා ගැනීම
- දැනටමත් වෙන් කර ඇති ප්‍රතිපාදන භාවිතා කිරීම සඳහා කාර්යක්ෂම හා ඵලදායී ක්‍රියා පටිපාටි හඳුනා ගැනීම
- අමාත්‍යාංශය සිය වගකීම් පිරිවැය ඵලදායී අයුරින් ඉටු කරන බවට සහතික වීම

සඳහා රාජ්‍ය වියදම් සමාලෝචන කමිටු වගකීම දරයි

### බලතල

2023.02.06 දිනැති අංක 23/0256/604/030 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව පහත සඳහන් අමාත්‍යාංශවල වියදම් සාධාරණීකරණය කර අමාත්‍ය මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කමිටු දහයක් පිහිටුවා ඇත.

i. ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය
ii. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
iii. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
iv. ආරක්ෂක අමාත්‍යාංශය
v. මහජන ආරක්ෂක අමාත්‍යාංශය
vi. අධ්‍යාපන අමාත්‍යාංශය
vii. සෞඛ්‍ය අමාත්‍යාංශය
viii. කෘෂිකර්ම අමාත්‍යාංශය
ix. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
x. වාරිමාර්ග අමාත්‍යාංශය

### කමිටුවක සංයුතිය

| | |
|---|---|
| සභාපති | භාණ්ඩාගාර ලේකම් විසින් නම් කරන ලද භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙකුහෝ මහ ා භාණ්ඩාගාරයේ ෙජ්‍යෂ්ඨ නිලධාරියෙකු |
| සාමාජිකයන් | අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහුගේ නම් කළ තැනැත්තා ජනාධිපති ලේකම්වරයා විසින් නම් කරන ලද ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් තිදෙනෙක් |
| කැඳවුම්කරු | භාණ්ඩාගාර ලේකම් විසින් නම් කරන ලද ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් |

## සමාලෝචන ක්‍රමවේදය

1. ආයතනයේ මෙහෙවර සහ දැක්ම සමාලෝචනය කර අවශ්‍ය නම් ඒවා නැවත නිර්වචනය කිරීම.
2. රේඛීය අමාත්‍යාංශයේ සියලුම වැඩසටහන්/ව්‍යාපෘති/උප ව්‍යාපෘති/ක්‍රියාකාරකම් සමාලෝචනය කර අමාත්‍යාංශයේ අරමුණු, මෙහෙවර සහ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා එක් එක් දායකත්වය සපයන ආකාරය හඳුනා ගැනීම.
3. පවතින අයවැය ඇස්තමේන්තු වල ද්විකරණය, නාස්තිය සහ නොවැදගත් ව්‍යාපෘති හෝ වියදම් හඳුනා ගැනීම.
4. අමාත්‍යාංශයේ අරමුණු මෙන්ම ජාතික ප්‍රතිපත්ති සාක්ෂාත් කර ගැනීමේ හැකියාව අනුව සියලුම වැඩසටහන්/ව්‍යාපෘති/උප ව්‍යාපෘති සඳහා ප්‍රමුඛත්වය ලබා දීම.
5. අමාත්‍යාංශය/දෙපාර්තමේන්තු යටතේ දැනට ක්‍රියාත්මක වන හර ව්‍යාපෘති තුනක් (3) හඳුනා ගැනීම.
6. එවැනි ව්‍යාපෘති ඔවුන්ට ලබා දීම සඳහා සාධාරණීකරණයන් සෙවීම.
7. අඛණ්ඩ හර ක්‍රියාකාරකම් සඳහා කාර්ය මණ්ඩල අවශ්‍යතා සහ අනෙකුත් පහසුකම් හඳුනා ගැනීම.
8. හැකි නම් පිරිවැය ප්‍රේරකයන් / ඒකක පිරිවැය සහ පිරිවැය අඩු කිරීමේ ක්‍රමවේද හඳුනා ගැනීම.
9. පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය මත පදනම්ව එක් එක් ක්‍රියාකාරකම් සඳහා අවම සම්පත් අවශ්‍යතා හඳුනා ගැනීම.
10. ඉලක්ක සාක්ෂාත් කර ගැනීම, ඇගයීම සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) හඳුනා ගන්න.
11. ආර්ථික ප්‍රතිසාධනය සඳහා ක්‍රියාත්මක කළ හැකි ප්‍රතිසංස්කරණ (කෙටි/මධ්‍යම/දිගු කාලීන) හඳුනා ගැනීම.

    උදාහරණ

    - රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන් සඳහා විය හැකි ක්ෂේත්‍ර
    - ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය
    - පිරිවැය අවම කිරීම සඳහා පරිශීලක ගෙවීම් යාන්ත්‍රණයන්
12. වෙනත් අවශ්‍ය කාරණා.

## කාල රාමුව

කමිටු නිර්දේශ 2023 මාර්තු මාසයේ සිට මාසයක් ඇතුළත සලකා බැලීම සඳහා අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු වේ.


# 2023 අයවැය ප්‍රතිපාදන දා හැරීම

**වගුව 1: ආයතන යටතේ අයවැය ප්‍රතිපාදන බෙදා හැරීම (රුපියල් මිලියන)**


| **2023 ප්‍රතිපාදන** | වාරිමාර්ග අමාත්‍යාංශය | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | එකතුව |
|---|---|---|---|---|
| පුනරාවර්තන | 829 | 4,224 | 3,847 | **8,900** |
| ප්‍රාග්ධන | 62,916 | 11,209 | 1,625 | **75,750** |
| **2023 මුළු ප්‍රතිපාදන** | **63,745** | **15,433** | **5472** | **84,650** |

*මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

**රූපය 1: ආයතන යටතේ අයවැය ප්‍රතිපාදන බෙදා හැරීම (රුපියල් මිලියන)**




**රූපය 2 : අරමුදල් මූලාශ්‍රය යටතේ අයවැය ප්‍රතිපාදන බෙදා හැරීම**




රුපියල් මිලියන
**47,850** විදේශ අරමුදල්
වෙන් කිරීම වේ

**වගුව 2: අරමුදල් මූලාශ්‍රය යටතේ අයවැය ප්‍රතිපාදන බෙදා හැරීම**

| ශ්‍රී ලංකා රජය (රු.මිලියන) | විදේශ (රු.මිලියන) | එකතුව (රු.මිලියන) |
|---|---|---|
| **27,900** | 47,850 | 75,750 |

**වගුව 3: විදේශ ආධාර සහිත ව්‍යාපෘති පිළිබඳ විස්තර (රුපියල් මිලියන)**

| ව්‍යාපෘති | දායකයා | විදේශ ණය | විදේශ ආධාර | ශ්‍රී ලංකා රජයේ අරමුදල | මුළු ප්‍රතිපාදන |
|---|---|---|---|---|---|
| මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන | ADB<br>ආසියානු සංවර්ධන බැංකුව | 40,000 | - | 3,000 | 43,000 |
| ජල කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් හරහා වියළි කලාපයේ කුඩා වතු හිමියන්ගේ දේශගුණික විචල්‍යතා සහ ආන්තික සිදුවීම් වලට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම | GCF/UNDP<br>හරිත දේශගුණික අරමුදල /එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | - | 1,700 | 1,230 | 2,930 |
| ඒකාබද්ධ ජල පෝෂක සහ ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය | WB<br>ලෝක බැංකුව | 3,000 | - | - | 3,000 |
| දේශගුණික බහු-අදියර වැඩසටහන (CResMPA) | WB<br>ලෝක බැංකුව | 2,000 | - | 25 | 2,025 |
| ශ්‍රී ලංකාවේ නකල්ස් කඳුවැටියේ ජල පෝෂක ප්‍රදේශයට පහළින් අවදානමට ලක්විය හැකි ගංගා ද්‍රෝණිවල, ජල පෝෂක ප්‍රදේශවල සහ කෘෂිකාර්මික වැවිලි ප්‍රජාවන්ගේ යැපුම් රාමුවේ දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම | IUCN<br>හරිත දේශගුණික අරමුදල | - | 1,000 | 250 | 1,250 |

*මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

**වගුව 4: විදේශ ආධාර බෙදා හැරීම (රුපියල් මිලියන)**

| දායකයා | ණය | ආධාර |
|---|---|---|
| ආසියානු සංවර්ධන බැංකුව | 40,000 | - |
| හරිත දේශගුණික අරමුදල /එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | - | 1,700 |
| ලෝක බැංකුව | 5,000 | - |
| IUCN හරිත දේශගුණික අරමුදල | - | 1,000 |
| AFD ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය | 150 | - |
| එකතුව | 45,150 | 2,700 |

*මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව*


## වයාපෘති සමාලෝචනය

**SR අංක 1.** තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය

| | |
|---|---|
| 2. අරමුණු, දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ලබා දුන් දායකත්වය | • බත්මැඩිල්ල වාරි යෝජනා ක්‍රමයට සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ හෙක්ටයාර 1,210 ක පමණ පැතිර පවතින වනාන්තර ප්‍රදේශය වෙත වාරි ජලය සැපයීම සඳහා එහි බෝග තීව්‍රතාවය වැඩි දියුණු කිරීම,<br>• එම ප්‍රදේශයේ ඝන මීටර 6,000ක පානීය ජල අවශ්‍යතාවය සපුරාලීම<br>• ගිගා වොට් පැය 49.66ක විදුලි ජනනය සිදු කිරීම<br>• ඉහළ උමා ඔය ජල පෝෂක ප්‍රදේශයෙන් රොන්මඩ විශාල ප්‍රමාණයක් ජනනය වන බැවින් මහවැලි බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ රන්ටැඹේ ජලාශයේ රොන්මඩ කළමනාකරණය කිරීම,<br>ආදිය සඳහා ජලාශයක් මගින් ගලායාම නියාමනය කිරීම |
| 3. ද්විකරණය/ නාස්තිය/ වැදගත්කම | අදාළ නොවේ |
| 4. ව්‍යාපෘති තුළ ප්‍රමුඛත්වය ලබා දීම | ඉහළ ප්‍රමුඛත්වයක්<br>නුදුරු අනාගතයේ දී උමා ඔය හැරවීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙන් පසු බත්මැඩිල්ල යෝජනා ක්‍රමය වෙත ජල සැපයුම හිඟ වීම වළක්වා ගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක කළ යුතුය. |
| 5. සලකුණු කළ ව්‍යාපෘති 3 අතරට ඇතුළත් කිරීමේ යෝග්‍යතාවය | - |
| 6. ඔවුන්ට ව්‍යාපෘතිය ලබා දීම සාධාරණීකරණය කිරීම | උමා ඔය හැරවීමෙන් විපතට පත් ජනතාවට සහන සැලසීම |
| 7. අවම කාර්ය මණ්ඩල අවශ්‍යතාවය | අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) ) කමිටුව විසින් ලබා දී ඇති උපදෙස් අනුව අවශ්‍ය කාර්ය මණ්ඩලය සමාලෝචනය කෙරේ |
| 8. පිරිවැය ධාවක/ ඒකක පිරිවැය/ වියදම් අඩුකිරීම | මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය මගින් සිදු කෙරෙන මාර්ග ඉදිකිරීම හා සැලසුම් කටයුතු සඳහා අවශ්‍ය ශ්‍රමය, යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය ව්‍යාපෘතිය ඉවත් කිරීම<br>උමා ඔය නුදුරේදීම ආරම්භ කරනු ලබන අතර ඉන් පසුව, ශක්‍යතාවය - ජලාශයේ ප්‍රමාණය ගණනය කිරීම සඳහා ජල සම්පත ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳ විශ්වසනීයත්වය සමාලෝචනය කිරීමට නත්‍ය ප්‍රවාහ රටාවන් නිරීක්ෂණය කිරීම. |
| 9. අවම සම්පත් අවශ්‍යතා/ පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය | 2023 අයවැය යටතේ රු. මිලියන 500 ක මුදලක් වෙන් කර ඇත |
| 10 ප්‍රධාන කාර්යසාධන දර්ශක | සැලසුම් වාර්තාව මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය විසින් සැපයීම<br>ඌව පරණගම සහ කන්දෙකැටිය ගම්මාන අතර පහසු ප්‍රවාහනය |

| | |
|---|---|
| 11, ප්‍රතිසංස්කරණ/ යෝජනා/ නිර්දේශ | • මාර්ග ඉදිකිරීම් සහ සැලසුම් 2023 දී අවසන් කෙරේ.<br>• CECB හි සවිස්තරාත්මක සැලසුම සහ උමා ඔය හැරවීමේ සැබෑ බලපෑම නිරීක්ෂණය කිරීම මත පදනම්ව තීරණ ගැනීමට නියමිතය.<br>• මෙම ව්‍යාපෘතිය වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රමුඛතාගත ව්‍යාපෘතියක් ලෙස හඳුනාගත හැකිය.<br>• ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම |
| 12. වෙනත්; RAMP තීරණ | දැනටමත් ප්‍රවාහනය කර ඇති පෙර සැකසූ පාලම සවි කිරීම ඇතුළුව ඉතිරි කිලෝමීටර් 7 ක මාර්ගයේ ඉදිකිරීම් වහාම අවසන් කර ඉතිරි කටයුතු පසුව ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවීම |
| **ඇගයීම් ප්‍රතිඵල** | කාණ්ඩය ලබා දීම: iii<br>කාණ්ඩ අතර ප්‍රමුඛතාවය: **ඉහළ ප්‍රමුඛතාවය** |

## Thalpitigala Reservoir Project




**SR** අංක **2.** ව්‍යාපෘතියේ නම: ඇල්ලේවැව ජලාශ ව්‍යාපෘතිය

| | |
|---|---|
| 2. අරමුණු, දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ලබා දුන් දායකත්වය | ව්‍යාපෘතියේ අරමුණ වන්නේ:<br>• අක්කර 1,447ක පනාමුරේ සහ හුලන්දා ඔය යෝජනා ක්‍රමවල වී අස්වැන්න අක්කරයකට බුසල් 115ක් දක්වා වැඩි දියුණු කිරීම<br>• වෙනත් ක්ෂේත්‍ර බෝග (OFC) සඳහා නව ඉඩම් අක්කර 350කට වාරි ජලය සැපයීම.<br>• කොළොන්න ජල සම්පාදන ව්‍යාපෘතියේ ජල නිස්සාරණ ප්‍රමාණය දිනකට ඝන මීටර 7,000 කින් ඉහළ නැංවීම<br>-අරමුණු කරගනිමින් නව ජලාශයක් මගින් ජල ප්‍රවාහය නියාමනය කිරීමයි. |
| 3. ද්විකරණය/ නාස්තිය/ වැදගත්කම | අදාළ නොවේ |
| 4. ව්‍යාපෘති තුළ ප්‍රමුඛත්වය ලබා දීම | වාරිමාර්ග සඳහා මධ්‍යම ප්‍රමුඛතාවය<br>[ව්‍යාපෘතිය මඟින් ජල සැපයුම සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දේ] කමිටුව විසින් මෙය සළකුණු කළ ව්‍යාපෘතියක් ලෙස හඳුනාගන්නා ලදී. |
| 5. සලකුණු කළ ව්‍යාපෘති 3 අතරට ඇතුළත් කිරීමේ යෝග්‍යතාවය | ඔව්. කොළොන්න සහ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වෙත ජලය සැපයීම ඇතුළත් බහුකාර්ය ව්‍යාපෘතියකි. |
| 6. ඔවුන්ට ව්‍යාපෘතිය ලබා දීම සාධාරණීකරණය කිරීම | ඇඹිලිපිටිය සහ කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල වෙසෙන 40,000 ක ජනතාවක් සඳහා බෝග තීව්‍රතාවය සහ පානීය ජල පහසුකම් වැඩිදියුණු කිරීම. |
| 7. අවම කාර්ය මණ්ඩල අවශ්‍යතාවය | ව්‍යාපෘති කළමනාකරණ ඒකක (PMU) නැත |
| 8. පිරිවැය ධාවක/ ඒකක පිරිවැය/ වියදම් අඩුකිරීම | ශ්‍රමය, යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය |
| 9. අවම සම්පත් අවශ්‍යතා/ පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය | 2023 අයවැය යටතේ රුපියල් මිලියන 250 ක් වෙන් කර ඇත |
| 10 ප්‍රධාන කාර්ය සාධන දර්ශක | සොරොව්ව ඉදිකිරීමේ කටයුතු නිම කිරීම සහ කැණීම් ආරක්ෂා කිරීම |
| 11, ප්‍රතිසංස්කරණ/ යෝජනා/ නිර්දේශ | • ලබා දී ඇති රු. මිලියන 100ක ප්‍රතිපාදන භාවිත කරමින් මෙම කායීය අර්ධ වශයෙන් නිම කරන ලෙසට නිර්දේශ කෙරේ.<br>• තාවකාලිකව වැඩ නැවැත්වීම |
| 12. වෙනත්; RAMP තීරණ | දැනට පවතින අවදානම් සහිතව අර්ධ වශයෙන් නිම කරන ලද සොරොව්වේ සහ වේල්ලේ ඉදිකිරීම් කටයුතු නතර කළ නොහැකි බැවින් අනෙකුත් කටයුතු පසුව ආරම්භ කරමින් එම වැඩ අයිතම 02 පමණක් නිම කිරීමට ප්‍රමුඛත්වය ලබා දී ව්‍යාපෘතිය තාවකාලිකව නතර කළ යුතුය. |

| **ඇගයීම් ප්‍රතිඵල** | කාණ්ඩය | කාණ්ඩ අතර ප්‍රමුඛතාවය ලබා දීම |
|---|---|---|
| | **Ii** | **මධ්‍යම ප්‍රමුඛතාවයක් සහිත සළකුණු කරන ලද්දකි** |

# Ellewewa Reservoir Project




**SR අංක 3.** හිඹිලියාකඩ වාරි යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය

| | |
|---|---|
| 2. අරමුණු, දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ලබා දුන් දායකත්වය | • දැනට පවතින ඉඩම් අක්කර 1,300 කට සහ නව ඉඩම් අක්කර 1,010 කට වාරි පහසුකම් සැපයීම.<br>• දැනට පවතින ඉඩම්වල වර්තමාන බෝග තීව්‍රතාවය 1.0 සිට 2.0 දක්වා වැඩි කිරීමට බලාපොරොත්තු වේ (කන්න දෙකෙහිම වගා කිරීමෙන්)<br>• ගොවි ප්‍රජාවගේ ගෘහ අවශ්‍යතා සඳහා සෑම නව වැවකින්ම ඝන මීටර මිලියන 1කට ජලය සැපයීම. |
| 3. ද්විකරණය/ නාස්තිය/ වැදගත්කම | ව්‍යාපෘතිය නිසි අධ්‍යයනයකින් තොරව භාර ගෙන ඇති අතර වගා ප්‍රදේශය පුළුල් කිරීම වනාන්තරයේ මායිමේ පිහිටා ඇත.<br>ආයෝජන මත ලැබෙන ආර්ථික ප්‍රතිලාභය පිළිබඳව අවිනිශ්චිතය |
| 4. ව්‍යාපෘති තුළ ප්‍රමුඛත්වය ලබා දීම | අඩු ප්‍රමුඛතාවයෙන් යුතු ය.<br>දැනට අර්ධ වශයෙන් ඉදිකර ඇත |
| 5. සලකුණු කළ ව්‍යාපෘති 3 අතරට ඇතුළත් කිරීමේ යෝග්‍යතාවය | - |
| 6. ඔවුන්ට ව්‍යාපෘතිය ලබා දීම සාධාරණීකරණය කිරීම | අස්වැන්න වැඩි දියුණු කිරීම |
| 7. අවම කාර්ය මණ්ඩල අවශ්‍යතාවය | ව්‍යාපෘති කළමනාකරණ ඒකක (PMU) නොමැත |
| 8. පිරිවැය ධාවක/ ඒකක පිරිවැය/ වියදම් අඩුකිරීම | ශ්‍රමය, යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය |
| 9. අවම සම්පත් අවශ්‍යතා/ පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය | 2023 අයවැය සඳහා රුපියල් මිලියන 250 ක් වෙන් කර ඇත |
| 10 ප්‍රධාන කාර්ය සාධන දර්ශක | |
| 11, ප්‍රතිසංස්කරණ/ යෝජනා/ නිර්දේශ | ඉවත් කර තිබූ වැටි සම්පූර්ණ කර හිඹිලියාකඩ වැවේ බාදනය වන කොටස සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සම්පූර්ණ කිරීම<br>යෝජිත වත්තේගෙදර වැවේ හර අගලේ හුණු බදාම කැවීම (grouting) අවසන් කර ඇති කොටස නැවත පිරවීම සහ ව්‍යාපෘතිය අවසන් කිරීම. |
| 12. වෙනත්; RAMP තීරණ | වත්තේගෙදර වේල්ලේ සොරොව්ව ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම සහ ව්‍යාපෘතියේ අනෙකුත් කටයුතු තාවකාලිකව අත්හිටුවීම. |

| **ඇගයීම් ප්‍රතිඵල** | වර්ගය | කාණ්ඩය අතර ප්‍රමුඛත්වය |
|---|---|---|
| | **Ii** | **අඩු ප්‍රමුඛතාවය** |


## Himbiliyakada Irrigation Infrastructure Development Project



**SR** අංක **4.** උමා ඔය පහළ සංවර්ධන ව්‍යාපෘතිය

| | |
|---|---|
| 2. අරමුණු, දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ලබා දුන් දායකත්වය | • උමා ඔයේ ඉහළ ජල පෝෂක ප්‍රදේශයෙන් වාර්ෂිකව ලැබෙන ඝන මීටර මිලියන 150ක ජල ස්කන්ධය ප්‍රධාන වැව් සහ ග්‍රාමීය වැව් හරහා කිරිඳි ඔය ද්‍රෝණියේ අක්කර 10,000 ක වගා ප්‍රදේශය සහ අලුතින් හඳුනාගත් අක්කර 11,000 ක වගා ප්‍රදේශය පුරා බෙදා හැරීම.<br>• ගෘහස්ත භාවිතය සඳහා ජලය ඝන මීටර මිලියන 5ක් ලබා දීම |
| 3. ද්විකරණය/ නාස්තිය/ වැදගත්කම | අදාළ නොවේ |
| 4. ව්‍යාපෘති තුළ ප්‍රමුඛත්වය ලබා දීම | ඉහළ ප්‍රමුඛත්වය<br>උමා ඔය ව්‍යාපෘතිය යටතේ ජල ප්‍රවාහය හැරවීම ආරම්භ කිරීමත් සමඟ උමා ඔයෙන් හරවා යවන ලද ජලය උපයෝජනය කිරීම. |
| 5. සලකුණු කළ ව්‍යාපෘති 3 අතරට ඇතුළත් කිරීමේ යෝග්‍යතාවය | ප්‍රමුඛ ව්‍යාපෘතියකි |
| 6. ඔවුන්ට ව්‍යාපෘතිය ලබා දීම සාධාරණීකරණය කිරීම | දැනට පවතින ප්‍රදේශයේ බෝග තීව්‍රතාවය ඉහළ නැංවීම සහ නව සංවර්ධනයන් සිදු කිරීම |
| 7. අවම කාර්ය මණ්ඩල අවශ්‍යතාවය | උමා ඔය හැරවුම් ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් අනුමත කර නොමැත |
| 8. පිරිවැය ධාවක/ ඒකක පිරිවැය/ වියදම් අඩුකිරීම | ශ්‍රමය, යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය |
| 9. අවම සම්පත් අවශ්‍යතා/ පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය | අත්‍යවශ්‍ය වැඩ නිම කිරීම සඳහා රුපියල් මිලියන 3,320 (2023 අයවැයෙන් රු. මිලියන 2,320 + අතිරේක ප්‍රතිපාදන රු. මිලියන 1,000)<br>ප්‍රතිලාභ නැංවීම සඳහා නව සංවර්ධන යටතේ වගා ප්‍රදේශවල කාර්යක්ෂම ජල පරිහරණය. |
| 10 ප්‍රධාන කාර්ය සාධන දර්ශක | • අලිකොටආර ඇළ යටතේ වාරි ජලය සැපයිය හැකි ප්‍රදේශය අක්කර 500 කින් වැඩි කිරීම<br>• සිංහලයාගම ඇළ යටතේ වාරි ජලය සැපයිය හැකි ප්‍රදේශය අක්කර 1500 කින් වැඩි කිරීම<br>හඳපානාගල වම් ඉවුරු ප්‍රධාන ඇළ මාර්ගය යටතේ වාරි ජලය සැපයිය හැකි අක්කර 2,500 ක වපසරිය වැඩි කිරීම |
| 11, ප්‍රතිසංස්කරණ/ යෝජනා/ නිර්දේශ | • උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට අත්‍යවශ්‍ය ක්‍රියාකාරකම් සඳහා 2024 අයවැය යටතේ රුපියල් මිලියන 1,000 ක මූල්‍ය ප්‍රතිපාදන සැලසීම සහ එම වර්ෂය තුළම ව්‍යාපෘතිය අවසන් කිරීම. අලිකොට ආර, සිංහලයාගම, හඳපානාගල ඇළ මාර්ග |
| 12. වෙනත්; RAMP තීරණ | මේ වන විටත් නැවත පදිංචි කිරීමේ කටයුතු සිදු කෙරෙන බැවින් අලිකොට ආර ජලාශයේ සිට කුඩාඔය දක්වා වූ අන්තර් ජලාශ ඇළ මාර්ග ඉදිකිරීමට පමණක් ප්‍රමුඛත්වය ලබා දිය යුතු අතර කුඩා වාරිමාර්ග සංවර්ධනය වැනි කරුණු පසුව ක්‍රියාත්මක කළ යුතුය. |
| **ඇගයීම් ප්‍රතිඵල** | කාණ්ඩය **Iv** — කාණ්ඩය අතර ප්‍රමුඛත්වය **ඉහළ ප්‍රමුඛතාවයක් සහිත සලකුණු කරන ලද ව්‍යාපෘතියකි** |


# Uma Oya Downstream Development Project



**SR** අංක **5.** යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය

| | |
|---|---|
| 2. අරමුණු, දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ලබා දුන් දායකත්වය | • හිඟ ජලය සැපයීම සඳහා පවතින වාරිමාර්ග වැඩිදියුණු කිරීම<br>• බෝග තීව්‍රතාවය වැඩි වීම<br>• නව වාරි ප්‍රදේශයක් සංවර්ධනය කිරීම (හෙක්ටයාර 1,515)<br>• අනුරාධපුර සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල ඝන මීටර මිලියන 24 ක් වන පානීය ජල ඉල්ලුම සපුරාලීම |
| 3. ද්විකරණය/ නාස්තිය/ වැදගත්කම | අදාළ නොවේ |
| 4. ව්‍යාපෘති තුළ ප්‍රමුඛත්වය ලබා දීම | ඉහළ ප්‍රමුඛතාවය<br>ඉංජිනේරු ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) කොන්ත්‍රාත්කරු වෙත රඳවා ගත් මුදල් ගෙවීම<br>• යාන්ඔය ජලාශය සහ යාන්ඔය වම් ඉවුර ප්‍රධාන ඇළ යටතේ වන්දි ගෙවීම<br>• ඉස්සන්වැව යටතේ අවතැන් වූ ප්‍රජාව පදිංචි කිරීම් කටයුතු අවසන් කිරීම |
| 5. සලකුණු කළ ව්‍යාපෘති 3 අතරට ඇතුළත් කිරීමේ යෝග්‍යතාවය | - |
| 6. ඔවුන්ට ව්‍යාපෘතිය ලබා දීම සාධාරණීකරණය කිරීම | දැනට පවතින ප්‍රදේශයේ බෝග තීව්‍රතාවය වැඩි දියුණු කිරීම සහ නව සංවර්ධන කටයුතු සිදු කිරීම<br>යාන්ඔය ව්‍යාපෘතිය හේතුවෙන් අවතැන් වූ ප්‍රජාව පදිංචි කිරීම |
| 7. අවම කාර්ය මණ්ඩල අවශ්‍යතාවය | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (PMU) නොමැත |
| 8. පිරිවැය ධාවක/ ඒකක පිරිවැය/ වියදම් අඩුකිරීම | මාර්ග ඉදිකිරීමට අවශ්‍ය ශ්‍රමය, යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය. |
| 9. අවම සම්පත් අවශ්‍යතා/ පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය | රුපියල් මිලියන 5,500 (2023 අයවැයෙන් රු. මිලියන 3,500 + අත්‍යවශ්‍ය කටයුතු නිම කිරීම සඳහා රු. මිලියන 2,000)<br>ප්‍රතිලාභ වැඩි කර ගැනීම සඳහා නව සංවර්ධන යටතේ වගා ප්‍රදේශවල කාර්යක්ෂම ජල උපයෝජනය හඳුන්වා දීම |
| 10 ප්‍රධාන කාර්ය සාධන දර්ශක | • ඉස්සන් වැව යටතේ අක්කර 600ක නව කුඹුරු ඉඩම් සංවර්ධනය කෙරේ.<br>• ජයන්ති වැව යටතේ දැනට පවතින කුඹුරු 6,500 ක බෝග තීව්‍රතාවය වැඩි කෙරේ.<br>• දකුණු ඉවුරු ප්‍රධාන ඇළ මාර්ගයේ වැව් 7ක් යටතේ දැනට ජලය සැපයිය හැකි අක්කර 1,000 ක බෝග තීව්‍රතාවය වැඩි කෙරේ. |
| 11, ප්‍රතිසංස්කරණ/ යෝජනා/ නිර්දේශ | ඉස්සන් වැව සංවර්ධන කටයුතු අවසන් කිරීම, වන්දි ගෙවීම, රඳවා ගත් මුදල් ගෙවීම, වනජීවී සංරක්ෂණ කටයුතු හා නැවත වගා කිරීමේ කටයුතු සිදු කිරීම සහ ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවීම |
| 12. වෙනත්; RAMP තීරණ | ඉස්සන් වැව සංවර්ධන කටයුතු සඳහා පමණක් ප්‍රමුඛත්වය ලබාදී එහි ඉදිකිරීම් අවසන් කිරීම සහ අනෙකුත් කටයුතු තාවකාලිකව අත්හිටුවමින් අදාළ පවුල් කඩිනමින් නැවත පදිංචි කරවීම. |
| **ඇගයීම් ප්‍රතිඵල** | කාණ්ඩ **Ii**     කාණ්ඩය අතර ප්‍රමුඛත්වය **ඉහළ ප්‍රමුඛතාවය** |

# Yan Oya Reservoir Project







**SR** අංක **6.** ගිං, නිල්වලා, කැලණි සහ කළු ගං ද්‍රෝණියේ ගංවතුර අවම කිරීමේ ව්‍යාපෘතිය.

| | | |
|---|---|---|
| 2. අරමුණු, දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ලබා දුන් දායකත්වය | ගංවතුර තර්ජනය අවම කිරීම සහ ගිං, නිල්වලා, කළු සහ කැලණි ගංගා ද්‍රෝණි ආශ්‍රිත ඇළ, වේලි සහ ව්‍යුහයන් ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීම. | |
| 3. ද්විකරණය/ නාස්තිය/ වැදගත්කම | අදාළ නොවේ | |
| 4. ව්‍යාපෘති තුළ ප්‍රමුඛත්වය ලබා දීම | ඉහළ ප්‍රමුඛතාවය<br>ආපදා අවදානම් අවම කිරීම සඳහා කැලණි ගං ද්‍රෝණිය ආශ්‍රිත ඉදිකිරීම්වලට ප්‍රමුඛත්වය ලබා දෙමින් දැනටමත් ආරම්භ කර ඇති කටයුතු අවසන් කිරීම. | |
| 5. සලකුණු කළ ව්‍යාපෘති 3 අතරට ඇතුළත් කිරීමේ යෝග්‍යතාවය | - | |
| 6. ඔවුන්ට ව්‍යාපෘතිය ලබා දීම සාධාරණීකරණය කිරීම | අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ගේ ආපදා අවදානම අඩු කිරීම | |
| 7. අවම කාර්ය මණ්ඩල අවශ්‍යතාවය | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (PMU) නොමැත | |
| 8. පිරිවැය ධාවක/ ඒකක පිරිවැය/ වියදම් අඩුකිරීම | ශ්‍රමය, යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය<br>ගංවතුර සඳහා වෙන් කළ ප්‍රදේශ ජනාවාස නොමැතිව පවත්වාගෙන යාම | |
| 9. අවම සම්පත් අවශ්‍යතා/ පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය | රුපියල් මිලියන 100 (පවත්නා අයවැය ප්‍රතිපාදන තුළ අවශ්‍ය වැඩ නිම කළ හැකිය.) | |
| 10 ප්‍රධාන කාර්ය සාධන දර්ශක | • ගිං, නිල්වලා, කළු සහ කැලණි ගංගා ද්‍රෝණිවල ස්වභාවික ගංවතුර අවදානම අවම කිරීම. | |
| 11, ප්‍රතිසංස්කරණ/ යෝජනා/ නිර්දේශ | • කැලණි ගංගා ද්‍රෝණිය ආශ්‍රිත කටයුතුවලට ප්‍රමුඛත්වය ලබා දෙමින් දැනටමත් ආරම්භ කර ඇති සංවර්ධන කටයුතු අවසන් කිරීමෙන් පසු ව්‍යාපෘතිය අවසන් කිරීම.<br>• හදිසි ආපදා අවම කිරීමේ වැය විෂයෙන් අරමුදල් සපයා ගැනීම | |
| 12. වෙනත්; RAMP තීරණ | කැලණි ගඟ ආශ්‍රිත ඉදිකිරීම්වලට පමණක් ප්‍රමුඛත්වය ලබා දෙමින් ඉදිරි වර්ෂයේදී ව්‍යාපෘතිය අවසන් කළ යුතුයි. තවද, අවශ්‍ය අවස්ථාවලදී වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ පවතින හදිසි ආපදා වැය විෂයෙන් ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | |
| **ඇගයීම් ප්‍රතිඵල** | කාණ්ඩය<br>**ii** | කාණ්ඩය අතර ප්‍රමුඛත්වය<br>**ඉහළ ප්‍රමුඛතාවය** |

**SR අංක 7:** මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය

| | |
|---|---|
| 2. අරමුණු, දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ලබා දුන් දායකත්වය | ● මාදුරු ඔය දකුණු ඉවුර යටතේ වගා බිම් ප්‍රමාණය වැඩි කිරීම<br>● දිනකට පානීය ජලය ලීටර් 10,000ක් සැපයීම.<br>● පවුල් 5,500ක් පදිංචි කිරීම. |
| 3. ද්විකරණය/ නාස්තිය/ වැදගත්කම | NDK ජලාශය දැනටමත් ඒ යටතේ සිදු වීමට නියමිත පහළ නිම්න සංවර්ධනය අපේක්ෂාවෙන් පවතී. කෙසේ වෙතත්, ඇළ මාර්ගය NDK ජලාශයෙන් ඔබ්බට දිගු කිරීමට සැලසුම් කර ඇත. |
| 4. ව්‍යාපෘති තුළ ප්‍රමුඛත්වය ලබා දීම | මධ්‍යම<br>රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව හඳුන්වාදීම සලකා බැලීම |
| 5. සලකුණු කළ ව්‍යාපෘති 3 අතරට ඇතුළත් කිරීමේ යෝග්‍යතාවය | - |
| 6. ඔවුන්ට ව්‍යාපෘතිය ලබා දීම සාධාරණීකරණය කිරීම | මාදුරුඔය ජලාශයේ ජලය ඵලදායී ලෙස උපයෝජනය කිරීම |
| 7. අවම කාර්ය මණ්ඩල අවශ්‍යතාවය | අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ව්‍යාපෘති කළමනාකරණ ඒකක කමිටුව විසින් ලබා දී ඇති උපදෙස් අනුව අවශ්‍ය කාර්ය මණ්ඩලය සමාලෝචනය කෙරේ |
| 8. පිරිවැය ධාවක/ ඒකක පිරිවැය/ වියදම් අඩුකිරීම | ශ්‍රමය, යන්ත්‍රෝපකරණ, අවශ්‍ය ද්‍රව්‍ය |
| 9. අවම සම්පත් අවශ්‍යතා/ පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය | රුපියල් මිලියන 950 (2023 අයවැයෙන් රු. මිලියන 650 + අතිරේක ප්‍රතිපාදන රු. මිලියන 300).<br>● ප්‍රධාන ඇළ ඉදිකිරීම සඳහා පමණි - පහළ සංවර්ධනයක් නොමැති නම් මෙම ව්‍යාපෘතියේ පිරිවැය ඵලදායීතාවය ඉතා අඩුය. |
| 10 ප්‍රධාන කාර්ය සාධන දර්ශක | ● රාජ්‍ය-පෞද්ගලික හවුල් ව්‍යාපාර හඳුන්වාදීමත් සමඟ අක්කර 237ක් අලුතින් වගා කිරීම |
| 11, ප්‍රතිසංස්කරණ/ යෝජනා/ නිර්දේශ | ● මාදුරුඔය දකුණු ඉවුර ප්‍රධාන ඇළ කිනානි හරස් මාර්ගය දක්වා (කි.මී. 6+500 සිට කි.මී. 9+173 දක්වා) ඉදි කිරීම<br>● රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්වයක් යටතේ (ආයෝජන ආකෘතියක් යටතේ) මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම නිර්දේශ කෙරේ. |
| 12. වෙනත්; RAMP තීරණ | මහජනතාවට සිදුවන අපහසුතා අවම වන පරිදි අර්ධ වශයෙන් නිම කරන ලද කටයුතු අවසන් කිරීමට අවශ්‍ය වියදම් ඇතුළුව අදියර වශයෙන් ක්‍රියාත්මක කළ හැකි වැඩපිළිවෙළක් වහාම කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය. |
| **ඇගයීම ප්‍රතිඵල** | කාණ්ඩය: **Iii** — කාණ්ඩය අතර ප්‍රමුඛත්වය: **මධ්‍යම ප්‍රමුඛතාවය** |

# Maduru Oya Right Bank Development Project






**SR අංක 8.** කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතිය

| | |
|---|---|
| 2. අරමුණු, දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ලබා දුන් දායකත්වය | • වැලිඔය ප්‍රදේශයේ අක්කර අඩි 45,000 ක ජලාශයක් ඉදි කිරීම සහ හෙක්ටයාර් 2,400 කට වාරි ජලය සැපයීම. |
| 3. ද්විකරණය/ නාස්තිය/ වැදගත්කම | ව්‍යාපෘතිය සාර්ථක කරගැනීම සඳහා විශේෂයෙන් වෙනස් වන දේශගුණය යටතේ ජලය ලබා ගැනීම අවිනිශ්චිතය. |
| 4. ව්‍යාපෘති තුළ ප්‍රමුඛත්වය ලබා දීම | මධ්‍යම<br>ආයෝජනයෙන් සතුටුදායක ප්‍රතිලාභයක් ලැබේ දැයි අවිනිශ්චිත. |
| 5. සලකුණු කළ ව්‍යාපෘති 3 අතරට ඇතුළත් කිරීමේ යෝග්‍යතාවය | - |
| 6. ඔවුන්ට ව්‍යාපෘතිය ලබා දීම සාධාරණීකරණය කිරීම | යුධ සමයේදී ඇතිවූ අවතැන්වීම් හේතුවෙන් පදිංචි කරන ලද පවුල්වල ජීවනෝපාය සඳහා සහයෝගය දැක්වීම |
| 7. අවම කාර්ය මණ්ඩල අවශ්‍යතාවය | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (PMU) නොමැත. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්ය මණ්ඩලය |
| 8. පිරිවැය ධාවක/ ඒකක පිරිවැය/ වියදම් අඩුකිරීම | ශ්‍රමය, යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය |
| 9. අවම සම්පත් අවශ්‍යතා/ පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය | පවතින අයවැය ප්‍රතිපාදන (රු. මිලියන 100) තුළ අවශ්‍ය කාර්‍යය නිම කළ හැකිය.<br>• වැලිඇල අමුණ සිට කිරිඉබ්බන් වැව ඇළ දක්වා වන කටයුතු නිම කිරීම සඳහා පමණි |
| 10 ප්‍රධාන කාර්ය සාධන දර්ශක | • කිරිඉබ්බන් වැවේ බෝග තීව්‍රතාවය වැඩි කිරීම |
| 11, ප්‍රතිසංස්කරණ/ යෝජනා/ නිර්දේශ | • ජලාශයේ ශක්‍යතාවය සහ දැවැන්ත ආයෝජනයක ආර්ථික ප්‍රතිලාභ නැවත විශ්ලේෂණය කිරීම<br>• ඇල ඉදිකිරීමෙන් පසු ව්‍යාපෘතිය අත්හිටුවීම<br>• රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්වයක් යටතේ (ආයෝජන ආකෘතියක් යටතේ) මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කමිටුව විසින් නිර්දේශ කරන ලදී.<br>• ජලය පවතින ප්‍රදේශයන්හි (උදා: මාදුරුඔය දකුණු ඉවුර) ජනතාව නැවත පදිංචි කිරීම විමර්ශනය කිරීම. |
| 12. වෙනත්; RAMP තීරණ | මෙම ව්‍යාපෘතියේ විෂය පථය වන්නේ කිරිඉබ්බන් ආර දක්වා පෝෂක ඇල (මෝඩ ඇළ) නිම කිරීමට පමණක් අවශ්‍ය කාර්ය මණ්ඩලය දක්වා අඩු කර සංශෝධිත සැලැස්ම වහාම කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමයි. |

| **ඇගයීම් ප්‍රතිඵල** | කාණ්ඩය | කාණ්ඩය අතර ප්‍රමුඛත්වය |
|---|---|---|
| | **Iii** | **මධ්‍යම ප්‍රමුඛතාවය** |

# Kivul Oya Reservoir Project





*Fig 6.1: Project Map of Kivul Oya Reservoir Project*


## SR No.9: ඒකාබද්ධ ජල පෝෂක සහ ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)

| | |
|---|---|
| 2. අරමුණු, දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ලබා දුන් දායකත්වය | • ජල පෝෂක සහ ජල සම්පත් සැලසුම්කරණය වැඩිදියුණු කිරීම සහ ජල සම්පත් යටිතල පහසුකම්වල (වේලි, ආරක්ෂාව සහ බෙදාහැරීමේ ජාල) කාර්යසාධනය ඉහළ නැංවීම |
| 3. ද්විකරණය/ නාස්තිය/ වැදගත්කම | ව්‍යාපෘතියේ කටයුතුවලින් පසුව ජලවිද්‍යා කාලගුණික දත්ත තොරතුරු පද්ධති (HMIS) ස්ථාපිත මධ්‍යස්ථාන නඩත්තු කිරීම පිළිබඳව සොයා බැලිය යුතුය.<br>සැලසුම් කළ ක්‍රියාකාරකම්වල ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් ඉහළ පිරිවැයකට හේතු වේ |
| 4. ව්‍යාපෘති තුළ ප්‍රමුඛත්වය ලබා දීම | ඉහළ ප්‍රමුඛතාවයක් සහිතය.<br>ලෝක බැංකු ණය ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතී |
| 5. සලකුණු කළ ව්‍යාපෘති 3 අතරට ඇතුළත් කිරීමේ යෝග්‍යතාවය | - |
| 6. ඔවුන්ට ව්‍යාපෘතිය ලබා දීම සාධාරණීකරණය කිරීම | වේල්ලේ සහ ව්‍යුහවල ආරක්ෂාව සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග, ද්‍රෝණිවල ඒකාබද්ධ ජල කළමනාකරණය, විසිරුණු ගබඩා පහසුකම් සංවර්ධනය |
| 7. අවම කාර්ය මණ්ඩල අවශ්‍යතාවය | සංශෝධිත සේවක සංඛ්‍යාව සඳහා අනුමැතිය ලැබී ඇත. |
| 8. පිරිවැය ධාවක/ ඒකක පිරිවැය/ වියදම් අඩුකිරීම | ශ්‍රමය, යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය |
| 9. අවම සම්පත් අවශ්‍යතා/ පිරිවැය- ප්‍රතිලාභ විශ්ලේෂණය | • මෙම වසරේ රු. මිලියන 3,000 + 2024 අයවැය යටතේ රු. මිලියන 4,000 අවශ්‍ය වේ.<br>• RAMP තීරණයට අනුව, ප්‍රමුඛතා ක්‍රියාකාරකම් පමණක් හඳුනාගෙන සංශෝධිත යෝජනාවක් ඉදිරිපත් කර ඇත. |
| 10 ප්‍රධාන කාර්ය සාධන දර්ශක | • අවම වශයෙන් 50%ක කාන්තා සාමාජිකයින් සහ නායකත්වය හා තීරණ ගැනීමේ භූමිකාවන්හි කාන්තාවන් දෙදෙනෙකු හෝ නිරතව සිටින ජලධාරා කළමනාකරණ කමිටු: 150ක් වන මුලු ගණනින් 20ක්.<br>• භූගත ජල කළමනාකරණය පිළිබඳ වාර්ෂික වාර්තා, වාර්ෂිකව බෙදා හරින ලද: 5 න් 2යි.<br>• වැඩිදියුණු කළ යටිතල පහසුකම්වලින් සෘජුවම ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව: (204,276 න් 411).<br>• ප්‍රතිසංස්කරණය කරන ලද වේලි සංඛ්‍යාව: 18න් 1යි.<br>• ප්‍රතිසංස්කරණය කරන ලද වාරි ඇළමාර්ග ප්‍රමාණය: 15න් 1යි.<br>• භාවිතයේ ඇති සකස්කරන ලද මෙහෙයුම් හා නඩත්තු අත්පොත්, 6 න් 0යි.<br>• වේලි සඳහා සකස් කරන ලද හදිසි පෙර සූදානම් කිරීමේ සැලසුම්: 7 න් 0යි.<br>• අවම වශයෙන් 50%l කාන්තා සාමාජිකයින් සහ නායකත්වය හා තීරණ ගැනීමේ භූමිකාවන්හි කාන්තාවන් දෙදෙනෙකු හෝ නිරතව සිටින ගොවි සංවිධාන: 50න් 20යි.<br>• වේලි වල ආරක්ෂාව, පරීක්ෂා කිරීම සහ අධීක්ෂණය සඳහා මාර්ගෝපදේශ සකස් කර ඇත. (ඔව්/නැත)- නැත. |
| 11, ප්‍රතිසංස්කරණ/ යෝජනා/ නිර්දේශ | • ජලය පවතින ප්‍රදේශය (මාදුරුඔය දකුණු ඉවුර) සඳහා ලෝක බැංකුවෙන් රජයේ සංරචකයක් ලබාගැනීමේ හැකියාව සොයා බැලීමටත්, පරාක්‍රම සමුද්‍රයේ සහ ගිරිතලේ වේලිවල කාන්දුවීම් ආරක්ෂා කිරීමේ කටයුතු විමර්ශනය කිරීමටත් කමිටුව විසින් යෝජනා කරන ලදී.<br>• විෂය පථය අඩු කර වැඩ නිම කිරීම කඩිනම් කිරීම. |
| 12. වෙනත්;<br>RAMP තීරණ | විෂය පථය සංශෝධනය කර අත්‍යවශ්‍ය සහ ප්‍රමුඛතාවයෙන් යුතු ක්‍රියාකාරකම් පමණක් හඳුනාගෙන ව්‍යාපෘතිය තවදුරටත් ක්‍රියාත්මක කිරීම සහ සංශෝධිත විෂය පථයට ගැලපෙන පරිදි ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීම මගින් නව යෝජනා පිළිබඳව කමිටුව දැනුවත් කිරීම. |
| **ඇගයීම් ප්‍රතිඵල** | කාණ්ඩය<br>**iv** — කාණ්ඩය අතර ප්‍රමුඛත්වය<br>**ඉහළ ප්‍රමුඛතාවය** |

## SR අංක 10. මුන්දෙනි ආරු ගංගා ද්‍රෝණිය සංවර්ධන ව්‍යාපෘතිය

| | |
|---|---|
| 2. අරමුණු, දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ලබා දුන් දායකත්වය | • මුන්දෙනි ආරු ගංගා ද්‍රෝණියේ නව ජලාශයක් ඉදිකිරීම.<br>• මහඔය නව ජලාශයක් ඉදිකිරීම සහ අක්කර 16,000 ක නව වාරි ප්‍රදේශයකට රූගම් හා කිතුල් වැව සහ ඇළ මාර්ග පද්ධතිය ඒකාබද්ධ කිරීම. |
| 3. ද්විකරණය/ නාස්තිය/ වැදගත්කම | තාක්ෂණික, පාරිසරික සහ සමාජ-ආර්ථික ශක්‍යතා පිළිබඳ යාවත්කාලීන අධ්‍යයනයක් සිදු කර නොමැත. |
| 4. ව්‍යාපෘති තුළ ප්‍රමුඛත්වය ලබා දීම | මධ්‍යම |
| 5. සලකුණු කළ ව්‍යාපෘති 3 අතරට ඇතුළත් කිරීමේ යෝග්‍යතාවය | - |
| 6. ඔවුන්ට ව්‍යාපෘතිය ලබා දීම සාධාරණීකරණය කිරීම | වගා ප්‍රදේශය වැඩි දියුණු කිරීම |
| 7. අවම කාර්ය මණ්ඩල අවශ්‍යතාවය | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) : PD- 1, සමාජ සේවා නිලධාරී -1, ඉඩම් නිලධාරි-1, පරිසර නිලධාරි - 1, ඉංජිනේරු සහකාර- 1 |
| 8. පිරිවැය ධාවක/ ඒකක පිරිවැය/ වියදම් අඩුකිරීම | ශ්‍රමය, යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය |
| 9. අවම සම්පත් අවශ්‍යතා/ පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය | • ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය වෙතින් රුපියල් මිලියන 150 + ශ්‍රී ලංකා රජය වෙතින් රුපියල් මිලියන 10ක් + අමතර ප්‍රතිපාදන රුපියල් මිලියන 300ක මුදලක් අවශ්‍ය වී ඇත. |
| 10 ප්‍රධාන කාර්ය සාධන දර්ශක | අදාළ නැත |
| 11, ප්‍රතිසංස්කරණ/ යෝජනා/ නිර්දේශ | • ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු, මූලික සැලසුම් කටයුතු සීමා කිරීම<br>• මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සැපයීමට ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය එකඟ වනු ඇතැයි විදේශ සම්පත් දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි<br>• යාවත්කාලීන ශක්‍යතා අධ්‍යයනයක් සිදු කළ යුතුය |
| 12. වෙනත්; RAMP තීරණ | විදේශ ණය යටතේ දැනට සිදු කරගෙන යන ඉඩම් අත්පත් කර ගැනීමේ සහ වන්දි ගෙවීම්වලට අදාළ වියදම් පියවීම සඳහා ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය එකඟ වන්නේ නම්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව එවැනි තීරණයක් පිළිබඳව වාරිමාර්ග අමාත්‍යාංශය වෙත දැනුම් දිය යුතුය. |
| **ඇගයීම් ප්‍රතිඵල** | කාණ්ඩය: **ii** — කාණ්ඩය අතර ප්‍රමුඛත්වය: **මධ්‍යම** |

# Mundeni Aru River Basin Development Project




## SR අංක 11. කුඩාවිලච්චිය ජලාශය ප්‍රතිසංස්කරණය කිරීම

| | |
|---|---|
| 2. අරමුණු, දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ලබා දුන් දායකත්වය | ඔයාමඩුව ප්‍රදේශයේ යෝජිත ඖෂධ නිෂ්පාදන කලාපයට ජලය සැපයීම<br><br>ද්විතියික ප්‍රතිලාභ:<br>● මහවිලච්චිය යෝජනා ක්‍රමයේ බෝග තීව්‍රතාවය 1.57 සිට 2.0 දක්වා වැඩි කිරීම.<br>● මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 25,000ක ජනතාව වෙත පානීය ජලය සැපයීම<br>● විල්පත්තු ජාතික වනෝද්‍යානයේ වන සතුන්ට ජලය සැපයීම.<br>● මෝදරගම් ආරු ගඟට පාරිසරික ගලායාම සහතික කිරීම. |
| 3. ද්විකරණය/ නාස්තිය/ වැදගත්කම | තාක්ෂණික, පාරිසරික සහ සමාජ-ආර්ථික ශක්‍යතා පිළිබඳ යාවත්කාලීන අධ්‍යයනයක් සිදු කර නොමැත. |
| 4. ව්‍යාපෘති තුළ ප්‍රමුඛත්වය ලබා දීම | අඩු ප්‍රමුඛත්වයක් |
| 5. සලකුණු කළ ව්‍යාපෘති 3 අතරට ඇතුළත් කිරීමේ යෝග්‍යතාවය | |
| 6. ඔවුන්ට ව්‍යාපෘතිය ලබා දීම සාධාරණීකරණය කිරීම | කිසිදු ආයෝජන කලාපයක් සාක්ෂාත් කර ගෙන නොමැති බැවින් සාධාරණීකරණය කළ නොහැකිය. |
| 7. අවම කාර්ය මණ්ඩල අවශ්‍යතාවය | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (PMU) නොමැත |
| 8. පිරිවැය ධාවක/ ඒකක පිරිවැය/ වියදම් අඩුකිරීම | ශ්‍රමය, යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය |
| 9. අවම සම්පත් අවශ්‍යතා/ පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය | කිසිවක් නැත |
| 10 ප්‍රධාන කාර්ය සාධන දර්ශක | අදාළ නැත |
| 11, ප්‍රතිසංස්කරණ/ යෝජනා/ නිර්දේශ | • ඔයාමඩුව ඖෂධ නිෂ්පාදන කලාප ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවන බැවින් RAMP තීරණයට අනුව ව්‍යාපෘතිය තාවකාලිකව නවතා දැමීම.<br>• මෙම ව්‍යාපෘතිය කර්මාන්තකරුවන් සමඟ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්ව ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කළ යුතුය. |
| 12. වෙනත්; RAMP තීරණ | නව කාර්මික ජනපද ඉදිකිරීම වෙනුවට පවතින කාර්මික ජනපද පමණක් ක්‍රියාත්මක කළ යුතු බවට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇති බැවින්, ඒ අනුව, ඔයාමඩුව ඖෂධ නිෂ්පාදන කාර්මික ජනපදය ඉදිරි වසර 02 ඇතුළත ක්‍රියාත්මක වන බවට සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් තහවුරු කිරීමක් ලබා ගැනීමටත්, එසේ නොමැති නම්, මෙම ව්‍යාපෘතිය නැවැත්වීමටත් කමිටුව තීරණය කර ඇත. |

| **ඇගයීම් ප්‍රතිඵල** | කාණ්ඩය | කාණ්ඩය අතර ප්‍රමුඛත්වය |
|---|---|---|
| | v | **අඩු ප්‍රමුඛතාවය** |

# Rehabilitation of Kudawilachchiya Reservoir



## SR අංක 12. දේශගුණයට ඔරොත්තු දෙන ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (වැව්ගම් පුබුදුව)

| | |
|---|---|
| 2. අරමුණු, දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ලබා දුන් දායකත්වය | • ජල කළමනාකරණය සඳහා වූ ඒකාබද්ධ ප්‍රවේශයක් තුළින් වියළි කලාපයේ කුඩා වතු හිමියන්ගේ දේශගුණික විචල්‍යතා සහ අත්‍යන්ත සිදුවීම්වලට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම |
| 3. ද්විකරණය/ නාස්තිය/ වැදගත්කම | නැත |
| 4. ව්‍යාපෘති තුළ ප්‍රමුඛත්වය ලබා දීම | ඉහළ ප්‍රමුඛතාවයක් සහිතය.<br>හරිත දේශගුණ අරමුදල (GCF) සමඟ ඇති කරගත් කොන්ත්‍රාත් ගිවිසුම් යටතේ ක්‍රියාත්මක කර ඇත |
| 5. සලකුණු කළ ව්‍යාපෘති 3 අතරට ඇතුළත් කිරීමේ යෝග්‍යතාවය | - |
| 6. ඔවුන්ට ව්‍යාපෘතිය ලබා දීම සාධාරණීකරණය කිරීම | |
| 7. අවම කාර්ය මණ්ඩල අවශ්‍යතාවය | අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ව්‍යාපෘති කළමනාකරණ ඒකක කමිටුව විසින් ලබා දී ඇති උපදෙස් අනුව අවශ්‍ය කාර්ය මණ්ඩලය සමාලෝචනය කෙරේ |
| 8. පිරිවැය ධාවක/ ඒකක පිරිවැය/ වියදම් අඩුකිරීම | ශ්‍රමය, යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය |
| 9. අවම සම්පත් අවශ්‍යතා/ පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය | 2023 වර්ෂය සඳහා රු. මිලියන 2,930 ක් වෙන් කර ඇති අතර මෙය GCF/UNDP අරමුදල් මගින් සිදුකෙරෙන ව්‍යාපෘතියකි. |
| 10 ප්‍රධාන කාර්ය සාධන දර්ශක | • තොරතුරු සන්නිවේදන තාක්ෂණ උපකරණ ලැබී ඇති ගොවිජන සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව : 77 න් 48 (දේශීය දැනුම් කේන්ද්‍රස්ථාන ලෙස වැඩිදියුණු කිරීම සඳහා)<br>• පුහුණු ගොවීන්/ගොවි නායකයින් සංඛ්‍යාව 975න් 840 (දේශගුණික අවදානම් පිළිබඳ දැනුවත්ව සිදු කෙරෙන ජල කළමනාකරණය සම්බන්ධයෙන් ඔවුන්ගේ දැනුම වැඩි දියුණු කිරීම සඳහා)<br>• ප්‍රතිසංස්කරණය කරන ලද ග්‍රාමීය වාරි පද්ධති සංඛ්‍යාව (325න් 92)<br>• සියලුම ප්‍රතිසංස්කරණය කරන ලද වැව් ඇතුළුව - ග්‍රාමීය වාරි වැව් 454 ක ප්‍රතිසංස්කරණය කරන ලද වගා කිරීමේ වපසරියට අදාළ වැව් බෝග තීව්‍රතාවය 0.8 සිට 1.6 දක්වා වැඩි කිරීමේ මට්ටම<br>• ස්ථාපිත කර ඇති වැඩිදියුණු කරන ලද පෙරීමේ ඒකක ගණන - 16න් 12 |


| | |
|---|---|
| | • ස්ථාපිත කර ඇති ප්‍රජා මට්ටමේ ජල සැපයුම් දිගු ගණන - 12 න් 12<br>• ස්ථාපිත කර ඇති කුඩා, උසස් මට්ටමේ පෙරීමේ ඒකක සංඛ්‍යාව- 70 න් 29<br>• ස්ථාපනය කර අවසන් කරන ලද වැසි ජල රැස්කිරීමේ ටැංකි පද්ධති සංඛ්‍යාව 4,000 න් 873<br>• කෘෂිකාර්මික හා ජල කළමනාකරණ උපදේශන සේවා ලැබී ඇති ගොවිජන සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව (ගොවිජන සේවා මධ්‍යස්ථාන 69න් 69යි) |
| 11, ප්‍රතිසංස්කරණ/ යෝජනා/ නිර්දේශ | • GCF අරමුදල් සහිත ව්‍යාපෘතියක් බැවින් ව්‍යාපෘති ක්‍රියාකාරකම් දිගටම කරගෙන යාමට නිර්දේශ කර ඇත, අරමුදල් මාරු කර ඇත.<br>• සම-මූල්‍යකරණය පිළිබඳ RAMP තීරණය පිළිබඳ අවධානය ලබා දීම<br>• ප්‍රධාන කාර්ය සාධන දර්ශක හඳුනාගෙන අවසන් කිරීම කඩිනම් කිරීම |
| 12. වෙනත්;<br>RAMP තීරණ | GCF මගින් විදේශ මූල්‍යකරණයේ (සම මූල්‍යකරණය) පිරිවැය ආවරණය කිරීමේ හැකියාවක් තිබේද යන්න ගවේෂණය කිරීම |
| **ඇගයීම් ප්‍රතිඵල** | කාණ්ඩය: **iv** — කාණ්ඩය අතර ප්‍රමුඛත්වය: **ඉහළ ප්‍රමුඛත්වය** |

**SR** අංක **13.** මහවැලි ජල ආරක්ෂණ ආයෝජන ව්‍යාපෘතිය (පළමු අදියර)

| | |
|---|---|
| 2. අරමුණු, දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ලබා දුන් දායකත්වය | • මහවැලි ගංගා ද්‍රෝණියේ අතිරික්ත ජලයෙන් වාරි ජලය සහ පානීය ජලය ලබා දීම තුළින් උතුරු මැද සහ වයඹ පළාත්වල වෙසෙන ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම.<br>• කළු ගඟ - මොරගහකන්ද මාරු ඇල (KMTC), උමං මාර්ගයක් සහිත ඉහළ ඇලහැර ඇළ, මිනිපේ අමුණ එසවීම සහ වම් ඉවුර ප්‍රධාන ඇළ සහ වයඹ පළාත් ඇළ ඉදිකිරීම් යනාදිය වයඹ පළාත් ඇළ ව්‍යාපෘතිය (NWPCP) අදියර 1 යටතේ සිදු කෙරේ. |
| 3. ද්විකරණය/ නාස්තිය/ වැදගත්කම | සංරචක ගණන එකවර ආරම්භ කර ඇති අතර එම සංරචක අතර සම්බන්ධීකරණය තවමත් සිදු කර නොමැත. මෙම සංරචක එකිනෙක මත රඳා පවතින බැවින්, පිරිවැයට සාපේක්ෂ ප්‍රතිලාභය අවම වී ඇත. තවද මෙම ව්‍යාපෘතියට ඉතා ඉහළ පිරිවැයක් ඇතුළත් වන අතර එම නිසා පොලී ගෙවීම් ආදිය හේතුවෙන් නියමිත ගෙවීම් ප්‍රමාද කිරීම මඟින් තවදුරටත් පිරිවැය විචලනයන් සිදුවිය හැකිය.<br>ව්‍යාපෘතියේ කාලසීමාව සැලකිල්ලට ගනිමින් ව්‍යාපෘතිය ක්‍රමානුකූලව සැලසුම් කළේ නම් ව්‍යාපෘති පිරිවැයෙන් යම් ප්‍රමාණයක් අඩු කර ගත හැකිව තිබූ බව වැඩිදුරටත් නිරීක්ෂණය වේ. (ව්‍යාපෘතිය 2015 දී ආරම්භ කරන ලද අතර තවමත් ක්‍රියාත්මක වේ)<br>ඇළක් වෙනුවට උමගක් ඉදිකිරීම වැනි ව්‍යාපෘති සැලසුමේ තාක්ෂණික කරුණු කිහිපයක් සමාජයීය, ආර්ථික, පාරිසරික හා මූල්‍යමය වශයෙන් මූලික අදියරේදී තවදුරටත් තක්සේරු කළ හැකිව තිබූ බව කමිටුවේ අදහසයි.<br>රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුව විසින් නිරීක්ෂණය කරන ලද පරිදි, ප්‍රමාද වූ ගෙවීම් පිළිබඳ කොන්ත්‍රාත්කරුවන්ගේ ඉල්ලීම් සහ ඉහළ වටිනාකමක් ඇති බර යන්ත්‍ර සම්බන්ධ වැඩ අත්හිටුවීමෙන් සිදු වූ අපතේ යෑම් හේතුවෙන් අධික පිරිවැයක් දැරීමට සිදු වීම, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සිදු කරන ලද දුර්වල මූල්‍යමය සැලසුම් හේතුවෙන් සිදු වූවකි. |
| 4. ව්‍යාපෘති තුළ ප්‍රමුඛත්වය ලබා දීම | දැනටමත් ජාත්‍යන්තර උපදේශකයින් සහ කොන්ත්‍රාත්කරුවන් සමඟ ඇති කර ගත් බැඳීම් හේතුවෙන් ඉහළ මට්ටමක පවතී<br>• ආසියානු සංවර්ධන බැංකු ණය + ශ්‍රී ලංකා රජය මඟින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතිය |
| 5. සලකුණු කළ ව්‍යාපෘති 3 අතරට ඇතුළත් කිරීමේ යෝග්‍යතාවය | නැත |
| 6. ඔවුන්ට ව්‍යාපෘතිය ලබා දීම සාධාරණීකරණය කිරීම | අරමුදල්වල අවිනිශ්චිතතාවයන් සමඟ ව්‍යාපෘති අරමුණු අවිනිශ්චිත වුවත් දැනටමත් බැඳීම් ඇති කර ගත් ව්‍යාපෘතියකි |
| 7. අවම කාර්ය මණ්ඩල අවශ්‍යතාවය | වෙනම අමුණා ඇත |

| | |
|---|---|
| 8. පිරිවැය ධාවක/ ඒකක පිරිවැය/ වියදම් අඩුකිරීම | විදේශීය උපදේශකයින්, කොන්ත්‍රාත්කරුවන් සහ දේශීය කාර්ය මණ්ඩලය වෙත සිදු කරනු ලබන ගෙවීම්.<br><br>මෙම අදියරේ දී යකල්ලෙන් පසු හුරුළුවැවට ජලය ගෙන යාමට හැකි වඩාත් කෙටි ඇළ පමණක් ඉදිකර ව්‍යාපෘති විෂය පථය තාවකාලිකව සීමා කිරීම නිර්දේශ කෙරේ.<br>අ) දැනට පවතින ඇළහැර යෝධ ඇළ සිට මින්නේරිය, කවුඩුල්ල, කන්තලේ වැව්වලට සහ අංගමැඩිල්ලෙන් පරාක්‍රම සමුද්‍රයට ආදි හැරවීම් යටතේ,<br>ආ) බෝවතැන්නේ සහ මිනිපේ හැරවීම් යටතේ, සහ,<br>ඇ) යකල්ල සිට මහකනදරාව වැවට වෙනත් දිගු ඇළ මාර්ගයක් ඉදිකිරීම මගින් මාරු කිරීමට පෙර නව වයඹ ඇල යටතේ දැනට පවතින වගා ප්‍රදේශවල බෝග තීව්‍රතාවය වැඩි කිරීම සඳහා පහළ නිම්නවල පවත්නා ඉල්ලුම සමඟ වර්තමානයේ තත්‍ය ජල සම්පත නිරීක්ෂණය කිරීම |
| 9. අවම සම්පත් අවශ්‍යතා/ පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය | ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 160,356 (ඇමරිකානු ඩොලර් මිලියන 976)<br>(සහතික කළ මූල්‍ය ප්‍රමාණය ADB ණය: ඇමරිකානු ඩොලර් මිලියන 561), 2023 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදන, රු. මිලියන 43,000 |
| 10 ප්‍රධාන කාර්ය සාධන දර්ශක | මහවැලි ප්‍රදේශයේ B,C,D & G කලාපවල අනෙකුත් ක්ෂේත්‍ර බෝග (මිරිස්, සෝයා බෝංචි, බඩ ඉරිඟු, ළූණු) සහ බිත්තර නිෂ්පාදනය පුළුල් කිරීම (පොලිතින් ආවරණයන් සහිත උමං මාර්ග 50ක් යටතේ දෙමුහුන් මිරිස් බීජ කිලෝග්‍රෑම් 400ක්, උසස් තාක්ෂණික තත්ත්ව යටතේ වියළි මිරිස් ටොන් 200ක්, 2023 කන්නයේ ලොකු ළූණු ටොන් 2,000ක්, 2023/24 කන්නයේ දී ලොකු ළූණු බීජ කිලෝග්‍රෑම් 9,000ක්, 2023 යල කන්නයේ අක්කර 300ක් මෙට්‍රික් ටොන් වගා කිරීමෙන් බඩ ඉරිඟු 9,360ක් නිෂ්පාදනය කිරීමට සහ 2023/24 මහ කන්නයේ 4,380ක්, 2023 වර්ෂයේදී කුකුල් බිත්තර මිලියන 9ක්) |
| 11, ප්‍රතිසංස්කරණ/ යෝජනා/ නිර්දේශ | • තවම ආරම්භ කිරීමට ඇති අනෙකුත් පැකේජ තාවකාලිකව නැවැත්වීම<br>• මොරගහකන්දේ සිට ඉහළ ඇලහැර ඇළ (UEC) හරහා මාරු කිරීම සඳහා ජලය ලබා ගැනීමේ හැකියාව නැවත තක්සේරු කිරීම. තවදුරටත් ආරම්භ කිරීමට නියමිත පළමු අදියරේ සංරචක අඛණ්ඩව කර ගෙන යාමට පෙර, මොරගහකන්ද මේ වන විට වසර කිහිපයක් පුරාවට ක්‍රියාත්මක වෙමින් පවතියි.<br>• මෙම අදියරේදී හුරුළුවැවට ජලය මාරු කිරීම සඳහා ඇළ පමණක් ඉදිකිරීම සලකා බලා අනෙකුත් හැරවීම් සඳහා විශ්වසනීය ජල සම්පත් වේදැයි නිරීක්ෂණය කිරීම.<br>• මොරගහකන්ද ජලාශයේ නියාමනය කරන ලද ජලය දැනට මින්නේරිය, කන්තලේ, කවුඩුල්ල, පරාක්‍රම සමුද්‍රය ආදිය යටතේ දැනට පවතින පහළ නිම්න යෝජනා ක්‍රම සඳහා ඵලදායී ලෙස යොදා ගැනේ. |
| 12. වෙනත්; RAMP තීරණ | ඉතිරි කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට පෙර විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වහාම ආසියානු සංවර්ධන බැංකුව සමඟ සාකච්ඡා කර අවශ්‍ය අරමුදල් ලබා ගත යුතුය. මෙම කමිටුවේ තීරණය ප්‍රකාශයට පත් කිරීම සඳහා සාකච්ඡාවේ තීරණ මත පසු විපරම් සාකච්ඡාවක් ඔක්තෝබර් 15 වැනිදාට පෙර නැවත කැඳවිය යුතුය.<br>ඉදිරි කටයුතු සඳහා ඉන්ධන සහ පුපුරණ ද්‍රව්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා සංදේශයක් ඉදිරිපත් කිරීමට ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු කළ යුතුය. |
| **ඇගයීම් ප්‍රතිඵල** | කාණ්ඩය **ii** — කාණ්ඩය අතර ප්‍රමුඛත්වය **ඉහළ ප්‍රමුඛතාවය** |

# Mahaweli Water Security Investment Project (Phase I)



**SR අංක 14. දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ බහු-අදියර වැඩසටහන් ප්‍රවේශය (CRESMPA)**


| | |
|---|---|
| 2. අරමුණු, දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ලබා දුන් දායකත්වය | • දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම කාලගුණය, ගංවතුර සහ නාය යෑම් පිළිබඳ අනතුරු පුරෝකථනය කිරීම සහ දැනුවත් කිරීමේ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම මගින් ප්‍රතිලාභ ලබන පුද්ගලයින් සංඛ්‍යාව වැඩි කිරීම සහ කාලගුණික විපර්යාසවලට මුහුණ දීම සඳහා ජලය ආශ්‍රිත බහුකාර්ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම |
| 3. ද්විකරණය/ නාස්තිය/ වැදගත්කම | අවධානයට:<br>ද්විකරණය වීම වැළැක්වීම සඳහා විවිධ ආයතන විසින් දත්ත ලබා ගැනීම ඒකාබද්ධ කිරීම,<br>කාලගුණ විද්‍යාත්මක දත්ත ලබා ගැනීම සහ කාලගුණ අනාවැකි පද්ධති පවත්වාගෙන යාම |
| 4. ව්‍යාපෘති තුළ ප්‍රමුඛත්වය ලබා දීම | ඉහළ ප්‍රමුඛතාවය<br>- පෙර පැවති ව්‍යාපෘතියකින් පසු ලෝක බැංකු ණය අරමුදල් මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි |
| 5. සලකුණු කළ ව්‍යාපෘති 3 අතරට ඇතුළත් කිරීමේ යෝග්‍යතාවය | - |
| 6. ඔවුන්ට ව්‍යාපෘතිය ලබා දීම සාධාරණීකරණය කිරීම | කැලණි ද්‍රෝණියේ දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීමේ ව්‍යාපෘතියේ ක්‍රියාමාර්ග අනුගමනය කිරීම |
| 7. අවම කාර්ය මණ්ඩල අවශ්‍යතාවය | අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ව්‍යාපෘති කළමනාකරණ ඒකක කමිටුව විසින් ලබා දී ඇති උපදෙස් අනුව අවශ්‍ය කාර්ය මණ්ඩලය සමාලෝචනය කෙරේ |
| 8. පිරිවැය ධාවක/ ඒකක පිරිවැය/ වියදම් අඩුකිරීම | ශ්‍රමය, යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය |
| 9. අවම සම්පත් අවශ්‍යතා/ පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය | 2023 අයවැය + ලෝක බැංකු ණය අරමුදල් සඳහා<br>රු. මිලියන 2,025 ක් වෙන් කර ඇත |
| 10 ප්‍රධාන කාර්ය සාධන දර්ශක | • දත්ත කළමනාකරණය සහ කාලගුණය, ගංවතුර සහ නායයෑම් පිළිබඳ අනාවැකි පළ කිරීම සඳහා පොදු ඉලෙක්ට්‍රොනික පද්ධතියක් ස්ථාපිත කිරීම<br>• කාලගුණ දත්ත සමඟ පුරෝකථන හැකියාව වැඩි දියුණු කිරීම, දේශගුණික විපර්යාස ආශ්‍රිත දත්ත විශ්ලේෂණය, පුරෝකථනය කිරීම සහ උපයෝජනය පිළිබඳ පුහුණුව සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම- වාරිමාර්ග පද්ධතිවල ගංවතුර අවදානම අවම කිරීම, හදිසි නායයෑම් අවදානම අවම කිරීම.<br>• කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දැනට පවතින පද්ධති සහ ගොඩනැගිලි අවශ්‍ය සහ හදිසි නවීකරණය සහ අලුත්වැඩියා කිරීම.<br>• කැලණි ගඟේ අඹතලේ, මහ කොළඹ කලාපයේ ජල හිඟය අවම කිරීම සඳහා නිර්මාණය කර ඇති වී ඔය ජලාශයේ ලවණ බාධකය |

| | | |
|---|---|---|
| 11, ප්‍රතිසංස්කරණ/ යෝජනා/ නිර්දේශ | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම නිර්දේශ කෙරේ<br>RAMP තීරණයට අනුව, පිරිවැය අඩු කිරීම සඳහා විෂය පථය සීමා කිරීම - අත්‍යවශ්‍ය ගොඩනැගිලි යටිතල පහසුකම් සංවර්ධනය පමණක් සිදු කළ යුතුය. | |
| 12. වෙනත්; RAMP තීරණ | වත්මන් අර්බුදකාරී සන්දර්භය තුළ ව්‍යාපෘතියේ විෂය පථය අඩු කිරීම හා ප්‍රමුඛතාවයන් පිළිබඳව තීරණය කිරීම මගින් ව්‍යාපෘති ක්‍රියාකාරකම් ප්‍රතිව්‍යුහගත කිරීම. | |
| **ඇගයීම ප්‍රතිඵල** | කාණ්ඩය<br><br>**iii** | කාණ්ඩය අතර ප්‍රමුඛත්වය<br><br>**ඉහළ ප්‍රමුඛතාවය** |

## SR අංක 15. ගොඩිගමුව වැව සංවර්ධනය හා වැඩිදියුණු කිරීම

| | |
|---|---|
| 2. අරමුණු, දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ලබා දුන් දායකත්වය | • අක්කර 105ක නව කෘෂිකාර්මික ප්‍රදේශයකට සහ අක්කර 60 ක දැනට පවතින කෘෂිකාර්මික ප්‍රදේශයක් වෙත ජලය ලබා දීමෙන් බෝග තීව්‍රතාවය වැඩි කිරීම.<br>• වන සතුන්ට ජල මූලාශ්‍රයක් වෙත පහසු ප්‍රවේශයක් ලබා දීම තුළින් සෞන්දර්යාත්මක සහ විනෝදාත්මක ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම |
| 3. ද්විකරණය/ නාස්තිය/ වැදගත්කම | - |
| 4. ව්‍යාපෘති තුළ ප්‍රමුඛත්වය ලබා දීම | ඉහළ ප්‍රමුඛත්වය<br>ව්‍යාපෘතිය දැනටමත් අවසන් වීමට ආසන්නයි |
| 5. සලකුණු කළ ව්‍යාපෘති 3 අතරට ඇතුළත් කිරීමේ යෝග්‍යතාවය | |
| 6. ඔවුන්ට ව්‍යාපෘතිය ලබා දීම සාධාරණීකරණය කිරීම | • බෝග තීව්‍රතාවය වැඩි දියුණු කිරීම |
| 7. අවම කාර්ය මණ්ඩල අවශ්‍යතාවය | • ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (PMU) නොමැත |
| 8. පිරිවැය ධාවක/ ඒකක පිරිවැය/ වියදම් අඩුකිරීම | • ශ්‍රමය, යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය |
| 9. අවම සම්පත් අවශ්‍යතා/ පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය | • 2023 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදන, රු. මිලියන 35 කි. 2023 වසරේදී ව්‍යාපෘතිය නිම කිරීමට අතිරේක ප්‍රතිපාදන රු. මිලියන 130 ක් අවශ්‍ය වේ. |
| 10 ප්‍රධාන කාර්ය සාධන දර්ශක | • වාන් මාර්ගයේ සහ අමුණේ ඉතිරි කොටස සම්පූර්ණ කිරීම.<br>• පෝෂක ඇල සහ ක්ෂේත්‍ර ඇල ඉදිකිරීම |
| 11, ප්‍රතිසංස්කරණ/ යෝජනා/ නිර්දේශ | • අත්‍යවශ්‍ය සංරචක ක්‍රියාත්මක කිරීමට සහ 2023 අවසන් වන විට ව්‍යාපෘතිය කඩිනම් කිරීමට නිර්දේශ කෙරේ |
| 12. වෙනත්; RAMP තීරණ | - |
| **ඇගයීම් ප්‍රතිඵල** | කාණ්ඩය: **iii** — කාණ්ඩය අතර ප්‍රමුඛත්වය: **ඉහළ ප්‍රමුඛත්වය** |


# Development and improvement of Godigamuwa tank



## SR අංක 16. විලකණ්ඩිය ජලාශ ව්‍යාපෘතිය

| | |
|---|---|
| 2. අරමුණු, දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ලබා දුන් දායකත්වය | දැනට පවතින කුඹුරු හෙක්ටයාර 68ක වාරි පහසුකම් වැඩි දියුණු කිරීම |
| 3. ද්විකරණය/ නාස්තිය/ වැදගත්කම | - |
| 4. ව්‍යාපෘති තුළ ප්‍රමුඛත්වය ලබා දීම | ඉහළ ප්‍රමුඛත්වය<br>ව්‍යාපෘතිය දැනටමත් අවසන් වීමට ආසන්නයි |
| 5. සලකුණු කළ ව්‍යාපෘති 3 අතරට ඇතුළත් කිරීමේ යෝග්‍යතාවය | |
| 6. ඔවුන්ට ව්‍යාපෘතිය ලබා දීම සාධාරණීකරණය කිරීම | බෝග තීව්‍රතාවය වැඩි දියුණු කිරීම |
| 7. අවම කාර්ය මණ්ඩල අවශ්‍යතාවය | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (PMU) නොමැත |
| 8. පිරිවැය ධාවක/ ඒකක පිරිවැය/ වියදම් අඩුකිරීම | • ශ්‍රමය, යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය |
| 9. අවම සම්පත් අවශ්‍යතා/ පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය | 2024 වර්ෂය සඳහා ඉතිරි වැඩ නිම කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය රු. මිලියන 105කි. ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 377 ක් වේ.<br>2023 වාර්ෂික අයවැය යටතේ මෙම ව්‍යාපෘතිය සඳහා අයවැය ප්‍රතිපාදන සපයා නොමැත. එබැවින්, අවශ්‍ය වන රුපියල් මිලියන 20 ක පමණ අරමුදල් වාරිමාර්ග අමාත්‍යාංශයේ පවතින අයවැය තුළ කළමනාකරණය කිරීමට නියමිතය. |
| 10 ප්‍රධාන කාර්ය සාධන දර්ශක | විලකණ්ඩිය යෝජනා ක්‍රමයේ බෝග තීව්‍රතාවය 1 සිට 1.5 දක්වා වැඩි කෙරිණි. |
| 11, ප්‍රතිසංස්කරණ/ යෝජනා/ නිර්දේශ | • අත්‍යවශ්‍ය සංරචක ක්‍රියාත්මක කිරීමට සහ 2024 අවසන් වන විට මෙම ව්‍යාපෘතිය කඩිනම් කිරීමට නිර්දේශ කෙරේ |
| 12. වෙනත්; RAMP තීරණ | - |
| **ඇගයීම් ප්‍රතිඵල** | කාණ්ඩය: **i**<br>කාණ්ඩය අතර ප්‍රමුඛත්වය: **ඉහළ ප්‍රමුඛත්වය** |

# Wilakandiya reservoir project




**SR අංක 17. අවදානමට ලක්විය හැකි ගංගා ද්‍රෝණිවල, ජල පෝෂක ප්‍රදේශවල සහ ශ්‍රී ලංකාවේ නකල්ස් කඳුවැටියේ ජල පෝෂක ප්‍රදේශයේ පහළ ගංගාවල පදිංචි යැපුම් ගොවීන්ගේ සහ කෘෂිකාර්මික වැවිලි ප්‍රජාවන්ගේ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම.**

| | | |
|---|---|---|
| 2. අරමුණු, දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ලබා දුන් දායකත්වය | නකල්ස් කඳුවැටියේ යැපුම් ගොවීන්ගේ සහ කෘෂිකාර්මික වැවිලි ප්‍රජාවන්ගේ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම. | |
| 3. ද්විකරණය/ නාස්තිය/ වැදගත්කම | - | |
| 4. ව්‍යාපෘති තුළ ප්‍රමුඛත්වය ලබා දීම | අඩු ප්‍රමුඛතාවය<br>හරිත දේශගුණ අරමුදලින් පහසුකම් සලසනු ලබන ව්‍යාපෘතියක් අපේක්ෂිතය.<br>හරිත දේශගුණ අරමුදලෙන් ඇමරිකානු ඩොලර් මිලියන 39.7ක් සහ ශ්‍රී ලංකා රජයෙන් ඇමරිකාන් ඩොලර් මිලියන 9.2ක් | |
| 5. සලකුණු කළ ව්‍යාපෘති 3 අතරට ඇතුළත් කිරීමේ යෝග්‍යතාවය | | |
| 6. ඔවුන්ට ව්‍යාපෘතිය ලබා දීම සාධාරණීකරණය කිරීම | පාරිසරික වශයෙන් වැදගත්කමක් සහිත පරිසරයට හානියක් නොවන පරිදි හේන් වගාව වෙනුවට වගා කිරීමට ආර්ථික බෝග හඳුන්වා දීමෙන් ජනතාවගේ ජීවනෝපාය ඉහළ නැංවීම. | |
| 7. අවම කාර්ය මණ්ඩල අවශ්‍යතාවය | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (PMU) නොමැත | |
| 8. පිරිවැය ධාවක/ ඒකක පිරිවැය/ වියදම් අඩුකිරීම | • ශ්‍රමය, යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය සහ රේඛීය ආයතන ගණනාවක් සමඟ කටයුතු කිරීම | |
| 9. අවම සම්පත් අවශ්‍යතා/ පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය | රුපියල් මිලියන 1,250 යි, ව්‍යාපෘතිය ආරම්භ කර නැත, හරිත දේශගුණ අරමුදල් ලැබී නොමැත | |
| 10 ප්‍රධාන කාර්ය සාධන දර්ශක | යැපුම් ගොවීන්ගේ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම | |
| 11 ප්‍රතිසංස්කරණ/ යෝජනා/ නිර්දේශ | • හරිත දේශගුණ අරමුදල ලැබීමෙන් පසු ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කෙරේ | |
| 12. වෙනත්; RAMP තීරණ | | |
| **ඇගයීම් ප්‍රතිඵල** | කාණ්ඩය<br><br>**ii** | කාණ්ඩය අතර ප්‍රමුඛත්වය<br><br>**අඩු ප්‍රමුඛතාවයකි** |

1. **Target area**

The project mainly targets five districts of Sri Lanka. There are: Kurunegala, Puttalam, Anuradhapura, Matale, Kandy.



**SR අංක 18.** පොළොන්නරුව වාරි සංවර්ධන ව්‍යාපෘතිය


| | |
|---|---|
| 2. අරමුණු, දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ලබා දුන් දායකත්වය | අක්කර 85,000 කට වාරි ජලය සපයනු ලබන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ විවිධ වාරිමාර්ග යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම. |
| 3. ද්විකරණය/ නාස්තිය/ වැදගත්කම | - |
| 4. ව්‍යාපෘති තුළ ප්‍රමුඛත්වය ලබා දීම | ඉහළ ප්‍රමුඛත්වය<br>වාරි ඇල පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම සහ ගංවතුර අවම කිරීම |
| 5. සලකුණු කළ ව්‍යාපෘති 3 අතරට ඇතුළත් කිරීමේ යෝග්‍යතාවය | |
| 6. ඔවුන්ට ව්‍යාපෘතිය ලබා දීම සාධාරණීකරණය කිරීම | පාරිසරික වශයෙන් වැදගත්කමක් සහිත පරිසරයට හානියක් නොවන පරිදි හේන් වගාව වෙනුවට වගා කිරීමට ආර්ථික බෝග හඳුන්වා දීමෙන් ජනතාවගේ ජීවනෝපාය ඉහළ නැංවීම |
| 7. අවම කාර්ය මණ්ඩල අවශ්‍යතාවය | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (PMU) නොමැත |
| 8. පිරිවැය ධාවක/ ඒකක පිරිවැය/ වියදම් අඩුකිරීම | ශ්‍රමය, යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය |
| 9. අවම සම්පත් අවශ්‍යතා/ පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය | රු. මිලියන 200 ක මුදලක් 2023 අයවැය සඳහා වෙන් කර ඇත. |
| 10 ප්‍රධාන කාර්ය සාධන දර්ශක | වැව් බැම්ම ශක්තිමත් කිරීම සහ ආපදා අවදානම අවම කිරීම.<br>අමුණු බැම්ම කොටස ශක්තිමත් කිරීම සහ පොලොන්නරුව සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල අක්කර 94,500 ක ජල සුරක්ෂිතතාව තහවුරු කිරීම.<br>පිරවූ බැම් කොටස ශක්තිමත් කිරීම සහ පරාක්‍රම සමුද්‍ර යෝජනා ක්‍රමයෙහි (PSS) D1 ඇල මාර්ගයේ අක්කර 12,000 ක ජල කළමනාකරණය සුරක්ෂිත කිරීම.<br>දම්සෝපුර ප්‍රදේශයේ නව ඉඩම් අක්කර 1000 කට වාරි ජලය සැපයීම |
| 11, ප්‍රතිසංස්කරණ/ යෝජනා/ නිර්දේශ | • විෂය පථය අඩු කර අත්‍යාවශ්‍ය වැඩ පමණක් කරගෙන යාම. නව සංවර්ධන කටයුතු තාවකාලිකව අත්හිටුවීමට නියමිතය<br>• දැනට ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වැව් බැම්ම අලුත්වැඩියා කිරීමේ කටයුතු ගවේෂණය කිරීම<br>• වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ දිවයින පුරා පවතින වාරිමාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම සහ නඩත්තු කිරීම සඳහා වාර්ෂික අයවැයෙන් සාමූහික ආධාර මුදලක් වෙන් කළ යුතුය. |
| 12. වෙනත්;<br>RAMP තීරණ | |
| **ඇගයීම් ප්‍රතිඵල** | කාණ්ඩය<br>**i**      කාණ්ඩය අතර ප්‍රමුඛත්වය<br>**ඉහළ ප්‍රමුඛතාවය** |

SR අංක 19. කැලණි ගං බැම්ම සුරැකීමේ ව්‍යාපෘතිය

| | |
|---|---|
| 2. අරමුණු, දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ලබා දුන් දායකත්වය | කැලණිය ප්‍රදේශයේ පවුල් 15,000ක්, දේපළ, කර්මාන්ත, සේවා, වෙනත් කර්මාන්ත සඳහා පවතින ගංවතුර ආපදා අවදානම අවම කිරීම |
| 3. ද්විකරණය/ නාස්තිය/ වැදගත්කම | - |
| 4. ව්‍යාපෘති තුළ ප්‍රමුඛත්වය ලබා දීම | ඉහළ ප්‍රමුඛත්වය<br>වාරි ඇල පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම සහ ගංවතුර අවම කිරීම |
| 5. සලකුණු කළ ව්‍යාපෘති 3 අතරට ඇතුළත් කිරීමේ යෝග්‍යතාවය | |
| 6. ඔවුන්ට ව්‍යාපෘතිය ලබා දීම සාධාරණීකරණය කිරීම | කැලණි ගං ද්‍රෝණිය ගංවතුරෙන් යට වීමේ අවදානම අවම කිරීම |
| 7. අවම කාර්ය මණ්ඩල අවශ්‍යතාවය | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (PMU) නොමැත |
| 8. පිරිවැය ධාවක/ ඒකක පිරිවැය/ වියදම් අඩුකිරීම | • ශ්‍රමය, යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය |
| 9. අවම සම්පත් අවශ්‍යතා/ පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය | අත්‍යාවශ්‍ය ඉතිරි වැඩ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන රු. මිලියන 170කි<br>2023 සඳහා වෙන් කර ඇති අයවැය රු. මිලියන 1,000කි |
| 10 ප්‍රධාන කාර්ය සාධන දර්ශක | • බැම්ම වැඩිදියුණු කිරීම - පෙතියාගොඩ, සිංහාරමුල්ල, කැලණිය පන්සල් ප්‍රදේශයේ ගංවතුර අවම කිරීම.<br>• සුළු ගංවතුරෙන් ආරක්ෂාව සැලසීම හා පහළ කැලණි ද්‍රෝණියේ ගංවතුර අවම කිරීම<br>• හල්මුල්ල සහ අකරවිට ප්‍රදේශවල ගංගා ද්‍රෝණියේ ආරක්ෂාව හා ගංවතුර අවම කිරීම. |
| 11, ප්‍රතිසංස්කරණ/ යෝජනා/ නිර්දේශ | • විෂය පථය අඩු කර අත්‍යවශ්‍ය කාර්යයන් පමණක් කරගෙන යාම. |
| 12. වෙනත්; RAMP තීරණ | - |
| **ඇගයීම් ප්‍රතිඵල** | කාණ්ඩය: **i** — කාණ්ඩය අතර ප්‍රමුඛත්වය: **ඉහළ ප්‍රමුඛතාවය** |

# MFP Schemes of Kelani River Bund Protection Project

● Completed structures ● Ongoing structures



## SR අංක 20. මහගල්ගමුව වැව වැඩි දියුණු කිරීම

| | |
|---|---|
| 2. අරමුණු, දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ලබා දුන් දායකත්වය | බෝග තීව්‍රතාවය වැඩි කිරීම<br>මහගල්ගමුව යෝජනා ක්‍රමයේ අක්කර 800ක්, පලුකඩවල යෝජනා ක්‍රමයේ අක්කර 400ක් සහ ඇළ දිගේ ඇති සුළු වාරිමාර්ග යෝජනා ක්‍රම සඳහා වාරි ජලය සැපයීම. |
| 3. ද්විකරණය/ නාස්තිය/ වැදගත්කම | - |
| 4. ව්‍යාපෘති තුළ ප්‍රමුඛත්වය ලබා දීම | ඉහළ ප්‍රමුඛත්වය<br>ව්‍යාපෘතිය දැනටමත් අවසන් වීමට ආසන්නයි |
| 5. සලකුණු කළ ව්‍යාපෘති 3 අතරට ඇතුළත් කිරීමේ යෝග්‍යතාවය | |
| 6. ඔවුන්ට ව්‍යාපෘතිය ලබා දීම සාධාරණීකරණය කිරීම | බෝග තීව්‍රතාවය වැඩි දියුණු කිරීම |
| 7. අවම කාර්ය මණ්ඩල අවශ්‍යතාවය | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (PMU) නොමැත |
| 8. පිරිවැය ධාවක/ ඒකක පිරිවැය/ වියදම් අඩුකිරීම | • දෘඩ පාෂාණ කැණීම්, භූමි කැණීම්, පස් පිරවීම්<br>• ශ්‍රමය, යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය |
| 9. අවම සම්පත් අවශ්‍යතා/ පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය | ඉතිරි වැඩ සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 500කි<br>2023 අයවැය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන රු. මිලියන 100කි |
| 10 ප්‍රධාන කාර්ය සාධන දර්ශක | අක්කර 1,200 වඩා වැඩි ප්‍රදේශයක බෝග තීව්‍රතාවය වැඩි කිරීම |
| 11, ප්‍රතිසංස්කරණ/ යෝජනා/ නිර්දේශ | • අත්‍යවශ්‍ය සංරචක ක්‍රියාත්මක කිරීම සහ 2024 වසර අවසන් වන විට ව්‍යාපෘතිය කඩිනම් කිරීම නිර්දේශ කෙරේ |
| 12. වෙනත්;<br>RAMP තීරණ | - |
| **ඇගයීම් ප්‍රතිඵල** | කාණ්ඩය: **I** — කාණ්ඩය අතර ප්‍රමුඛත්වය: **ඉහළ ප්‍රමුඛතාවය** |

# Augmentation of Mahagalgamuwa Tank



**SR අංක 21.** බැරැක් ප්ලේන් වැව වැඩිදියුණු කිරීම සහ අවට ප්‍රදේශය නවීකරණය කිරීම.

| | |
|---|---|
| 2. අරමුණු, දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ලබා දුන් දායකත්වය | බෝග තීව්‍රතාවය වැඩි කිරීම<br><br>අක්කර 2005 ක ප්‍රදේශයක් වගා කිරීම සඳහා බෝඹුරුඇල්ල වාරිමාර්ග යෝජනා ක්‍රමය යටතේ අතිරේක වාරි ජල පහසුකම් සහතික කිරීම<br><br>ගෘහස්ථ හා පානීය අවශ්‍යතා සඳහා ඌව-පරණගම ප්‍රදේශයේ ගෘහස්ථ ජල යෝජනා ක්‍රමය හරහා අඛණ්ඩව ඝන මී. 3,000ක දෛනික ජල සැපයුම සහතික කිරීම |
| 3. ද්විකරණය/ නාස්තිය/ වැදගත්කම | මෙම ව්‍යාපෘතිය සිදු කිරීමේ හැකියාවක් නොමැත. බැරැක් ප්ලේන් ඇළ සඳහා ප්‍රමාණවත් ජල ප්‍රවාහයක් ඇති බව පෙන්වීමට හැකි පරිදි ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොමැත |
| 4. ව්‍යාපෘති තුළ ප්‍රමුඛත්වය ලබා දීම | අඩු ප්‍රමුඛත්වය |
| 5. සලකුණු කළ ව්‍යාපෘති 3 අතරට ඇතුළත් කිරීමේ යෝග්‍යතාවය | |
| 6. ඔවුන්ට ව්‍යාපෘතිය ලබා දීම සාධාරණීකරණය කිරීම | සාධාරණීකරණය කළ නොහැක |
| 7. අවම කාර්ය මණ්ඩල අවශ්‍යතාවය | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (PMU) නොමැත |
| 8. පිරිවැය ධාවක/ ඒකක පිරිවැය/ වියදම් අඩුකිරීම | • ශ්‍රමය, යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය |
| 9. අවම සම්පත් අවශ්‍යතා/ පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය | අත්‍යවශ්‍ය ඉතිරි වැඩ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන රු. මිලියන 150 කි. (2023 වර්ෂයේ අයවැය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන රු. මිලියන 30 කි) |
| 10 ප්‍රධාන කාර්ය සාධන දර්ශක | වැව වටා ප්‍රවේශ මාර්ගය, ජලාපවහන ප්‍රවේශ ද්වාර ඉදිකිරීම<br>වැවේ රොන්මඩ ඉවත් කිරීම |
| 11, ප්‍රතිසංස්කරණ/ යෝජනා/ නිර්දේශ | දැනටමත් ආරම්භ කර ඇති අත්‍යවශ්‍ය කටයුතු අවසන් වූ පසු ව්‍යාපෘතිය අවසන් කිරීමට කමිටුව නිර්දේශ කරයි. |
| 12. වෙනත්; RAMP තීරණ | - |

| | | |
|---|---|---|
| **ඇගයීම ප්‍රතිඵල** | කාණ්ඩය | කාණ්ඩය අතර ප්‍රමුඛත්වය |
| | **ii** | **අඩු ප්‍රමුඛතාවයකි** |


# Improvements to Barack Plane Tank and modification of surrounding area.



## SR අංක 22. පැලවත්ත උක් වගාවේ වාරිමාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම

| | |
|---|---|
| 2. අරමුණු, දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ලබා දුන් දායකත්වය | උක් නිෂ්පාදනය වැඩි කිරීමට වාරි ජලය සැපයීම.<br>ඇළ මායිම අවට කුඹුරුවලට වාරි ජලය සැපයීම |
| 3. ද්විකරණය/ නාස්තිය/ වැදගත්කම | මංකඩ සහ මීපලේ යන වැව් වල කටයුතු අවසන් කර ඇත. ප්‍රධාන ප්‍රතිලාභියා වන්නේ පැලවත්ත සීනි කර්මාන්තයයි |
| 4. ව්‍යාපෘති තුළ ප්‍රමුඛත්වය ලබා දීම | ඉහළ ප්‍රමුඛත්වය<br>ව්‍යාපෘතිය දැනටමත් අවසන් වීමට ආසන්නයි |
| 5. සලකුණු කළ ව්‍යාපෘති 3 අතරට ඇතුළත් කිරීමේ යෝග්‍යතාවය | |
| 6. ඔවුන්ට ව්‍යාපෘතිය ලබා දීම සාධාරණීකරණය කිරීම | උක් වගාව සහ කුඹුරු ඉඩම් කිහිපයක් සඳහා වාරිමාර්ග වැඩි දියුණු කිරීම |
| 7. අවම කාර්ය මණ්ඩල අවශ්‍යතාවය | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (PMU) නොමැත |
| 8. පිරිවැය ධාවක/ ඒකක පිරිවැය/ වියදම් අඩුකිරීම | • ශ්‍රමය, යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය |
| 9. අවම සම්පත් අවශ්‍යතා/ පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය | 2023 අයවැයෙන් රු මිලියන 30ක ප්‍රතිපාදනයක් වෙන් කොට ඇත (ශේෂ කටයුතු සම්පූර්ණ කිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය වන රු.මි. 143.45 ක ප්‍රතිපාදන රජය විසින් සැපයීමට නියමිතය) |
| 10 ප්‍රධාන කාර්ය සාධන දර්ශක | පැල්වත්ත උක් වගාව සඳහා වාරි ජල සුරක්ෂිතතාවය තහවුරු කිරීම |
| 11, ප්‍රතිසංස්කරණ/ යෝජනා/ නිර්දේශ | ප්‍රජාවට සෙත සලසනු ලබන තුන්මුල්ල වැවේ වාන් සහ සොරොව්වේ ඉතිරි වැඩකටයුතු සඳහා පමණක් අරමුදල් සැපයීම<br>ශේෂ වැඩ පැල්වත්ත සීනි කර්මාන්තය මඟින් ඉටු කෙරේ |
| 12. වෙනත්; RAMP තීරණ | - |
| **ඇගයීම් ප්‍රතිඵල** | කාණ්ඩය: **ii** — කාණ්ඩය අතර ප්‍රමුඛත්වය: **ඉහළ ප්‍රමුඛතාවය** |

# Development of Irrigation System of Pelawatta sugar plantation




## SR අංක 23. පහළ මල්වතු ඔය බහුකාර්ය ජලාශ ව්‍යාපෘතිය

| | |
|---|---|
| 2. අරමුණු, දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ලබා දුන් දායකත්වය | යෝධ වැව යටතේ දැනට පවතින අක්කර 32,000ක වී වගාවේ සහ අකිතමුරුප්පු යෝජනා ක්‍රමය යටතේ යල කන්නයේ වගාව ආරම්භ කිරීමෙන් බෝග තීව්‍රතාවය 1 සිට 2 දක්වා වැඩි කෙරේ.<br>දකුණු හා වම් ඉවුරු සංවර්ධනය යටතේ නව ඉඩම් අක්කර 2000 කට ආසන්න ප්‍රමාණයකට වාරි ජල පහසුකම් සැපයීම.<br>ජලය ඉතිරිකිරීමේ නවීන වාරි තාක්ෂණය (ක්ෂුද්‍ර වාරිමාර්ග) හරහා වාණිජ හා අපනයන කෘෂිකාර්මික බෝග හඳුන්වාදීම<br>අනුරාධපුර, වවුනියාව සහ මන්නාරම දිස්ත්‍රික්කවල ගෘහස්ත ජල ඉල්ලුම සපුරාලීම සඳහා ජලය ඝන මීටර් මිලියන 27ක් සැපයීම.<br>මෙගාවොට් 1 ක බලාගාරයක් හරහා වාර්ෂිකව ගිගාවොට් පැය 4.68 ක ජල විදුලියක් ජනනය කිරීම<br>පහළ මල්වතුඔය ජලාශයේ මිරිදිය ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම<br>පාරිසරික/කෘෂි සංචාරක සංවර්ධන<br>තන්තිරිමලේ ප්‍රදේශයේ නව නගර සංවර්ධන සැලැස්ම<br>සූර්ය බලශක්ති පද්ධති ස්ථාපනය කිරීම |
| 3. ද්විකරණය/ නාස්තිය/ වැදගත්කම | අදාළ නොවේ |
| 4. ව්‍යාපෘති තුළ ප්‍රමුඛත්වය ලබා දීම | ඉහළ ප්‍රමුඛතාවය<br>මෙම ව්‍යාපෘතිය වී වගාව සඳහා ඉතා යෝග්‍ය ප්‍රදේශයක ක්‍රියාත්මකව පවතී |
| 5. සලකුණු කළ ව්‍යාපෘති 3 අතරට ඇතුළත් කිරීමේ යෝග්‍යතාවය | මෙම ව්‍යාපෘතිය වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ සළකුණු කරන ලද ව්‍යාපෘතියක් ලෙස හඳුනාගත හැකිය |
| 6. ඔවුන්ට ව්‍යාපෘතිය ලබා දීම සාධාරණීකරණය කිරීම | සහල් සඳහා ඉඩම්වල ඵලදායිතාව ඉහළ මට්ටමක පවතින වියළි කලාපීය සංවර්ධනයේ ප්‍රධාන ව්‍යාපෘතියකි |
| 7. අවම කාර්ය මණ්ඩල අවශ්‍යතාවය | ව්‍යාපෘති අධ්‍යක්ෂ- 1, ගණකාධිකාරී-1 |
| 8. පිරිවැය ධාවක/ ඒකක පිරිවැය/ වියදම් අඩුකිරීම | ශ්‍රමය, යන්ත්‍රෝපකරණ, අවශ්‍ය ද්‍රව්‍ය |
| 9. අවම සම්පත් අවශ්‍යතා/ පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය | 2023 අයවැය සඳහා රුපියල් මිලියන 550ක ප්‍රතිපාදන වෙන් කිරීම<br>හරිත දේශගුණ අරමුදලෙන් (GCF) ප්‍රදාන අරමුදල් ලබා ගැනීම සඳහා වාරිමාර්ග අමාත්‍යාංශය විසින් පියවර ගනිමින් සිටී.<br>ක්‍රියාකාරකම් ක්‍රමක්‍රමයෙන් නැවැත්වීම |
| 10 ප්‍රධාන කාර්ය සාධන දර්ශක | • වැව් බැම්මේ අගල් දැනට පවතින බිම් මට්ටම දක්වා පිරවීමට නියමිත අතර ව්‍යාපෘති කටයුතු දැනට අත්හිටුවා ඇත. |
| 11, ප්‍රතිසංස්කරණ/ යෝජනා/ නිර්දේශ | • ව්‍යාපෘති ක්‍රියාකාරකම් පියවරෙන් පියවර නවත්වමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම<br>• වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ආයතනික ධාරිතාව වර්ධනය කිරීම සඳහා දේශීය වශයෙන් ඉදිකිරීම් සිදු කිරීම<br>• රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම පිළිබඳව සොයා බැලීම |

| | | |
|---|---|---|
| 12. වෙනත්;<br>RAMP තීරණ | 2023.01.25 දින කමිටුව වෙත ඉදිරිපත් කිරීම සඳහා 2023 අයවැය යටතේ වෙන් කර ඇති රුපියල් මිලියන 550ක ප්‍රතිපාදන භාවිතයෙන් ප්‍රධාන බැම්ම, පිටවාන, දකුණු ඉවුර සොරොව්ව යනාදී අත්‍යවශ්‍ය ඉදිකිරීම් සිදු කිරීම සඳහා අවසර ඉල්ලීම | |
| **ඇගයීම් ප්‍රතිඵල** | කාණ්ඩය<br><br>**Iii** | කාණ්ඩය අතර ප්‍රමුඛත්වය<br><br>**ඉහළ ප්‍රමුඛතාවයෙන් යුතු සළකුණු කරන ලද ව්‍යාපෘතියකි** |


## Lower Malwathu Oya Multipurpose Reservoir Project



SR අංක 24 කුඹුක්කන් ඔය ජලාශ සංවර්ධන ව්‍යාපෘතිය

| | |
|---|---|
| 2. අරමුණු, දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ලබා දුන් දායකත්වය | ප්‍රධාන අරමුණු:<br>● වාරි ජලය සැපයිය හැකි ප්‍රදේශය වැඩි කිරීම<br>● ගෘහස්ත ජල සැපයුම<br>වෙනත් ද්විතියික ප්‍රතිලාභ:<br>● ගංවතුර පාලනය<br>● ජල විදුලි උත්පාදනය (වසරකට ගිගා වොට් පැය 16.1)<br>● ප්‍රදේශයේ භූගත ජල මට්ටම ඉහළ නැංවීම |
| 3. ද්විකරණය/ නාස්තිය/ වැදගත්කම | රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ව්‍යාපෘතියක් ලෙස මෙය දිරිමත් කිරීම සඳහා ව්‍යාපෘති ශක්‍යතා නැවත තක්සේරු කළ යුතුය |
| 4. ව්‍යාපෘති තුළ ප්‍රමුඛත්වය ලබා දීම | අඩු ප්‍රමුඛතාවයකි |
| 5. සලකුණු කළ ව්‍යාපෘති 3 අතරට ඇතුළත් කිරීමේ යෝග්‍යතාවය | - |
| 6. ඔවුන්ට ව්‍යාපෘතිය ලබා දීම සාධාරණීකරණය කිරීම | වාරි ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා ජලාශය මගින් ජලය නියාමනය කිරීම |
| 7. අවම කාර්ය මණ්ඩල අවශ්‍යතාවය | ව්‍යාපෘති අධ්‍යක්ෂ - 1, ඉංජිනේරුවන්- 2, පරිසර විශ්ලේෂක-1, සැළසුම්කරු -1 |
| 8. පිරිවැය ධාවක/ ඒකක පිරිවැය/ වියදම් අඩුකිරීම | ශ්‍රමය, යන්ත්‍රෝපකරණ, අවශ්‍ය ද්‍රව්‍ය |
| 9. අවම සම්පත් අවශ්‍යතා/ පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය | 2023 අයවැය යටතේ රු මිලියන 300 ක් වෙන් කර ඇත<br><br>ව්‍යාපෘතිය මෙතෙක් ආරම්භ කර නොමැත. පියවරෙන් පියවර ක්‍රියාකාරකම් නැවැත්වීම සඳහා සැලසුම් කිරීම |
| 10 ප්‍රධාන කාර්ය සාධන දර්ශක | ඉඩම් අත්පත් කර ගැනීම |
| 11, ප්‍රතිසංස්කරණ/ යෝජනා/ නිර්දේශ | ● අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් පසු මෙම ව්‍යාපෘතිය රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම පිළිබඳව සොයා බැලීම<br>● ව්‍යාපෘතිය තාවකාලිකව නැවැත්වීම |
| 12. වෙනත්; RAMP තීරණ | 2023 අයවැය යටතේ මෙම ව්‍යාපෘතිය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත රුපියල් මිලියන 300ක ප්‍රතිපාදන වෙන් කර ඇත. ඒ අනුව ප්‍රධාන කටයුතු සඳහා අවශ්‍ය මූලික කටයුතු වන ඉඩම් අත්පත් කර ගැනීම සහ නැවත පදිංචි කිරීම සම්බන්ධ කාර්යයන් සහ පහළ නිම්න සංවර්ධනය සිදු කිරීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව සැලසුම් කර ඇත. ඒ සම්බන්ධයෙන් කමිටු නිර්දේශය ලබා ගැනීම සඳහා 2023.01.25 දින කමිටුව වෙත ඉදිරිපත් කිරීමට නියමිතය. |
| **ඇගයීම් ප්‍රතිඵල** | කාණ්ඩය: **v** — කාණ්ඩය අතර ප්‍රමුඛත්වය: **අඩු ප්‍රමුඛතාවයකි** |


# Kumbukkan Oya Reservoir Development Project



## SR අංක 25. දෙමටගල ජලාශ ව්‍යාපෘතිය ප්‍රතිසංස්කරණය කිරීම

| | |
|---|---|
| 2. අරමුණු, දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ලබා දුන් දායකත්වය | • බෝග තීව්‍රතාවය 0.6 සිට 1.5 දක්වා වැඩි කිරීම<br>• ව්‍යාපෘති මැදිහත්වීම් හරහා ව්‍යාපෘති ප්‍රදේශයේ (කෘෂිකාර්මික මාර්ග, වෙළඳපොළ වෙත ප්‍රවේශය ආදී) සමස්ත සංවර්ධනය සහ එමගින් ගොවීන්ගේ සමාජ-ආර්ථික තත්ත්වයන් නඟා සිටුවීම. |
| 3. ද්විකරණය/ නාස්තිය/ වැදගත්කම | අදාළ නොවේ |
| 4. ව්‍යාපෘති තුළ ප්‍රමුඛත්වය ලබා දීම | අඩු ප්‍රමුඛතාවයකි<br>ශක්‍යතා පිළිබඳව නිසි අධ්‍යයනයක් සිදු කර නොමැත<br>මෙම ව්‍යාපෘතිය මූලික අදියරේ පවතින බැවින් ඉදිරි වැඩ කටයුතු නතර කළ හැකිය |
| 5. සලකුණු කළ ව්‍යාපෘති 3 අතරට ඇතුළත් කිරීමේ යෝග්‍යතාවය | - |
| 6. ඔවුන්ට ව්‍යාපෘතිය ලබා දීම සාධාරණීකරණය කිරීම | ප්‍රදේශයේ ගොවීන්ගේ සමාජ-ආර්ථික තත්ත්වයන් |
| 7. අවම කාර්ය මණ්ඩල අවශ්‍යතාවය | |
| 8. පිරිවැය ධාවක/ ඒකක පිරිවැය/ වියදම් අඩුකිරීම | ශ්‍රමය, යන්ත්‍රෝපකරණ, අවශ්‍ය ද්‍රව්‍ය |
| 9. අවම සම්පත් අවශ්‍යතා/ පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය | රු. මිලියන 5 |
| 10 ප්‍රධාන කාර්ය සාධන දර්ශක | ඉඩම් අත්පත් කර ගැනීම |
| 11, ප්‍රතිසංස්කරණ/ යෝජනා/ නිර්දේශ | • අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් පසු ව්‍යාපෘතිය රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම පිළිබඳව සොයා බැලීම<br>• ව්‍යාපෘතිය තාවකාලිකව නැවැත්වීම |
| 12. වෙනත්; RAMP තීරණ | • ඉදිකිරීම් කටයුතු ආරම්භ නොකිරීම |
| **ඇගයීම් ප්‍රතිඵල** | කාණ්ඩය: **v**<br>කාණ්ඩය අතර ප්‍රමුඛත්වය: **අඩු ප්‍රමුඛතාවයකි** |

# Reconstruction of Dematagala Reservoir Project




## SR අංක 26. උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

| | |
|---|---|
| 2. අරමුණු, දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ලබා දුන් දායකත්වය | මොණරාගල, බදුල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල පානීය හා කාර්මික ජල අවශ්‍යතාවය වෙනුවෙන් ඝන මීටර මිලියන 39ක් ලබා දෙන අතරම ජාතික විදුලිබල පද්ධතියට වාර්ෂිකව ගිගා වොට් පැය 290 ක විදුලිබලය ජනනය කර එකතු කිරීම.<br>වාරිමාර්ග සඳහා නව ප්‍රදේශ සංවර්ධනය කිරීම හෝ වගා කළ හැකි ප්‍රදේශය වැඩි කිරීම සඳහා නව යටිතල පහසුකම් සංවර්ධනය කිරීම<br>දැනට පවතින වගා කළ හැකි ප්‍රදේශයේ බෝග තීව්‍රතාවය වැඩි කිරීම සඳහා පවතින යටිතල පහසුකම් (ගබඩා පහසුකම් වැඩි කිරීම) පුළුල් කිරීම<br>[වාරිමාර්ග සැපයුමේ විශ්වසනීයත්වය වර්ධනය කිරීම] |
| 3. ද්විකරණය/ නාස්තිය/ වැදගත්කම | - |
| 4. ව්‍යාපෘති තුළ ප්‍රමුඛත්වය ලබා දීම | ඉහළ ප්‍රමුඛතාවයකි<br>නිම කිරීමට ආසන්නයි |
| 5. සලකුණු කළ ව්‍යාපෘති 3 අතරට ඇතුළත් කිරීමේ යෝග්‍යතාවය | - |
| 6. ඔවුන්ට ව්‍යාපෘතිය ලබා දීම සාධාරණීකරණය කිරීම | |
| 7. අවම කාර්ය මණ්ඩල අවශ්‍යතාවය | ව්‍යාපෘති අධ්‍යක්ෂ - 1, ඉංජිනේරුවන්- 2, පරිසර විශ්ලේෂක -1, සැලසුම් ශිල්පීන් -1 |
| 8. පිරිවැය ධාවක/ ඒකක පිරිවැය/ වියදම් අඩුකිරීම | විදේශ උපදේශක, කොන්ත්‍රාත්කරුවන් සහ දේශීය කාර්ය මණ්ඩලය සඳහා වන පිරිවැය |
| 9. අවම සම්පත් අවශ්‍යතා/ පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය | Export Development Bank of Iran USD 50Mn,<br>GoSL USD 464 Mn<br><br>2023 අයවැය යටතේ රු. මිලියන 3,600 ක ප්‍රතිපාදන වෙන් කිරීම<br><br>ඉරාන අපනයන සංවර්ධන බැංකුව මගින් ඇ.ඩො.මි. 50,<br>ශ්‍රී ලංකා රජය විසින් ඇ.ඩො.මි. 464 |
| 10 ප්‍රධාන කාර්ය සාධන දර්ශක | |
| 11, ප්‍රතිසංස්කරණ/ යෝජනා/ නිර්දේශ | • ව්‍යාපෘතිය නිම කිරීමේ කාලය දැනටමත් වැඩි කර ඇති බැවින් වැඩ අවසන් කිරීම කඩිනම් කිරීම<br>• අමතර වියදම් අයිතම අවම කිරීම |
| 12. වෙනත්; RAMP තීරණ | 98% ක ප්‍රගතියක් ලබා ඇති මෙම ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු සඳහා අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදන සහ අරමුදල් අඛණ්ඩව ලබා දීම සහ මෙම වසර තුළ ව්‍යාපෘතිය අවසන් කර මෙගාවොට් 120 ක ජාලක විදුලි ධාරිතාවක් ජාතික විදුලිබල පද්ධතියට එක් කිරීම. |

| ඇගයීම් ප්‍රතිඵල | කාණ්ඩය | කාණ්ඩය අතර ප්‍රමුඛත්වය |
|---|---|---|
| | iv | **ඉහළ ප්‍රමුඛතාවයකි** |

# Uma Oya Multipurpose Development Project



# I. උමා ඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතිය

## a) හැඳින්වීම

උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ සැලසුමට අනුව, විදුලිය නිෂ්පාදනයෙන් පසු ජලය කියුබික් මීටර් මිලියන 145 ක් (MCM) කිරිදිඔය ද්‍රෝණියට යොමු කෙරේ. මෙම ජලය යෝජිත අලිකොටආර ජලාශයේ ගබඩා කර , යෝජිත කුඩාඔය ජලාශයට මාරු ඇලක් (කිලෝ මීටර් 23.5ක් දිග) හරහා මාරු කර අනෙක් පැත්තෙන් විශාල කිරීමට යෝජිත හඳපානාගල ජලාශයට හරවා යවනු ලැබේ. කුඩාඔය ජලාශයට පහළින් සිංහලයාගම දක්වා ඇළ මාර්ග පද්ධතිය සහ කුඩා වැව් පද්ධතිය සංවර්ධනය කිරීමට යෝජිතය.

අක්කර 14,181 කට ජලය ලබා දීමටත්, වී අස්වැන්න අක්කරයකට බුසල් 115 දක්වා වැඩි කිරීමටත්, යල සහ මහ කන්නයේ බෝග ආරක්ෂා කර ගැනීම සඳහා සහ හැකි නම් තුන්වන කන්නය වෙනත් ක්ෂේත්‍ර භෝග (OFC) සඳහා වාරි ජල සැපයුම සහතික කිරීමටත් අපේක්ෂා කෙරේ. මීට අමතරව , මොනරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි පානීය, වානිජ, කාර්මික, පාරිසරික සහ වනජීවී ජල අවශ්‍යතා සඳහා අවශ්‍ය ජලය ලබා දීමෙන් ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

## b) වත්මන් තත්ත්වය

අලිකොටආර ජලාශය සහ හඳපානාගල ජලාශය විශාල කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර කුඩාඔය ජලාශය 80% ක් අවසන් කර ඇත. අලිකොටආර සිට කුඩාඔය මාරු ඇළේ ඉදිකිරීම් කටයුතු 50% ක් පමණ අවසන් කර ඇත. පෝෂක ඇළේ ව්‍යුහ තුනක වැඩ අවසන් කර ඇති අතර ජලය නිකුත් කිරීම සිදු කරමින් පවතී. කුඩාඔය සිට සිංහලයාගම දක්වා ඇළේ (කිලෝ මීටර් 38 ක් දිග) පළමු කිලෝ මීටර් 5 කොටස සම්පූර්ණ කර ඇත. හඳපානාගල ප්‍රධාන ඇළ සාදා නිම කර ඩී ඇළවල් සාදමින් පවතී.

ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 77% ක් වන අතර මූල්‍ය ප්‍රගතිය 71% කි. ව්‍යාපෘතිය 2024 අවසන් භාගය වන විට සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ.

RAMP අනුව, අලිකොටආර සිට කුඩාඔය පෝෂක ඇළ දක්වා සම්පූර්ණ කිරීමට සහ කුඩා වැව් ආරම්භ නොකිරීමට තීරණය කරන ලදි. 2023 සඳහා පවතින අයවැය ප්‍රතිපාදන රු.මිලියන 2320 කි.

## c) සාධාරණීකරණය

ව්‍යාපෘතිය අවසන් අදියරේ පවතින අතර ලබන වසරේ මැද භාගය වන විට එහි අර්ධ ප්‍රතිලාභ ලැබෙනු ඇත. ව්‍යාපෘතිය සඳහා මෙතෙක් කර ඇති ආයෝජනයන්හි ප්‍රතිලාභ ලබන වසරේ සිට ලබා ගැනීමට හැකි වන පරිදි ඉතිරි ඉදිකිරීම් කටයුතු **හැකි ඉක්මනින්** අවසන් කළ යුතුය.

පහළ නිම්නයේ ඉදිකිරීම් කටයුතු ඉහළ නිම්නයේ ඉදිකිරීම් කටයුතු වලට සමගාමීව නිම කළ යුතු අතර එසේ නොවුවහොත් උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය වෙතින් විදුලිය උත්පාදනය කිරීමෙන් පසු නිකුත් කරන ජලය විශාල වශයෙන් අපතේ යාමක් සිදු වනු ඇත. ඇළ මාර්ග ඉදිකර අවසන් වන අතර මේ වන විටද අක්කර 500 කට ආසන්න ප්‍රමාණයකට ජලය ලබා දෙමින් පවතී. එබැවින් ඉතිරි කටයුතුද කඩිනමින් අවසන් කළ යුතුව ඇත. වර්ෂාවත් සමඟ අර්ධ වශයෙන් ඉදි කර ඇති වේල්ලට හානි සිදු වීමේ අවදානමක් ඇති විය හැකි බැවින් කුඩාඔය ජලාශයේ ඉදිකිරීම් අවසන් කළ යුතුව ඇත.

## a) නිර්දේශ

බොහෝ විට මෙම වසරේ මැද භාගයේදී උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු උමා ඔයෙන් හරවා යැවෙන ජලය ප්‍රයෝජනයට ගැනීම සඳහා, මෙම ව්‍යාපෘතිය

අඛණ්ඩව කරගෙන ගොස් එය සම්පූර්ණ කිරීම මගින් ව්‍යාපෘතියේ උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම ඉතා යෝග්‍ය බව නිර්දේශ කරනු ලැබේ.

## II. ඇල්ලේවැව ජලාශ ව්‍යාපෘතිය

### b) හැඳින්වීම

පනාමුරේ වාරි යෝජනා ක්‍රමය 1849 මඩුවන්වෙල දිසාව සමයේදී එරපෝරු ගඟ හරහා කිතලෙබොක්ක වේල්ල ද කඩිගමආර හරහා අඹගහ ඇළ වේල්ල ද ඉදිකරමින් ගොඩනගන ලදි. මෙම යෝජනා ක්‍රමය 1941 වර්ෂයේදී වර්තමාන තත්ත්වයට ප්‍රතිසංස්කරණය කරන ලද්දේ, අක්කර 1,127 දක්වා වාරි පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා අමුණු ගනනාවක් ඉදිකරමිනි.

වියළි කාලවලදී කඩිගමආර සිඳී යාමේ ප්‍රතිඵලයක් ලෙස සෑම යල මහ කන්නයේම අවසානයට වාරි ජල හිඟය සහ විරලාගල සහ පනාමුරේ ප්‍රදේශවල වෙසෙන ජනතාවට පානීය ජල හිඟයක් ඇති වේ. මෙම ගැටළුව විසඳීම සඳහා ඇල්ලේවැව ජලාශය ලෙස නම් කර ඇති ජලාශයක් කඩිගම්ආරු හරහා ඉදිකිරීමට යෝජිත ය.මෙම ජලාශය තඹලවෙල අමුණට ඉහලින් සහ අමුණු මාලාවේ මැද කොටසෙහි ඉදි කර ඇත.

මෙම ව්‍යාපෘතිය යටතේ කඩිගමආර හරහා කියුබික් මීටර් මිලියන 2.25 (MCM) ක ජලාශයක් ඉදිකිරීමට නියමිතය. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණක් වන්නේ

- දැනට පවතින ඉඩම් අක්කර 1,127 කට පහසුකම් සැලසීම සඳහා, විශේෂයෙන් යල කන්නයේ ජල හිඟයට මුහුණ දෙන, පනාමුරේ අමුණු මාලාවට ජලය ගලායාම විධිමත් කිරීම
- වෙනත් ක්ෂේත්‍ර භෝග (OFC) සඳහා නව ඉඩම් අක්කර 350 කට වාරි ජලය සැපයීම
- කොලොන්න සහ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශය තුල පුද්ගලයින් 40,000 කට පානීය ජල පහසුකම් සැපයීම සඳහා දිනකට ඝන මීටර් 7,000 ක ධාරිතාවයකින් යුත් (දැනටමත් දිනකට ඝන මීටර් 7,000 ක පිරිපහදු මධ්‍යස්ථානයක් ඉදිකර ඇත) කොලොන්න ජල සම්පාදන යෝජනා ක්‍රමයේ ජල නිස්සාරණ අවශ්‍යතාවය සපුරාලීම.

යෝජිත ජලාශයේ ජලයෙන් යට වන ප්‍රදේශය අක්කර 25.59 (හෙක්ටයාර 21.28) කි. බැම්මේ දිග මීටර් 200 ක් වන අතර උපරිම උස මීටර් 24 කි. අමාත්‍ය මණ්ඩලයෙන් අනුමත පිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 1,532 කි.පවතින තත්ත්වය සහ ඉන්ධන අර්බුධය හේතුවෙන් මිල ඇස්තමේන්තුව මිලියන 1,850 දක්වා වෙනස් වනු ඇත. සම්පූර්ණ වියදම ශ්‍රී ලංකා රජයේ අරමුදල් ලෙස භාණ්ඩාගාරයෙන් වෙන් කිරීමට නියමිතය. ඉදිකිරීම් 2021 මාර්තු මාසයේදී ආරම්භ කරන ලද අතර වසර හතරකින් නිම කිරීමට සැලසුම් කර ඇත.

### c) වත්මන් තත්ත්වය

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ඇති හුලන්දඔය ඒකක කාර්යාලයේ අලුතින් ස්ථාපිත කරන ලද ඇඹිලිපිටිය ප්‍රධාන නේවාසික ඉංජිනේරු කාර්යාලය යටතේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් 2021 මාර්තු මස ආරම්භ විය. ව්‍යාපෘතිය සඳහා ප්‍රධාන නේවාසික ඉංජිනේරුවරයාගේ ප්‍රධානත්වයෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සේවය කරන කාර්ය මණ්ඩලය පත් කරන ලද්දේ එම කටයුතු පූර්ණ කාලීන පදනමින් සිදු කිරීම සඳහාය. මෙම පහසුකම් යටතේ පහත ප්‍රධාන කොටස් ආරම්භ කරන ලද අතර ප්‍රගතිය පහත පරිදි වේ:-

- සොරොව් ව්‍යුහයේ ඉදිකිරීම් 90% දක්වා නිම කර ඇති අතර ඉතිරිව ඇත්තේ සොරොව් කුළුණ සහ ඉහල කොටසේ හුවමාරු ඇළ පමණි.

- වේල්ල 02 හි ඉදිකිරීම් 10% දක්වා නිම කර ඇත. කැනීම් කටයුතු, ගල් විදීමේ කටයුතු සහ පිපිරුම් කටයුතු අවසන් කර ඇත.රැඳවුම් බිත්තියේ සමස්ත ඉදිකිරීම් වැඩ මුහුදු මට්ටමේ සිට මීටර් 172.6 දක්වා නිම කර ඇත.

- ප්‍රධාන වේල්ලේ ඉදිකිරීම් කටයුතු සලකා බැලීමේදී, දකුණු ඉවුර කැනීම, දකුණු ඉවුර පැත්තේ දියර බදාම කැවීමේ කටයුතු අවසන් කර ඇති අතර වම් ඉවුරේ කැනීම් කටයුතු සිදු කරමින් පවතී (ඛාදනයට ලක්වූ පාෂාණ (weathered rock) අපාරගම්‍ය ස්ථරයට ළඟා වන තෙක් පුපුරුවා හැර ඉවත් කළ යුතු නිසා)

- සියළුම දියගිලුම් ප්‍රදේශ (tank bed area) අත්පත් කරගෙන ඇති අතර සම්පූර්ණ වන්දි ගෙවීමෙන් පසු පවුල් 11 ක් දැනටමත් නැවත පදිංචි කර ඇත.

- කොලොන්න ජල සම්පාදන ව්‍යාපෘතිය සහ පවිත්‍රාගාරය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිම කරන ලද අතර දැනට වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් නිස්සාරණය සඳහා අවසර දී ඇත්තේ දිනකට ඝන මීටර් 2,000 ක් පමණි. කොලොන්න සහ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා දිනකට ජලය සැපයීම සඳහා මුළු අවශ්‍යතාවය දිනකට ඝන මීටර් 7,000 කි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමඟ ඇති අවබෝධතා ගිවිසුමට අනුව, යෝජිත ඇල්ලේවැව ජලාශය ඉදිකිරීමෙන් පසුව පමණක්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට සම්පූර්ණ ජල අවශ්‍යතාවය ලබා දීමට හැකියාව ලැබේ.

කෙසේ වෙතත්, 2022 මැද භාගයේදී ඇති වූ හදිසි ආර්ථික අර්බුදය හේතුවෙන්, මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණ සහ වේගවත් කිරීමේ කමිටුව (RAMP) විසින් තීරණය කරන ලද්දේ ප්‍රධාන වේල්ල සහ සොරොව්ව පමණක් ඉදි කිරීමට සහ නැවත දැනුම් දෙන තුරු ඉතිරි වැඩ අත්හිටුවීමට ය. එබැවින් 2023 දී ව්‍යාපෘතියේ වැඩ ආරක්ෂිතව නැවැත්වීමට ප්‍රධාන නේවාසික ඉංජිනේරු කාර්යාලය විසින් පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.

- 80% කට වඩා වැඩ නිම කර ඇති බැවින් සහ විඛාදනයට ලක්වීම වැලැක්වීම සඳහා සොරොව්ව සම්පූර්ණ කිරීම.
- අවට ගස් වැවීම වැළැක්වීම සඳහා සොරොව් ව්‍යුහය වටා නැවත පිරවීම අවශ්‍ය වේ.
- සොරොව්වේ දකුණු ඉවුර පැත්තේ හර අගල් පිරවීම.
- වම් ඉවුර පැත්තේ දියර බදාම කැවීමේ කටයුතු අවසන් කිරීමට අවශ්‍ය වේ.
- මහජනතාවට සහ සතුන්ට ඇති අනාරක්ෂිත තත්ත්වය මඟ හරවා ගැනීම සඳහා වේල්ල 02 හි නැවත පිරවීමේ කටයුතු සිදු කිරීම අවශ්‍ය වේ.

කෙසේ වෙතත් 2023 සඳහා ලබා දී ඇති රුපියල් මිලියන 100 සඳහා ඉදිකිරීම් කටයුතු සහ යටිතල පහසුකම් සහ වෙනත් ක්‍රියාකාරකම්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පමණක් යොදා ගනිමින් සිදු කර ගන්නා ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇත.

## d) ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සාධාරණීකරණය

කොලොන්න සහ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ප්‍රදේශය තුළ පුද්ගලයින් 40,000 කට (පවුල් 12,000 කට ආසන්න) පානීය ජල පහසුකම් සැපයීම සඳහා දිනකට ඝන මීටර් 7,000 ක ධාරිතාවක් සඳහා ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ජල බෙදා හැරීමේ පද්ධතිය, පවිත්‍රාගාරය සහ ජලය ලබා ගැනීම දැනටමත් ඉදිකර ඇත. නමුත් තවමත් දිනකට ජලය ඝන මීටර් 2,000ක් පමණක් නිස්සාරණය කරන අතර බොහෝ මිනිසුන් ආරක්ෂිත පානීය ජලය නොමැතිව පීඩා විඳිති.

මෙම ව්‍යාපෘතියේ දී ඇළ මාර්ග පද්ධතියක් ඉදි නොකරන අතර දැනට පවතින පනාමුරේ අමුණ යෝජනා ක්‍රමයට අවශ්‍ය පරිදි ජලය ගබඩා කර ගඟ පහළට (කඩිගම්ආර) මුදා හැරීම සිදු කෙරේ. එබැවින් ජලාශයේ ප්‍රධාන වැඩ (head works) පමණක් ඉදි කල යුතුව ඇත.

මේ වන විට ව්‍යාපෘතියෙන් 18% කට ආසන්න ප්‍රමාණයක් අවසන් කර ඇත්තේ රුපියල් මිලියන 220 ක් වැය කරමින් වන අතර මෙම අදියරේ දී එය නතර කිරීම කිසිවෙකුට ප්‍රයෝජනවත් නොවේ. එබැවින් ඉතා කුඩා ව්‍යාපෘතියක් වන මෙය රටේ ග්‍රාමීය ප්‍රදේශවල බොහෝ දෙනෙකුට ප්‍රතිලාභ ගෙන දෙන බැවින් ව්‍යාපෘතිය දිගටම කරගෙන ගොස් අවසන් කිරීම වඩාත් සුදුසුය.

### e) නිර්දේශ

මෙම ව්‍යාපෘතිය වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ පවතින ප්‍රමුඛතම ව්‍යාපෘතියක් ලෙස හඳුනාගත හැකි අතර, ජල හිඟය හේතුවෙන් දුෂ්කරතා රැසකට මුහුණ පා සිටින කොලොන්න සහ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පුද්ගලයන් 40,000 කට පානීය ජලය සපයමින් පනාමුර සහ හුලන්දඹය යෝජනා ක්‍රමයේ පූර්ණ ප්‍රතිලාභය ලබා ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කර ඇත.

## III. පහළ මල්වතුඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

### a) හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම ගංගා ද්‍රෝණිය වන මල්වතුඔය, පහළ ප්‍රදේශයේ දී අරුවිආරු ලෙස හැඳින්වෙන අතර පැරණි අගනුවර වන අනුරාධපුර නගරය හරහා ගලා බසියි. යෝධ වැව සහ අකතිමුරුප්පු වැව සතුව අක්කර 24,450 (හෙක්ටයාර 9,895) සහ අක්කර 6,230 (හෙක්ටයාර 2,521) ක වාරි ප්‍රදේශ ඇති අතර පිළිවෙලින් 1.08 සහ 1.00 ක වගා තීව්‍රතාවයකින් ක්‍රියාත්මක වේ.

මන්නාරම දිස්ත්‍රික්කය ගංවතුර හා නියඟය යන දෙකටම බෙහෙවින් ගොදුරු වන අතර එම නිසා ප්‍රජාවට දේපළ හානි, කෘෂිකාර්මික හානි, පශු සම්පත් අලාභ හා පානීය හා ගෘහාශ්‍රිත ජල අවශ්‍යතා සපුරාලීම සඳහා ආරක්ෂිත සහ විශ්වාසදායක ජල මූලාශ්‍ර නොමැතිකම වැනි දැඩි දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුවේ. යෝජිත ජලාශය ස්ථාපිත කිරීමෙන් මල්වතු ඔයේ ඉහළ ප්‍රදේශවල ගබඩා ධාරිතාව ඉහළ නැංවිය හැකි අතර එමඟින් ගංවතුරේ තීව්‍රතාවය විශාල ප්‍රමාණයකට අඩු කළ හැකිය. එසේම, නියඟ කාලවලදී වාරිමාර්ග කටයුතු සඳහා මෙන්ම පානීය හා ගෘහස්ත භාවිතය සඳහාද ජලාශයෙන් විධිමත් ජල සැපයුමක් ලබා දිය හැකිය.

මෙම ජලාශය පිහිටුවීමෙන් මන්නාරම දිස්ත්‍රික්කයේ යෝධ වැව සහ අකතිමුරුප්පු වැව යටතේ කුඹුරු අක්කර 30,680 ක වගා තීව්‍රතාවය 2.0 දක්වා ඉහළ යනු ඇත. මෙම ව්‍යාපෘතියේ තවත් ප්‍රධාන වාසියක් වන්නේ අනුරාධපුර, වවුනියාව සහ මන්නාරම දිස්ත්‍රික්කයන්හි (පවුල් 100,000) ගෘහස්ථ ජල ඉල්ලුම සපුරාලීම සඳහා මි.කි.මී. 21 ක ජලය සැපයීම සහ මෙගාවොට් 1ක බලාගාරයක් හරහා වාර්ෂිකව ගිගාවොට් පැය 4.68ක ජල විදුලිය උත්පාදනය කිරීමයි. එසේම, මෙම ව්‍යාපෘතිය යටතේ නව නගර සංවර්ධන සැලසුම්, සංචාරක ව්‍යාපාරය සහ විසිතුරු මත්ස්‍ය වගාව ඇති කිරීමට යෝජිතය.

### b) වත්මන් තත්ත්වය

යෝජිත පස් වේල්ලේ දිග කිලෝමීටර් 3.65 ක් වන අතර හර අගල දිගින් 85% ක් දක්වා කැණීම් කර ඇත. දැනට පවතින බිම් මට්ටම දක්වා කැණීම් කරන ලද හර අගලෙන් 60% ක භූ විද්‍යාත්මක ප්‍රතිකාර (කොන්ක්‍රීට් ඇඹරීම) සහ මැටි ද්‍රව්‍ය පිරවීම සිදු කර ඇත. පිටාර අත්තිවාරම කැණීම සිදුකර අවසන්ය. දකුණු ඉවුර සොරොව්වේ ඉදිකිරීම් කටයුතුවලින් ආසන්න වශයෙන් 90% ක් පමණ අවසන් ය. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රඹෑව යාන්ත්‍රික වැඩමුළුව මඟින් දොරටු නිෂ්පාදනය කෙරේ. නැවත පදිංචි කිරීමේ භූමියේ ඉඩම් සමතලා කිරීම සහ මාර්ග පද්ධතියෙන් 80% ක් අවසන් කර ඇත. දිය ගිලුම් ප්‍රදේශයේ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සිදු වෙමින් පවතී. 38(අ) වගන්තිය මගින් කැබලි අංක 3484ක් සඳහා ගැසට් කර ඇති අතර ඉන් කැබලි අංක 1705ක් සන්තකයේ තබාගෙන ඇත.

RAMP කමිටුව මෙම අදියරේදී ඉදිකිරීම් නතර කර ව්‍යාපෘතිය දිගටම කරගෙන යාමට GCF හෝ කිසියම් අරමුදල් පහසුකමක් සොයා ගැනීමට තීරණය කර ඇත. GCF අරමුදල් ලබා ගැනීම සඳහා UNDP සමඟ මූලික පියවර ගනිමින් සිටී.

2023 අයවැය යටතේ රුපියල් මිලියන 550ක් වෙන් කරන ලදී. අවදානම් මඟහරවා ගැනීම සඳහා දැනටමත් කැණීම් කර ඇති හර අගල පිරවීම අවසන් කිරීමට සැලසුම් කර ඇත.

## c) සාධාරණීකරණය

වැඩ නතර කළහොත් හෝ කල් දැමුවහොත්, පහත සඳහන් අහිතකර බලපෑම් ඇති වේ.

### ප්‍රධාන කාර්යයන් (Head works):

- අධික බෑවුම් සහිත කැණීම් කරන ලද හර අගල් වැසි සමයේදී කඩා වැටිය හැක. තවද, බැම්ම පිරවීම අඛණ්ඩව සිදු නොවී අතරමග නතර කළ විට, මැටි ද්‍රව්‍ය නිරාවරණය වන අතර තාපය නිසා මැටි හරය ඉරිතලා යයි. දිගු කලකට පසු බැම්ම පිරී ගිය පසු මෙමගින් පිටාර ගැලීම් ඇති වන අතර වේල්ල අවදානමට ලක් වේ.
- කැණීම් කරන ලද ප්‍රධාන අගලට වන සතුන් වැටිය හැක.

### නැවත පදිංචි කිරීමේ ප්‍රදේශ:

- ඉඩම් බොහොමයක් අත්පත් කර ගත්තද මුදල් නොමැතිකම හේතුවෙන් වන්දි මුදල් ජනතාවට ලබා දිය නොහැක.

- ජලයෙන් යටවීමට නියමිත දැනටමත් අත්පත් කරගෙන ඇති ප්‍රදේශයක ජීවත් වන ජනතාවට දැනට පවතින ඉඩමේ කිසිදු සංවර්ධනයක් කළ නොහැක. ඊට සමගාමීව නැවත පදිංචි කිරීමේ ප්‍රදේශයද ඔවුන්ට භාවිත කළ නොහැක.

### ආදර්ශ ගොවිපල

- ශාක විනාශ වනු ඇත.

මන්නාරම දිස්ත්‍රික්කයේ පවතින වාරිමාර්ග යෝජනා ක්‍රමවල වගා තීව්‍රතාවය ඉහළ යාමත් සමඟ ගංවතුර සහ නියඟ තත්ත්වයන් දෙකම අවම කිරීම සඳහා මෙම යෝජිත ජලාශය අතිශයින් වැදගත් වේ.

## d) නිර්දේශ

මෙය වාරිමාර්ග අමාත්‍යාංශයේ ප්‍රමුඛතම ව්‍යාපෘතියකි.

මෙමගින් කුඹුරු අක්කර 30,680 ක පමණ ජල හිඟයට විසඳුම් ලැබෙන අතර, කාලගුණික විපර්යාස හේතුවෙන් අවදානමට ලක්විය හැකි මන්නාරම, වවුනියාව සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ලක්ෂයකට පමණ පිරිසකට සුරක්ෂිත පානීය ජලය මෙමගින් ලැබෙන බැවින් ව්‍යාපෘතිය දිගටම කරගෙන යාමට නිර්දේශ කෙරේ.

ඇමුණුම - 5

## RAMP මගින් 2022 වසර තුළ සම්පූර්ණ කිරීමට නිර්දේශිත ව්‍යාපෘති ලැයිස්තුව

| ව්‍යාපෘතියේ නම | වැය ශීර්ෂය |
|---|---|
| 1. මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය - චීනය, කුවේට් සහ සෞදි) | 198-2-3-30 |
| 2. භූගත ජලය නිරීක්ෂණය කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම<br>පොළොන්නරුව, මන්නාරම, වවුනියාව, මොනරාගල, අම්පාර, හම්බන්තොට, අනුරාධපුර සහ මඩකලපුව දිස්ත්‍රික්ක (නෙදර්ලන්තය) | 198-2-3-23 |
| 3. ගිං- නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය | 198-2-3-18 |
| 4. මොනරාගල කඩිනම් වාරි සංවර්ධන ව්‍යාපෘතිය දිස්ත්‍රික්කය (වෙල්ලස්ස නවෝදය) | 282-2-3-22 |
| 5. පහළ ඌව ව්‍යාපෘතිය | 282-2-3-07 |
| 6. වැලිඔය ඒකාබද්ධ ව්‍යාපෘතිය | 198-2-3-35 |
| 7. රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය | නිම කරන ලදී |
| 8. රඹකැන්ඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය | 198-2-3-40 |
| 9. උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය | 198-2-3-32 |
| 10. “වාරි සෞභාග්‍ය වැඩසටහන” යටතේ ක්‍රියාත්මක කරන ව්‍යාපෘති | 198-2-3-52 |
| 11. පහළ මල්වතු ඔය බහු අංශ සංවර්ධන ව්‍යාපෘතිය | 198-2-3-13 |
| 12. දෙමටගල්ල වැව ප්‍රතිසංස්කරණය කිරීම | 282-2-3-31 |
| 13. කුඹුක්කන් ඔය ජලාශය | 282-2-3-17 |